කාර්ය සාධන වාර්තාව 2017



# මෛත්‍රී පාලනයක් ....................

# ස්ථාවර රටක්.

ජනාධිපති කාර්යාලය, කොළඹ 01

2 - CM 26894 - 75 (2018/03) - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව



## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

ජනතාවගේ විශේෂ අවධානයට ලක්වන රාජ්‍ය ආයතන අතර ජනාධිපති කාර්යාලය සුවිශේෂ වූවකි. රටේ සංවර්ධන වැඩපිළිවෙළට උරදීම සියලු රාජ්‍ය සේවකයින්ගේ වගකීම වන අතර, එම සංවර්ධන වැඩපිළිවෙළ මෙහෙයවීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ජනාධිපති කාර්යාලයයි. ඒ සඳහා ඵලදායීතාවයෙන් සහ කාර්යක්ෂමතාවයෙන් ඉහළ ආයතනයක් බවට ජනාධිපති කාර්යාලය පත්වනු දැක්ම ජනතා අපේක්ෂාවයි.

වංචා, දූෂණ, අක්‍රමිකතා සිදු නොවන පරිදි විනිවිදභාවයෙන් හා විධිමත්ව රාජකාරී කටයුතු සිදු කරමින්, අනාගත පරපුර වෙනුවෙන් වඩා යහපත් දේශයක් නිර්මාණය කිරීම අප වෙත පැවරී ඇති ප්‍රධානතම වගකීමකි.

වසර 150 කටත් වැඩි කීර්තිමත් රාජ්‍ය සේවා ජාලයක් සහිත ඉහළ සාක්ෂරතාවයක් හා තොරතුරු තාක්ෂණ දැනුමක් ඇති රටක් වන ශ්‍රී ලංකාව ඵලදායීතාවය වැනි දියුණු සංකල්ප සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් පහසුවෙන් ගොඩනැගිය හැකිය. ඒ සඳහා අවශ්‍ය වන්නේ ඵලදායීතා සංකල්පය නිසියාකාරව ක්‍රියාවට නැංවීම පමණි. මෙම කාර්යය ඉටුකරලීම උදෙසා සියලුම අංශ ඉහළම ප්‍රමිතියකින් යුක්තවීම අවශ්‍ය වේ.

මාගේ සෘජු මැදිහත්වීම සහ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති පහක් ඉතා සාර්ථකව ජනතාව අතරට ගෙන ගොස් ජනතා සුබසාධනය සැලසීමට ලැබීම අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ගොඩනැංවීම ඉලක්ක කර ගත් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයද සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සියලු ව්‍යාපෘති තුළින් අප අපේක්ෂා කරනුයේ, පුරවැසි යහපත සැලසීමයි.

අතීත සමෘද්ධිමත්භාවය නැවත අප රට වෙත උදා කිරීම පහසු නොවන මුත් ඒ සඳහා උද්‍යෝගයෙන් හා කැපවීමෙන් යුතුව නිවැරදි මග එළඹිය යුතුව ඇත. ලක්ෂ දාහතරක් පමණ වන සමස්ත රාජ්‍ය සේවයට ආදර්ශයක් වෙමින් නව මුහුණුවරකින් සහ නව වැඩපිළිවෙළක් ඔස්සේ කාර්යක්ෂමව සහ සැලසුම්සහගතව ජනාධිපති කාර්යාලයේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන අතර, පසුගිය වසර තුළ දැක්වූ සාමූහික ප්‍රයත්නය තුළින් ලද ජයග්‍රහණ අතිශය අගය කරමි.

**අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන**
**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**



## ජනාධිපති ලේකම්තුමාගේ පණිවුඩය

ජනතාවගේ කුදු මහත් අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති ප්‍රධානම ආයතනය ලෙස ජනාධිපති කාර්යාලයට විශේෂ කාර්යභාරයක් පැවරී ඇත. ජනාධිපතිවරයාට සෘජුවම වගවීම සේම ජනාධිපතිවරයාගේ දැක්ම රටට ජනතාවට ලබා දීම අප වෙත පැවරෙන ප්‍රධාන කාර්යභාරයන්ය.

සංහිඳියාව, තිරසර ආර්ථික සංවර්ධනය, තිරසර සාමය, ජාත්‍යන්තර සාමය පවත්වාගෙන යාම සහ ආපදා සහන සේවා යනාදී නව ක්ෂේත්‍ර ඔස්සේ රටේ සංවර්ධනයට දායකවීමට ඔබට ඇති වගකීම ගැඹුරින් හඳුනාගත යුතුය. පසුගිය කාලවකවානුව තුළ ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයද වර්ධනය වී ඇත.

ජනාධිපතිතුමාගේ පූර්ණ අධීක්ෂණය සහ මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන, මත්ද්‍රව්‍ය නිවාරණ, දරුවන් සුරකිමු, වකුගඩු රෝග නිවාරණ සහ පරිසර සංරක්ෂණ යන විශේෂ ව්‍යාපෘති තුළින් ජනතා සුබසාධනය සැලසීමට කරන ලද කැපකිරීම සහ ළඟා කරගත් සාර්ථකත්වය පිළිබඳව සියලු දෙනාට ස්තූතිවන්ත වෙමි.

අනාගත පරපුර වෙනුවෙන් යහපත් දේශයක් නිර්මාණය කිරීම අප හමුවේ ඇති ප්‍රබල අභියෝගයක් වන අතර, ඒ සඳහා රාජ්‍ය සේවයද වර්තමානයට හා අනාගතයට යෝග්‍ය ලෙස නැවත සකස් කල යුතුය. ඒ උතුම් කාර්යය සාර්ථක කරගනු වස් පෙරමුණ ගන්නා ලෙස ඉල්ලා සිටින අතර, අවැසි අවස්ථාවන්හි ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරන අතරම එම කර්තව්‍යය ප්‍රශංසනීය ආකාරයෙන් සිදුවීමට ශක්තිය ධෛර්යය ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමි.

**ඔස්ටින් ප්‍රනාන්දු**
**ජනාධිපති ලේකම්**

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ලේකම් කාර්යාංශය | 05 |
| 02. | පෞද්ගලික ලේකම් අංශය | 17 |
| 03. | කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය | 20 |
| 04. | අභ්‍යන්තර පාලන අංශය | 25 |
| 05. | මානව සම්පත් සංවර්ධන අංශය | 45 |
| 06. | ආයතන සම්බන්ධීකරණ අංශය | 49 |
| 07. | මුල්‍ය කළමනාකරණ අංශය | 54 |
| 08. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය | 56 |
| 09. | ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය | 60 |
| 10. | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය | 81 |
| 11. | ජනාධිපති අරමුදල | 180 |
| 12. | මහජන සම්බන්ධතා අංශය | 185 |
| 13. | නීති අංශය | 189 |
| 14. | අභ්‍යන්තර විගණන අංශය | 193 |
| 15. | මාධ්‍ය අංශය | 194 |
| 16. | ප්‍රතිසන්ධාන අංශය | 198 |

# හැඳින්වීම

නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් බිම ලෙස සැලකෙන ග්‍රීසියේ ඇතැන්ස් නුවර පිහිටි ඇතීනා දෙවඟන වෙනුවෙන් ඉදිකළ පාතීනන් දෙව්මැදුරේ ගෘහ නිර්මාණ ආකෘතියෙන් ඉදි වූ පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ජනාධිපති කාර්යාලය, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉතිහාසයේ හැරවුම් ගණනාවක කේන්ද්‍රය වූ මන්දිරයකි.

වර්තමානයේ රටේ රාජ්‍ය නායකයාගේ සියලු වගකීම් සහ කාර්යභාරයන් මෙහෙයවන, සම්බන්ධීකරණය සහ කළමනාකරණය කරන රාජ්‍ය ආයතනය වන්නේ ජනාධිපති කාර්යාලයයි. රටේ සියලු රාජ්‍ය ආයතන මෙන්ම ජනාධිපති කාර්යාලයද පොදු ජන අවශ්‍යතා ඉටු කිරීමට බැඳී සිටිනවා මෙන්ම සියලු වගකීම් හා කාර්යභාරයන් පිළිබඳ පොදු ජනයාට වගවීමට ද බැඳී සිටියි.

යහපාලනය  ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යුහය තුළ ස්ථාපනය කිරීම වෙනුවෙන් පත්කෙරුණු වර්තමාන ජනාධිපතිවරයා යටතේ එම වගකීම වඩා බැරෑරුම්වනවා සේම රාජ්‍ය තොරතුරු පොදු ජන අයිතියක් බවට පත් වත්මන තුළ, ජනාධිපති කාර්යාලය ඉටු කරන කටයුතු ද විවෘත තොරතුරු බවට පත්ව තිබේ.

ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දැක්ම මත පදනම්ව ශ්‍රී ලංකාවේ සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු හා රාජ්‍ය සේවයේ ප්‍රධානියා ලෙස නිල බලයෙන් පත්වන ජනාධිපති ලේකම්වරයා යටතේ ජනාධිපති කාර්යාලය විසින් පසුගිය වසර පුරා ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළ පිළිබඳ කාර්යය  සාධන වාර්තාව කෙරෙන් පැවසෙනුයේ ජනාධිපති කාර්යාලය රටේ සංවර්ධනය උදෙසා සිදුකළ දැවැන්ත ක්‍රියාවලියක විමර්ශනාත්මක සංක්ෂිප්තයකි.

ජාතික සංවර්ධනය උදෙසා එම වැඩපිළිවෙළේ සක්‍රීය දායකත්වය මෙන්ම එහි ඵලදායිතාවයේ අගය නිරීක්ෂණය ද එමඟින් පිළිබිඹු වේ. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙසින් ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනයේ අපේක්ෂා සහගත ගමනකට ප්‍රවේශ වී ඇති අද දවසේ අප ජය ගෙන ඇති අභියෝග මෙන්ම අප ජය ගත යුතු ඉලක්කයන් ද ඒ සඳහා වන උපායමාර්ගයන් ද හඳුනා ගැනීම සඳහා මෙය මහඟු පිටිවහලකි.

## දැක්ම

යහපාලනයෙන් හෙබි තිරසර සෞභාග්‍යමත්
ශ්‍රී ලංකාවක්

## මෙහෙවර

අතිගරු ජනාධිපතිතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පැවරෙන ව්‍යවස්ථාපිත රාජකාරී ඉටු කිරීමට හා ජනාධිපතිතුමන්ගේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සපයන අතරම ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණය තුල යහපාලනය ස්ථාපිත කිරීමටත්, තිරසර සංවර්ධනය තුලින් සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට පෙරමුණ ගැනීම.

**ජනාධිපති කාර්යාලය පහත දැක්වෙන අංශ වලින් සමන්විත වේ.**

- *ලේකම් කාර්යාංශය*
- *පෞද්ගලික ලේකම් අංශය*
- *කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය*
- *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය*
- *අභ්‍යන්තර පාලන අංශය*
- *මානව සම්පත් සංවර්ධන අංශය*
- *ප්‍රතිපත්ති සම්බන්ධිකරණ හා ප්‍රගති සමාලෝචන අංශය*
- *මූල්‍ය කළමනාකරණ අංශය*
- *අභ්‍යන්තර විගණන අංශය*
- *ජනාධිපති අරමුදල් අංශය*
- *සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය*
- *මහජන සම්බන්ධතා අංශය*
- *මාධ්‍ය අංශය*
- *ප්‍රතිසන්ධාන කාර්යාලය*
- *නීති අංශය*

# ලේකම් කාර්යාංශය

## හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ජනාධිපති ලේකම්තුමා විසින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් පහසු කරලීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශය මගින් සිදුවේ. ඒ අනුව, අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

## ප්‍රධාන කාර්යයන් / අරමුණු

- විදේශීය රාජ්‍ය නායකයන් පැමිණෙන අවස්ථාවලදී අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි උත්සව සංවිධානය හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.
- ලේකම් කාර්යාංශය විසින් කැඳවන රැස්වීම්, උත්සව හා සාකච්ඡා සඳහා ආරාධනා පත්‍ර සැකසීම, එම අවස්ථාවන් සංවිධානය කිරීම, සාකච්ඡා සටහන් තැබීම, සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණ කටයුතු.
- රජයේ සංහිඳියා වැඩසටහන යටතේ සංක්‍රාන්ති යුක්තිය ඉටු කිරීම සඳහා වන කමිටුවේ කටයුතු කිරීම.
- මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන 2016 – 2021 ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පත් කර ඇති නිලධාරී කමිටුවේ ජනාධිපති කාර්යාලයේ නියෝජිත ලෙස කටයුතු කිරීම.
- ජාතික තිරසර සංවර්ධන දැක්ම - 2030 පිළියෙළ කිරීමේ කාර්යය අදාළ විශේෂඥ කමිටුව සමග සමායෝජනය කිරීම.
- නෙළුම් කුළුණ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා හා සම්මුතියට එළඹීමේ කමිටුවේ සහ ව්‍යාපෘති කමිටුවේ ලේකම් ලෙස කටයුතු කිරීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීම් සම්බන්ධීකරණය.
- අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි චක්‍රලේඛ නිකුත් කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පත්වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා වෙත වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු පුද්ගලයන්ගෙන් එම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනාධිපති පරිසර නියමු රන් පදක්කම්ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩල සභාපති ධුර කටයුතු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් වන විවිධ පැමිණිලි/ඉල්ලීම් ආදී විවිධ කටයුතු සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ /ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීම.
- ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති ආයතනවල නිලධාරීන්ට අදාළව සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.

- ජනාධිපති කාර්යාලයේ සියලුම චක්‍රලේඛ/අභ්‍යන්තර ලිපි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ / මුදල් චක්‍රලේඛ හා වෙනත් වැදගත් සුවිශේෂී චක්‍රලේඛ / ලිපි සම්බන්ධ ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ජනාධිපති කාර්යාලයේ විශේෂ අවස්ථාවලදී ආරාධිතයින් පිළිගැනීමේ හා ආසන පැනවීමේ කටයුතු වෙනුවෙන් පත් කර ඇති කණ්ඩායම (Ushering Team) සම්බන්ධීකරණය, පුහුණු කිරීම හා අධීක්ෂණය.

## 03 2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්



- **ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ ප්‍රධාන අමාත්‍ය ගරු චන්ද්‍රබාබු නයිදු මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**

2017 ජනවාරි මස 07 වන දින සිට 08 වන දින දක්වා ශ්‍රී ලංකාවේ දෙදින නිල සංචාරයක යෙදුනු ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ ප්‍රධාන අමාත්‍ය, ගරු චන්ද්‍රබාබු නයිදු මැතිතුමා වෙනුවෙන් ජනවාරි මස 07 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයෙහි සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු විය.

- **69 වන ජාතික නිදහස් සැමරුම් උත්සවය**

69 වන ජාතික නිදහස් සැමරුම නිමිත්තෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.02.04 වන දින ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයෙහි සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දුනීසියානු නිල සංචාරය**

අතිගරු ජනාධිපතිතුමා විසින් 2017 මාර්තු මස 06 වන දින සිට මාර්තු මස 08 වන දින දක්වා සිදු කරන ලද ඉන්දුනීසියානු නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කිරීම.



➢ **අතිගරු ජනාධිපතිතුමාගේ රුසියානු නිල සංචාරය**



2017 මාර්තු මස 22 වන දින සිට 25 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද රුසියානු නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මගින් සිදු විය.

➢ **ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**



2017 මැයි මස 11 වන දින සිට 12 වන දින දක්වා ශ්‍රී ලංකාවේ දෙදින නිල සංචාරයක යෙදුනු ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා වෙනුවෙන් මැයි මස 11 වන දින කොටුව ජනාධිපති මන්දිරයේ පැවති රාත්‍රී භෝජන සංග්‍රහය හා මැයි මස 12 වන දින මහනුවර, ජනාධිපති මන්දිරයේ පැවැත්වූ දිවා භෝජන සංග්‍රහය වෙනුවෙන් ආරාධනා පත්‍ර සැකසීම, ආරාධිතයන්ගේ සහභාගීත්වය තහවුරු කර ගැනීම ඇතුළු සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු කරන ලදී.

➢ **අතිගරු ජනාධිපතිතුමාගේ ඕස්ට්‍රේලියානු නිල සංචාරය**



2017 මැයි මස 23 වන දින සිට 26 වන දින දක්වා ඕස්ට්‍රේලියාවේ සිව් දින නිල සංචාරයක නිරත වූ අතිගරු ජනාධිපතිතුමන්ගේ එම නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මගින් සිදු විය.

- **අතිගරු ජනාධිපතිතුමාගේ බංගලාදේශ නිල සංචාරය**



අතිගරු ජනාධිපතිතුමන් විසින් 2017 ජූලි මස 13 වන දින සිට 15 වන දින දක්වා සිදු කරන ලද බංගලාදේශ නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමන් එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි 72 වන සැසි වාරයට සහභාගි වීම**



2017 සැප්තැම්බර් මස 17 වන දින සිට 25 වන දින දක්වා නිව්යෝර්ක් නුවර පැවති 72 වන එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සහභාගී වූ අතිගරු ජනාධිපතිතුමන්ගේ එම නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

**සාක් රටවල ගරු කථානායකවරුන් හා ගරු පාර්ලිමේන්තු සභිකයින්ගේ සංගමයෙහි 8 වන සමුළුව සඳහා සහභාගී වූ දූත පිරිස වෙනුවෙන් පැවැත් වූ විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය**

සාර්ක් රටවල ගරු කථානායකවරුන් හා ගරු පාර්ලිමේන්තු සභිකයින්ගේ සංගමයෙහි 08 වන සමුළුව සඳහා සහභාගී වූ දූත පිරිස වෙනුවෙන් 2017 ඔක්තෝබර් මස 03 වන දින කොටුව ජනාධිපති මන්දිරයේ පැවති රාත්‍රී භෝජන සංග්‍රහයෙහි සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් මෙම අංශයේ දායකත්වය ලබා දෙන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමාගේ කටාර් රාජ්‍ය නිල සංචාරය**



2017 ඔක්තෝබර් මස 25 වන දින සිට 26 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් විසින් කටාර් රාජ්‍යයේ සිදු කරන ලද දෙදින නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමාගේ කොරියානු නිල සංචාරය**



2017 නොවැම්බර් මස 27 වන දින සිට 30 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද සිව් දින කොරියානු නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

- **මැලේසියානු අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**



2017 දෙසැම්බර් මස 17 වන දින සිට 19 වන දින දක්වා ශ්‍රී ලංකාවේ තෙදින නිල සංචාරයක යෙදුනු මැලේසියානු අග්‍රාමාත්‍ය, ගරු දාටෝ ශ්‍රී මොහොමඩ් නජීබ් තුන් අබ්දුල් රසාක් මැතිතුමා දෙසැම්බර් 18 වන දින ජනාධිපති කාර්යාලයට පැමිණීම නිමිත්තෙන් පැවැත් වූ නිල පිළිගැනීමේ උත්සවය, ද්විපාර්ශවික සාකච්ඡාව හා ගිවිසුම් අත්සන් කිරීම යන අංගයන් සම්බන්ධීකරණය කිරීම සිදු වූ අතර, එතුමා වෙනුවෙන් එදින ජනාධිපති මන්දිරයේ පැවැත්වූ දිවා භෝජන සංග්‍රහයෙහි සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු කරන ලදී.

## ➢ නත්තල් දිනය වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය



2017 වර්ෂයේ නත්තල් උත්සවය නිමිත්තෙන් දෙසැම්බර් මස 19 වන දින කොටුව ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයෙහි සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු සඳහා ලේකම් කාර්යාංශයේ දායකත්වය ලබා දෙන ලදී.

## ➢ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡා

- **අමාත්‍යාංශ ලේකම්වරුන් සමග පැවති සාකච්ඡාව**

  අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.07.19 වන දින පවත්වන ලද අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීමේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- **අතුරුදහන් වූ පවුල්වල සාමාජිකයන් සමග පැවති සාකච්ඡා**

  2017 සැප්තැම්බර් මස 06 වන දින හා නොවැම්බර් මස 16 වන දිනයන්හි අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන් සමඟ පැවති සාකච්ඡාවන්හි සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී.



වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ව හා ශාක විශේෂ ජාත්‍යන්තර ලෙස වෙළඳාම් කිරීම සම්බන්ධ සම්මුතියේ (CITES) පාර්ශවකරුවන්ගේ 18 වන සැසිය 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද ඉහළ

පෙලේ මෙහෙයුම් කමිටුවෙහි 2017 අගෝස්තු 30 වන දින පවත් වන ලද රැස්වීමෙහි සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී.

- කටාර් රාජ්‍යයේ ගරු ආර්ථික හා වාණිජ කටයුතු අමාත්‍යතුමන් සමඟ 2017 ඔක්තෝබර් මස 29 වන දින පැවති සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු විය.

## ➢ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වෙනත් උත්සව හා වැඩසටහන්

- එක්සත් ජාතීන්ගේ 2030 තිරසර සංවර්ධන දැක්ම සංකල්පය මූලික කරගනිමින් ශ්‍රී ලංකාවේ ඉදිරි වසර 03 තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත තිරසර සංවර්ධන යෝජනාවලිය ඇතුළත් "තිරසර යුගයක්" සංවර්ධන දැක්ම ප්‍රකාශයට පත්කිරීමේ උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 02 වන දින ජනාධිපති කාර්යාලයේදී පැවැත් වූ අතර, එම උත්සවයෙහි සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු මෙම අංශය මගින් සිදු විය.

- **"තිරසර යුගයක - තෙවසරක ඇරඹුම" ජාතික සභාව**

  අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.01.08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති "තිරසර යුගයක - තෙවසරක ඇරඹුම" ජාතික සභාවෙහි සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සඳහා මෙම අංශයේ දායකත්වය ලබා දෙන ලදී.

- **ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික වැඩසටහන**



2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ක්‍රීඩා අමාත්‍යාංශය මගින් වාර්ෂිකව පවත්වන ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික වැඩසටහනේ අන්තර් අමාත්‍යාංශ මෙහෙයුම් කමිටුව සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මගින් සිදුවිය. ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2016දෙසැම්බර් මස 15 වන දින හා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 10 වන දින රැස්වූ එම කමිටුවල සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු සිදු කරන ලද අතර, එහි සමාරම්භක උත්සවය 2017.02.06 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



3 - CM 26894

- **ජාතික සම්මාන උළෙල**



2017 මාර්තු මස 20 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවති ජාතික සම්මාන පිරිනැමීමේ උත්සවය වෙනුවෙන් ආරාධනා පත්‍ර සැකසීම, අදාළ සම්මානලාභීන් හා ආරාධිතයින් වෙනුවෙන් ආරාධනා පත්‍ර යොමු කිරීම හා ආරාධිතයින්ගේ සහභාගීත්වය තහවුරු කර ගැනීම ඇතුළුව උත්සවයේ සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී.

## ➢ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වැඩසටහන් හා සාකච්ඡා

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරීන් වෙනුවෙන් පෞද්ගලික අංශය සම්බන්ධ කරගනිමින් පුහුණු වැඩසටහන් දියත් කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් සමග 2017 සැප්තැම්බර් මස 14 වන දින පැවති සාකච්ඡාවේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශයේ සහභාගීත්වය මත සිදු කෙරිණි.

- ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2017.02.17, 2017.07.13, 2017.08.31 හා 2017.09.29 යන දිනයන්හි පවත්වන ලද අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීම්වල සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු මෙම අංශය මගින් සිදු කරන ලදී.

- **මානව හිමිකම් සම්බන්ධ විශේෂ රපෝර්තුකරුවන් හා නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරයන්**

1. ත්‍රස්තවාදය පිටුදකිමින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ විශේෂ රපෝර්තුකරු බෙන් එමර්සන් මහතා 2017.07.12 වන දින ජනාධිපති ලේකම්තුමා සමග පැවති සාකච්ඡාව සම්බන්ධීකරණය කිරීම සිදු විය.
2. සත්‍යය, සාධාරණය, හානි පූර්ණය හා පුනරාවර්තනය වැළැක්වීමෙහි වගකීම් පිළිබඳ විශේෂ රපෝර්තුකරු පාබ්ලෝ ඩි ග්‍රීෆ් මහතා විසින් සිය ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ අවසන් අදහස් දැක්වීම 2017.10.22 වන දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේදී පැවැත්විණි. එම අවස්ථාවට ජනාධිපති ලේකම්තුමා සහභාගී වූ අතර, එහි සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශය මගින් සිදු විය.

3. ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය හා වගවීමේ යාන්ත්‍රණය පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි විශේෂ නියෝජිත ආචාර්ය මොටෝ නොගුචි මහතා 2017 ඔක්තෝබර් මස 30 වන දින ජනාධිපති ලේකම්තුමා සමග පැවති සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු කරන ලදී.

## ➢ වෙනත් උත්සව, රැස්වීම්, වැඩසටහන් හා සාකච්ඡා

- ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය සඳහා වන උපදේශන කාර්ය බලකායේ වාර්තාව 2017 ජනවාරි මස 03 වන දින හිටපු ජනාධිපතිනි, අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වෙත පිළිගැන්වීම සිදු කරන ලද අතර, එම උත්සවයේ සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මගින් සිදු විය.
- ජාතික තිරසර සංවර්ධන දැක්ම - 2030 පිළියෙළ කිරීම සඳහා 2017 ජනවාරි මස 25 වන දින පත් කරන ලද ජනාධිපති විශේෂඥ කමිටුවෙහි රැස්වීම්, වැඩමුළු සංවිධානය කිරීම හා ඒවා සම්බන්ධීකරණය කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී.
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ නිර්දේශයන් සම්බන්ධීකරණයට සහායවීම සඳහා වූ නිලධාරී කමිටුවේ ජනාධිපති කාර්යාලයීය නියෝජිත ලෙස 2017.07.06 හා 2017.12.14 යන දිනයන්හිදී පැවති රැස්වීම් සඳහා සහභාගි වීම.
- විශ්ව කාලාන්තර සමාලෝචනය යටතේ ශ්‍රී ලංකා ජාතික වාර්තාවෙහි තෙවන සමාලෝචනය පිළිබඳව 2017 නොවැම්බර් මස 15 වන දින ජිනීවාහිදී පැවැත්වුණු සාකච්ඡාවට අදාළව නොවැම්බර් 13 සිට 19 දක්වා කාලය තුළ එහි රැඳී සිටිමින් එම වාර්තාව සම්බන්ධ කටයුතු සිදු කිරීම සඳහා එකී දූත පිරිසෙහි සාමාජිකාවක් ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි ඉල්ලීම හා නිර්දේශය මත ලේකම් කාර්යාංශයේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සහභාගි වීම.
- 2017 දෙසැම්බර් මස 19 වන දින අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උතුරු නැගෙනහිර පළාත්වල අවතැන්ව සිටින පුද්ගලයින් නැවත පදිංචි කිරීම පිළිබඳ සාකච්ඡාව සඳහා සහභාගිත්වය ලබා දීම සිදු විය.
- අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018.01.08 වන දින පොල්ගොල්ල වේල්ල හා මොරගහකන්ද වේල්ල ආශ්‍රිතව පැවති "සාලිස් වසරක - මහවැලි අසිරිය"උත්සවයන්හි ආරාධනා පත්‍ර සැකසීම හා ආරාධනා පත්‍ර යොමු කිරීම ඇතුළු පූර්ව සූදානම් කටයුතු සිදු කිරීම ද 2017 දෙසැම්බර් මස අවසානයේදී මෙම අංශය මගින් සිදු කරන ලදී.

## ➢ සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

පහත සඳහන් නිලධාරින් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කෙරිණි.

- කේ එච් ආර් විලාසිනා මහත්මිය - නීති නිලධාරී, මානව හිමිකම් කොමිෂන් සභාව
- ඩබ්ලිව් ආර් ඒ විජයවික්‍රම මහත්මිය - ජනාධිපති සහකාර ලේකම්
- ඩබ්ලිව් ජී ඒ එන් සෝමරත්න මහත්මිය - ජනාධිපති සහකාර ලේකම්
- ජී බී එම් ලලිත් බණ්ඩාර මහතා - ජනාධිපති සහකාර ලේකම්
- අයි එච් බී ඒ දේශප්‍රිය මහතා - ජනාධිපති සහකාර ලේකම්
- ඕ කේ එස් ඒ ඕවිටිගල මහතා - ජනාධිපති සහකාර ලේකම්
- එම් ඩබ්ලිව් ජේ කුමාර මහතා - ජනාධිපති සහකාර ලේකම්
- යූ ඩී උදයකුමාර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා පදනම

## ➢ චක්‍රලේඛ නිකුත් කිරීම

පහත අංක දරන චක්‍රලේඛය නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කෙරිණි.

| අනු අංකය | චක්‍රලේඛයේ නම | චක්‍රලේඛ අංකය | දිනය |
|---|---|---|---|
| 01. | "ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය" - 2017 පෙබරවාරි 06 - 12) | SP/SB/01/17 | 2017.01.06 |

## ➢ අමාත්‍ය මණ්ඩල සංදේශ නිකුත් කිරීම

පහත අංක දරන අමාත්‍ය මණ්ඩල සංදේශය නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කෙරිණි.

| අනු අංකය | කාරණය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | දිනය |
|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අනුබද්ධිතව හෝ වෙනම පවතින නවීන පහසුකම්වලින් යුත් පුහුණු ආයතනයක් පිහිටුවීම | PS/CP/56/17 | 2017.12.05 |

## ➢ ජනාධිපති පරිසර නියමු රන් පදක්කම්ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩලවල කටයුතු

2017 වර්ෂයේදී පහත සඳහන් ස්ථානයන්හි පැවති පරිසර නියමු පදක්කම් පිරිනැමීම සඳහා වන සම්මුඛ පරීක්ෂණන්හි විනිශ්චය මණ්ඩල කටයුතුවල නිරත විය.

| දිනය | ස්ථානය |
|---|---|
| 2017 මාර්තු 28 හා 29 | මොණරාගල, දුටුගැමුණු ජාතික පාසල |
| 2017 මැයි 17 | බදුල්ල රිදීමාලියද්ද මධ්‍ය මහා විද්‍යාලය |
| 2017 මැයි 18 | බදුල්ල උඩවෙල මධ්‍ය මහා විද්‍යාලය |
| 2017 මැයි 22 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2017 ජූලි 19 සහ 20 | පො/දිඹු/අලවලකුඹුර මහා විද්‍යාලය |
| 2017 අගෝස්තු 15 | කු/උඩබද්දලව සුදර්ශන මහා විද්‍යාලය |
| 2017 අගෝස්තු 29 | කු/උඩබද්දලව සුදර්ශන මහා විද්‍යාලය |
| 2017 දෙසැම්බර් 20 සහ 21 | මධ්‍යම පළාත් කාර්යාලය, මධ්‍යම පරිසර අධිකාරිය, පොල්ගොල්ල |

### ➢ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය

නෙළුම් කුළුණ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා හා සම්මුතියට එළඹීමේ කමිටුවේ සහ ව්‍යාපෘති කමිටුවේ ලේකම් වශයෙන් 2017.01.30, 2017.02.23, 2017.04.21, 2017.08.03, 2017.09.26 හා 2017.10.16 යන දිනයන්හිදී රැස්වීම්වලට සහභාගී වීම.

### ➢ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම-සභාපතිවරුන් පත් කිරීම

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සම සභාපතිවරුන් 65 දෙනෙකුද, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් සම සභාපතිවරු 33 දෙනෙකුද පත් කිරීමට කටයුතු කර ඇත.

### ➢ වත්කම් හා බැරකම් ප්‍රකාශ සම්බන්ධ කටයුතු

ගරු අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, අතිගරු තානාපතිවරුන් හා ගරු විනිශ්චයකාරවරුන් ඇතුළුව අතිගරු ජනාධිපතිතුමා වෙත ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු පුද්ගලයන් වෙතින් ලද එකී ප්‍රකාශ 244 ක් වෙනුවෙන් ලද බවට ලිපි යොමු කිරීම 2017 වර්ෂයේදී මෙම කාර්යාංශය මගින් සිදු විය.

### ➢ සුළු ප්‍රසම්පාදන කමිටු සඳහා සහභාගීත්වය

2017 වර්ෂයේදී සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් 30 ක් සඳහා සහභාගීත්වය ලබාදීම සිදු කරන ලදී.

### ➢ චක්‍රලේඛ ගොනු යාවත්කාලීන කිරීම

ජනාධිපති කාර්යාලය සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ යාවත්කාලීන කිරීම මෙම අංශය මගින් සිදුවන අතර, 2017 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ 08 ක් හා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ 68 ක් ඇතුළත් ගොනු යාවත්කාලීන කරමින් පවත්වාගෙන යන ලදී.

### ➢ ආසන පැනවීමේ කණ්ඩායම පත් කිරීමේ සිට පුහුණු සම්බන්ධීකරණය ඇතුළු අධීක්ෂණ කටයුතු

2017 වර්ෂයේ පැවති පහත සඳහන් උත්සව අවස්ථාවන්හි ආසන පැනවීමේ කටයුතු සඳහා ඉහත සඳහන් 35 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් යොදවා ඇත. එහි සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු මෙම අංශය මගින් සිදුවී ඇත.

| අනු අංකය | උත්සවය | පැවැත් වූ දිනය |
|---|---|---|
| 01. | "තිරසර යුගයක - තෙවසරක ඇරඹුම" ජාතික සභාව | 2017.01.08 |
| 02. | 69 වන නිදහස් සැමරුම නිමිත්තෙන් ජනාධිපති මන්දිරයේ පැවති රාත්‍රී භෝජන සංග්‍රහය | 2017.02.04 |
| 03. | ජාතික සම්මාන උළෙල - 2017 | 2017.03.20 |
| 04. | කොළඹ දිස්ත්‍රික් විශේෂ පරිසර වැඩමුළුව | 2017.06.20 |
| 05. | සාර්ක් රටවල ගරු කථානායකවරුන් සහ ගරු පාර්ලිමේන්තු සභිකයින්ගේ 8 වන සමුළුව සඳහා සහභාගී වූ දූත පිරිස වෙනුවෙන් පැවැත්වූ රාත්‍රී භෝජන සංග්‍රහය | 2017.10.03 |
| 06. | දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වන ග්‍රාමශක්ති ව්‍යාපාරය සමාජගත කිරීමේ ජාතික උත්සවය | 2017.10.20 |
| 07. | සත්වන බෞද්ධ සමුළුවට සමගාමීව පැවති උත්සවය | 2017.11.02 |
| 08. | මැලේසියානු අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය නිමිත්තෙන් පැවැත් වූ දිවා භෝජන සංග්‍රහය | 2017.12.18 |
| 09. | නත්තල් දිනය වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය | 2017.12.19 |

මෙම කණ්ඩායමෙහි සාමාජික/සාමාජිකාවන් වෙනුවෙන් 2017.03.07 වන දින ඔවුන්ට පැවරී ඇති කාර්යය පිළිබඳ අවබෝධය, දැනුම පරීක්ෂා කර බැලීම සඳහා ලිඛිත පරීක්ෂණයක් මෙම අංශය මගින් පවත්වන ලද අතර, 2017.03.24 වන දින සම්භාවනීය ආරාධිතයන් පිළිගැනීම, අසුන් පැනවීම හා නිල රාජ්‍ය භෝජන සංග්‍රහයකදී පිළිගත් ආහාර ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව පුහුණු සැසිය පැවැත්වීමේ කටයුතු ද මෙම අංශය මගින් සිදු විය.






# ජනාධිපති පෞද්ගලික ලේකම් අංශය

## හැඳින්වීම

ගරු ජනාධිපතිතුමන් හා ගරු ජනාධිපතිතුමන් වෙනුවෙන් ඉටු කරනු ලබන කාර්යයන් වලදී ජනාධිපති පෞද්ගලික ලේකම්තුමන්ට අවශ්‍ය ලෙසින් අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම.

## ප්‍රධාන අරමුණු

ගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්/උපදෙස් හා නියෝග /ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියා කිරීම.

## පොදු අරමුණු/ කාර්යයන්

| ක්‍රියාකාරකම් | | අරමුණු සාක්ෂාත් කර ගැනීම |
|---|---|---|
| 1 | ගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්, උපදෙස් හා නියෝග, ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම. | නියෝග ලද වහාම අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. |
| 2 | ගරු ජනාධිපතිතුමන් සහභාගී වන උත්සව, රැස්වීම් හා හමුවීම් අවස්ථා සටහන් තබමින් දින පොත සැකසීම. ඒ අනුව දෛනික වැඩසටහන් පෙළගැස්වීම, සම්බන්ධීකරණය හා අදාළ අංශ හා නිලධාරීන් දැනුවත් කිරීම. | එම |
| 3 | ගරු ජනාධිපතිතුමාගේ නියෝග අනුව එතුමාගේ අත්සනට ලිපි සැකසීම. | එම |
| 4 | ගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමුවිය යුතු ලිපි/වාර්තා, උත්සව ආරාධනා ආදිය සටහන් සහිතව එතුමාට ඉදිරිපත් කිරීම හා ඒ සඳහා ලබා දෙන නියෝග අනුව කටයුතු කිරීම. | එදිනෙදා කටයුතු සිදු කර අත. |
| 5 | ගරු ජනාධිපතිතුමන් වෙත මහජන නියෝජිතයින් හා ජනතාව විසින් එවනු ලබන ලිපි සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. | එම |
| 6 | ලැබෙන තැපැල හා සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම / ලිපිගොනු සැකසීම හා පවත්වාගෙන යාම. | එම |

## වෛද්‍ය සේවා ඒකකය

### හැඳින්වීම

ජනාධිපති ලේකම් කාර්යාලය තුළ පවත්නා වෛද්‍ය සේවා ඒකකය ජනාධිපති ලේකම්තුමා යටතේ ක්‍රියාත්මක වන අතර ගරු ජනාධිපතිතුමාගේ සහ සමීප ඥාතීන්ගේ මෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සෞඛ්‍ය යහපත් මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් සහ ප්‍රතිකාර ලබා දෙනු ලබයි.
එයට අමතරව ආර්ථික දුෂ්කරතා සහිත පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීමට අවශ්‍ය සහන කටයුතු සැලසුම් කිරීම ද මෙම ඒකකය මගින් සිදු කරනු ලැබේ.

### ප්‍රධාන අරමුණු : -

- ගරු ජනාධිපතිතුමාගේ රථපෙළ සමඟ ගමන් ගන්නා ගිලන් රථය සක්‍රිය තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරී වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක තත්වයෙන් පවත්වාගෙන යාම.
- එම ගිලන් රථයේ නඩත්තු කටයුතු සහ සැපයුම් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු වලදී ඒ සඳහා මැදිහත්ව ක්‍රියාකිරීම.
- ගරු ජනාධිපතිතුමාගේ සෞඛ්‍ය කටයුතු මෙරටේ දී මෙන්ම පිටරට තුළදී ද සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා එතුමා සමඟ ගමන් කිරීම.
- කාර්යාලීය නිලධාරීන්ට යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාර්යාලයේ නිලධාරීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට උපදෙස් ලබාදීමටත්, ප්‍රතිකාර කිරීමටත් වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
- කාර්යාලයේ නිලධාරීන්ට විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සෙසු ප්‍රධාන සෞඛ්‍ය ආයතන වෙත යොමු කිරීම.
- කාර්යාලය මගින් පොදු මහජනතාවගේ සුභ සාධනය සඳහා වරින් වර සැලසුම් කර දුෂ්කර ප්‍රදේශවලදී පවත්වනු ලබන සෞඛ්‍ය වැඩසටහන් ගුණාත්මකව පැවැත්වීම සඳහා උපදෙස් හා ක්‍රියාකාරී දායකත්වයන් අවශ්‍ය අවස්ථා වලදී ලබා දීම.
- රටේ අවශ්‍යතාවය අනුව කාලානුරූපීව ඇතිවිය හැකි ඕනෑම සෞඛ්‍ය කටයුත්තක් සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නැංවීම.

2017 වර්ෂයේදී සාක්ෂාත් කරගැනීම්

1. 2017 ජනවාරි මස 27 වන දින “ ගැටලු මැද සතුටෙන් " යන මාතෘකාව යටතේ කාර්යාලීය මහත්ම මහත්මීන් දැනුවත් කිරීමේ දේශනයක් සංවිධානය කිරීම
2. 2017 පෙබරවාරි මස 06 වන දින “ ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය නිමිත්තෙන් කාර්යාලීය මහත්ම මහත්මීන් වෙනුවෙන් “ සුවය, සතුට ජයග්‍රහණය සඳහා ශරීර සුවතා ප්‍රවර්ධනයේ වැදගත්කම" යන මැයෙන් දැනුවත් කිරීමේ දේශනයක් සංවිධානය කිරීම.

3. 2017 මාර්තු මස 03 වන දින "දියවැඩියාව සහ අධික රුධිර පීඩනය, රුධිරගත කොලෙස්ටරෝල් දැනගනිමු, හඳුනාගනිමු, වැළකෙමු" යන මාතෘකාව යටතේ කාර්යාලීය මහත්ම මහත්මීන් දැනුවත් කිරීමේ දේශනයක් සංවිධානය කිරීම.
4. 2017 මාර්තු මස 23 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ආහාර පරීක්ෂණ හා ආරක්ෂණ අංශයේ නිලධාරින් හට පුහුණු වැඩමුළුවක් වෛද්‍ය පර්යේෂණ ආයතනය හා එක්ව සංවිධානය කිරීම.
5. 2017 ජූලි මස අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මීගමුව රෝහල අසල ඩෙංගු රෝගීන්ගේ රුධිර පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
6. 2017 නොවැම්බර් මස 11 වන දින ජනාධිපති ලේකම් කාර්යාලීය නිලධාරී මහත්ම මහත්මීන් වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික රෝහල, RADIANT EYE Hospital හා එක්ව අක්ෂි සායන වැඩසටහනක් පැවැත්වීම.

# කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම, ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම, කොළඹ හා පිට පළාත්වල උත්සව හා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම හා ගරු ජනාධිපතිතුමාට ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ එතුමාගේ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගැනීම, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලයේ ප්‍රධාන වගකීම් වේ.

## ප්‍රධාන අරමුණු

1. ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම.
2. ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම.
3. ගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය.
4. ගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම සඳහා සම්බන්ධීකරණය.
5. මහජනතාවගෙන් ගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන අවශ්‍යතා සපුරාදීම හා ගැටලු නිරාකරණය කරදීම සම්බන්ධීකරණය කිරීම.
6. "බෞද්ධ පුනරුද අරමුදල" මගින් බෞද්ධ ආගමික, සංස්කෘතික හා අධ්‍යාපන සේවාවන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ආයතන වල සහ විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ සුබසාධනය ඇතිකිරීම.
7. ගම්පහ, පහල යාගොඩ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
8. 2016 – 2020 "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය මගින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් ඇතිකිරීම.

### 2017 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම

1. ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම.

ජනාධිපති කාර්යාලයට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩල සඳහා විෂයානුබද්ධ දැනුම, කාර්යාලීය ක්‍රම හා විනය හා ආකල්ප වර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම සහ පසු විපරම තුලින් අරමුණු ඉටුකර ඇත.

2. ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කර තිබීම.

කාර්යාලයේ සහ නිල නිවසේ, ක්ෂේත්‍ර රාජකාරීවලදී ආරක්ෂක ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර සම්බන්ධීකරණ වැඩපිළිවෙලක් සකස් කිරීම. ගරු ජනාධිපතිතුමාගේ හා කාර්යාලයේ තොරතුරු අනවශ්‍ය පාර්ශ්වයන් වෙත යොමුවීම වැළැක්වීම සඳහා ක්‍රියාපිළිවෙලක් සකස් කිරීම සහ ජංගම දුරකථන, ඉලෙක්ට්‍රොනික උපකරණ කාර්යාලය තුළට රැගෙන ඒම පාලනය කිරීම, කාර්යාලයට පැමිණෙන අමුත්තන් පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම ආදිය මගින් ගරු ජනාධිපතිතුමාගේ සහ ජනාධිපති කාර්යාලයේ ආරක්ෂාව තහවුරු කරන ලදි.

3. ගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය.

ගරු ජනාධිපතිතුමා කොළඹ හා පිට පළාත්වල සහභාගී වන රැස්වීම්වල සූදානම, එයට සහභාගී වීමේ යෝග්‍යතාවය හා එහි දී කථාවක් පැවැත්වීමේ යෝග්‍යතාව, ආරාධනා කර ඇති හා සහභාගී වීම තහවුරු කර ඇති ආරාධිතයින් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණ, රැස්වීම හෝ උත්සව භූමියට ප්‍රවේශවන මාර්ග විස්තරය, මාධ්‍ය ආවරණය හා ආරක්ෂක විධිවිධාන පිළිබඳව පූර්ණ අවබෝධය ලබා ගනිමින් ඒ පිළිබඳ ගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීම මගින් පවත්වන ලද රැස්වීම් හා උත්සව යාවත්කාලීන කරන ලදි.

මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරුන්ට දිස්ත්‍රික්කවල වගකීම් පවරා ඇති අතර එම නිලධාරීන්ගෙන් ද ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ගෙන් ද තොරතුරු ලබාගැනීමට වැඩපිළිවෙලක් සකස් කර තිබේ. ලබාගන්නා තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තහවුරු කර ගැනීමේ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක වේ.

4. ගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම.

ගරු ජනාධිපතිතුමා සහභාගී වන ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන රැස්වීම්, අරමුණු, ඉදිරිපත් විය හැකි ගැටලු හා ඉල්ලීම්, සහභාගී වන පාර්ශවයන්, රැස්වීමේ අරමුණු අනුව සෘජුවම සම්බන්ධවන ආයතන පිළිබඳව පූර්ව අවබෝධයක් ලබාගෙන ගරු ජනාධිපතිතුමා දැනුවත්කිරීමේ කටයුතු සිදුකරන ලදි.

රැස්වීමට ගරු ජනාධිපතිතුමා ප්‍රවේශවීමට පෙර න්‍යාය පත්‍රය, සහභාගී වන්නන් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණට අදාල පසුබිම් තොරතුරු සහිත ගොනුවක් සහ සටහනක්, සටහන් තබා ගැනීමේ ලිපිද්‍රව්‍ය මේසය මත සූදානම්ව ඇති බව තහවුරු කර ගැනීම. අවස්ථාවෝචිත පරිදි මාධ්‍ය ආවරණ සූදානම යන කටයුතු පිළිබඳව වඩාත් අවධානය යොමුකරන ලදි.

5. ගරු ජනාධිපතිතුමාට පෞද්ගලිකව ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ සම්බන්ධව ප්‍රතිචාර දැක්වීම.

ගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන මහජන ඉල්ලීම් හඳුනාගෙන වර්ගීකරණය කර අදාළ අංශ වෙත යොමු කිරීම. යොමුකළ ලිපි සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම, මහජන අවශ්‍යතා ඉටුකිරීමට ඇති බාධා හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීම, මහජන අවශ්‍යතා ඉටුවීම තහවුරු කරගැනීම මගින් එම ඉල්ලීම් සම්බන්ධව විශේෂ අවධානය යොමුකර ක්‍රියාමාර්ග ගන්නා ලදි. ඒ අනුව 2017 වර්ෂයේදී ගරු ජනාධිපතිතුමා වෙත ලැබුණු ඉල්ලීම්වලින් ආසන්න වශයෙන් 9,000කට පමණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

6. "බෞද්ධ පුනරුද අරමුදල" මෙහෙයවීම

1. බෞද්ධ පුනරුද අරමුදල සඳහා දේශීය හා විදේශීය වශයෙන් බැංකු ගිණුම වෙත සෘජුවම කරන පරිත්‍යාග හරහා දායකත්වය ලබාගැනීමට කටයුතු කරන ලදි.
   ඒ අනුව 2017.12.31 දිනට බෞද්ධ පුනරුද අරමුදල සඳහා ලැබී ඇති පරිත්‍යාගවල එකතුව
   රු . 102,360,136.97 කි.

2. ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වය මත 2018 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා 2017 වර්ෂයේදී හඳුනාගත් ව්‍යාපෘති සංඛ්‍යාව හා ඇස්තමේන්තුගත මුදල පහත දක්වා ඇත.

| ශ්‍රම දායකත්වය | ව්‍යාපෘති ස්ථාන ගණන | ඇස්තමේන්තුගත මුළු මුදල රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 09 | 3,840,271.56 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 08 | 6,520,570.88 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 09 | 3,783,522.60 |
| එකතුව | 26 | 14,144,365.04 |

7. ගම්පහ පහළ යාගොඩ සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අදාළ අනෙකුත් පාර්ශවයන් සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදි.



8. "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධීකරණය.

"පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රජාවගේ සහ ප්‍රජා සංවිධානවල, රාජ්‍ය නිලධාරීන්ගේ හා දේශපාලන නායකයන්ගේ සහභාගීත්වය ද, විද්වතුන්ගේ මගපෙන්වීම ද ආගමික නායකයන්ගේ අනුශාසනා හා ආශීර්වාද ද අනුව ජනජීවිතයට අදාළ හඳුනාගත් සියලු ක්ෂේත්‍රයන්හි සංවර්ධන අවශ්‍යතා ප්‍රමුඛතා පදනමින් පෙළගස්වා 2016 – 2020 පස් අවුරුදු සැලැස්මක් පිළියෙල කර තිබේ.

ඒ අනුව 2017 වර්ෂයේ මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා සංවර්ධන ක්ෂේත්‍රයන් හඳුනාගෙන වැඩ අවසන් කර ඇති අතර තවදුරටත් ඉදිරි සැලැස්ම අනුව වැඩ කරමින් පවතින ව්‍යාපෘති ද පවතී. ඒ අනුව ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍රයන් හා ඒ සඳහා 2017 වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදන හා වැය වූ මුදල් මෙසේ පෙන්වා දිය හැක.

| සංවර්ධන ක්ෂේත්‍ර ගණන | 2017 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘති ගණන | 2017 අවසන් කළ ව්‍යාපෘති ගණන | 2017 වර්ෂයේ වියදම |
|---|---|---|---|
| 26 | 2338 | 1781 | 5,630,903,126.14 |





# අභ්‍යන්තර පාලන අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ සියලුම අංශ හා ඒකක වෙත පැවරී ඇති කාර්යභාරයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාල ඉඩ පහසුකම්, භෞතික සම්පත් හා සේවාවන් සැපයීම කළමනාකරණය කිරීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය වේ.

මෙම කාර්යභාරය ඉටු කිරීම සඳහා අභ්‍යන්තර පාලන අංශය යටතේ පහත සඳහන් ඒකක ක්‍රියාත්මක වේ.

- *අභ්‍යන්තර මෙහෙයුම් ඒකකය*
- *ප්‍රසම්පාදන ඒකකය*
- *ඉංජිනේරු ඒකකය*
- *ගොඩනැගිලි නඩත්තු ඒකකය*
- *තැපැල් I ඒකකය*
- *තැපැල් II ඒකකය*
- *ප්‍රධාන දුරකථන හුවමාරුව*
- *පිළිගැනීමේ ඒකකය*
- *ලේඛනාගාරය*
- *ගුවන් හමුදා සංග්‍රහ ඒකකය*
- *ජනාධිපති මන්දිර (කොටුව, මහනුවර, අනුරාධපුරය, නුවරඑළිය , මහියංගණය , කතරගම)*
- *භාෂා පරිවර්තන ඒකකය*
- *තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය*
- *ප්‍රවාහන ඒකකය*

## ප්‍රධාන කාර්යයන් හා අරමුණු

- ➢ ජනාධිපති කාර්යාලයේ සියලුම අංශ හා ඒකකවලට අදාළව කාර්යාල ඉඩ පහසුකම් උපකරණ හා සේවාවන් සැපයීම.
- ➢ විශේෂ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම හා ඊට අදාළ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම
- ➢ ජල /විදුලි /දුරකථන බිල්පත් ගෙන්වා ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය කටයුතු කිරීම
- ➢ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම, භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අපහරණය කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම/ විනාශ කිරීම සිදු කර නිසි පරිදි වට්ටෝරු භාණ්ඩ ලේඛන පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම .
- ➢ දිස්ත්‍රික්කයෙන් පිටත පැවැත්වෙන රැස්වීම්/උත්සව සඳහා සහභාගීවන නිලධාරීන් වෙත අත්තිකාරම් ලබා දීම/පියවීම හා එම නිලධාරීන්ට අවශ්‍ය නවාතැන් සපයා ඊට අදාළ ගෙවීම් කටයුතු කිරීම
- ➢ ජනාධිපති කාර්යාලයීය නිල හැඳුනුම්පත් නිකුත් කිරීම.

- මාණ්ඩලික නිලධාරීන්ගේ නිල නිවාස සම්බන්ධ කටයුතු කිරීම.

- සියලුම අංශ/ඒකකවලින් ලේඛනාගාරය වෙත එවනු ලබන ලිපිගොනු විධිමත්ව අසුරා තැබීම / නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.

- කාර්යාලයේ තැපැල් ඒකකය මඟින් ලැබෙන හා පිටතට යැවෙන තැපැල විධිමත්ව, අප්‍රමාදව හා වගකීමෙන් යුතුව අදාළ අංශ/ඒකක වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

- ජනාධිපති කාර්යාලයේ සියලුම ගොඩනැගිලිවල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු නාවික/හමුදා ඉංජිනේරු අංශයේ සහයෝගයෙන් ප්‍රමුඛතාවය අනුව ඉටු කිරීම.

- වාර්ෂික ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ වසරට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඊට අනුකූලව භාණ්ඩ ඇණවුම් කිරීම, භාණ්ඩ නිකුත් කිරීම.

- ප්‍රධාන දුරකථන හුවමාරුව සම්බන්ධව කාර්යයන් ඉටු කිරීම හා නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම.

- ජනාධිපති කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන සියලුම උත්සව අවස්ථාවන් සඳහා සංග්‍රහ පහසුකම් සැපයීමට අදාළව සියලු සංග්‍රහ කටයුතු සංවිධානය කිරීම හා සේවා සැපයීම. මෙහිදී ගුවන් හමුදා සංග්‍රහ ඒකකයේ සහාය ලබා ගැනීම සිදු කරනු ලැබේ.

- ජනාධිපති කාර්යාලය විසින් සකස් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සන්දේශ, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා, අමාත්‍ය මණ්ඩල සන්දේශ පිළිබඳ නිරීක්ෂණ, ගැසට් නිවේදන, චක්‍රලේඛ, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු, විවිධ ආයතන, හා පුද්ගලයින් වෙත යොමු කෙරෙන ලිපිලේඛන හා ලැබෙන ලිපිලේඛන සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාත්‍රයට පරිවර්තනය කිරීම හා කථන පරිවර්තන සේවා සැපයීම.

- අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් ප්‍රභූන්ගේ අවමංගල්‍ය කටයුතුවලදී ශෝකය ප්‍රකාශ කිරීමේ වැඩපිළිවෙල යටතේ ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරීම හා අදාළ වියදම් පියවීම.

## 2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

- **අභ්‍යන්තර මෙහෙයුම් ඒකකය**

1. විශේෂ රාජ්‍ය උත්සව/රැස්වීම් /උත්සව සංවිධානය කිරීම හා ඊට අදාළ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් සම්බන්ධීකරණය කරමින් සාර්ථකව කටයුතු ඉටු කිරීම.

- **රාජ්‍ය තාන්ත්‍රික උත්සව**

රාජ්‍ය තාන්ත්‍රික උත්සව කටයුතු සංවිධානය කිරීම හා එහි සියලු කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබන සුවිශේෂී කාර්යයක් වේ. රාජ්‍ය තාන්ත්‍රික උත්සවයන්හි පහත කාර්යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් අදාළ පාර්ශවයන් වෙත උත්සවයේ වගකීම් පැවරීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

- විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කිරීම.
- අනතුරුව ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදා, රථවාහන පොලිස් සහ අදාළ අනෙකුත් පාර්ශවයන් සමඟ සාකච්ඡා පැවැත්වීම
- රජයේ කර්මාන්ත ශාලාව මඟින් විශේෂ පීඨිකාව සැකසීම, රතු පලස් එලීම, හමුදා සම්මාන මුර ආචාර පෙළපාලිය හා කාලතුවක්කු මුර වෙඩි ආචාර පිරිනැමීම සඳහා කටයුතු සංවිධානය කිරීම
- රාජ්‍ය නායක හමුව, ද්විපාර්ශ්වික සාකච්ඡා හා ද්විපාර්ශ්වික ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

  - ➢ සංග්‍රහ, සැරසිලි කටයුතු සංවිධානය කිරීම
  - ➢ විශේෂ භෝජන සංග්‍රහ/රාජ්‍ය භෝජන සංග්‍රහ පැවැත්වීමට අවශ්‍ය බාහිර/අභ්‍යන්තර පාර්ශවයන් සම්බන්ධීකරණය
  - ➢ අවශ්‍ය අවස්ථාවලදී විවිධ ආයතන අතර සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

**2017 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ පැවති රාජ්‍ය තාන්ත්‍රික උත්සව අවස්ථාවන්**

- 2017.01.07 - ඉන්දීය අන්ද්‍රා ප්‍රදේශයේ මහ ඇමතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



- 2017.05.11 - ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



- 2017.05.15 - නේපාලයේ ජනාධිපතිතුමියගේ ශ්‍රී ලංකා නිල සංචාරය



- 2017.12.18 - මැලේසියා අගමැතිවරයාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



➢ **වෙනත් උත්සව අවස්ථාවන්**

පහත උත්සව අවස්ථාවලදී විවිධ ආයතන අතර සියලුම සම්බන්ධීකරණ කටයුතු ද, සංග්‍රහ, සැරසිලි කටයුතු හා අනෙකුත් පහසුකම් සැපයීම ද සිදු කිරීම

- 2017.01.02 දින ජනාධිපති කාර්යාලයේදී පැවති තිරසර දැක්ම ප්‍රකාශයට පත් කිරීමේ උත්සවය
- 2017.01.02 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති විහාරස්ථාන සඳහා මූල්‍යාධාර බෙදාදීමේ උත්සවය
- 2017.01.08 දින කොටුව ජනාධිපති මන්දිරයේ ස්වාමීන් වහන්සේලා 1000 නමකට පැවති දානමය පිංකම
- 2017.01.08 දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති තිරසර යුගයක තෙවසරක ඇරඹුම උත්සවය

- 2017.02.04 දින ජාතික නිදහස් දිනය නිමිත්තෙන් කොටුව ජනාධිපති මන්දිරයේදී පැවැත් වූ රාත්‍රී භෝජන සංග්‍රහය
- 2017.02.22 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිලධාරීන් සඳහා වූ රාත්‍රී භෝජන සංග්‍රහය
- 2017.03.20 දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවති ජාතික සම්මාන ප්‍රදානෝත්සවය
- 2017.04.03 දින කොටුව ජනාධිපති මන්දිරයේදී කලාකරුවන් සඳහා පැවැත් වූ තේ පැන් සංග්‍රහය
- 2017.04.25 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවැත් වූ විද්වතුන් සඳහා වූ රාත්‍රී භෝජන සංග්‍රහය
- 2017.05.04 දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය දියත් කිරීමේ උත්සවය





- 2017.05.10 දින පැවති රාජ්‍ය වෙසක් උත්සවය
- 2017.05.21 දින එක්සත් ජාතීන්ගේ වෙසක් සැමරුම් උත්සවය සාර්ථකව නිම කර ගැනීම සඳහා සහභාගී වූ නිලධාරින් සඳහා කොටුව ජනාධිපති මන්දිරයේදී පැවැත් වූ රාත්‍රී භෝජන සංග්‍රහය
- 2017.06.20 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති ඉෆ්තාර් උත්සවය
- 2017.08.08 දින මහනුවර ජනාධිපති මන්දිරයේදී දළදා පෙරහැරේ නිමාව සනිටුහන් කරමින් දිය කැපීමේ උත්සවය
- 2017.08.09 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති ජාත්‍යන්තර තේ සමුළු උත්සවය
- 2017.09.06 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති දරුවන් සුරකිමු තිරසර පාසල් වැඩසටහන





- 2017.10.19 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති දීපවාලී උත්සවය
- 2017.10.20 දින සුගතදාස ශෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවති ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය දියත් කිරීමේ උත්සවය
- 2017.11.10 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති බෞද්ධ සම්මේලනය

➢ **2017.12.19 වන දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති නත්තල් උත්සවය**



➢ **2017.12.20 දින කොටුව ජනාධිපති මන්දිරයේදී පැවති BIMSTEC සමුළුවේ නියෝජිතයින්ට පැවති භෝජන සංග්‍රහය**



➢ **අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාවන්**

2017.01.24 වන දින කොටුව මන්දිරයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

- මොංගෝලියාව
- ලිතුවේනියාව
- පැනමා
- ඉන්දියාව



➢ 2017.06.28 වන දින කොටුව මන්දිරයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

- ටියුනීසියාව
- සී ෂෙල්ස්
- ස්පාඤ්ඤය
- ජෝර්ජියාව



➢ 2017.09.11 වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්

- එස්ටෝනියාව
- පේරු
- තායිලන්තය



1. ඊට අමතරව 2017 වසර තුලදී කාර්යාලයේ විවිධ රැස්වීම් 155 ක් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කර ඇත.

2. ජල /විදුලි / බිල්පත් ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය කටයුතු කිරීම.

මෙහිදී 2017 වර්ෂයේ ජනාධිපති කාර්යාලය යටතේ ඇති ගොඩනැගිලි 34 ක් වෙනුවෙන් ජල බිල්පත් පියවීම සඳහා රු. 29,680,804.13 ක මුදලක් ද විදුලි බිල්පත් පියවීම සඳහා රු. 103,212,952.12 ක මුදලක් වියදම් කර ඇත.

3. දුරකථන බිල්පත් ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට කටයුතු සිදු කර ඇත.

මෙහිදී මාණ්ඩලික නිලධාරින්ගේ බිල්පත් පියවීම සඳහා මුළු වියදම රු 7,288,029.91 ක මුදලක් වැය කර ඇත.

4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම, භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අපහරණය කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම/ විනාශ කිරීම 2017 වර්ෂයේදී ද පහත පරිදි සිදු කරනු ලැබිණි.

   - භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා නිලධාරීන් 42 ක් යොදවනු ලැබූ අතර එම නිලධාරීන් විසින් මෙම කාර්යාලයේ හා ඊට අයත් සියලුම අංශ හා ඒකකවලට අදාළව හා සියලුම ගොඩනැගිලිවල ද භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී. එම සමීක්ෂණ කටයුතු අවසානයේ භාණ්ඩ වෙන්දේසි කිරීමට ද කටයුතු කරනු ලැබීය.

එමඟින් මෙම කාර්යාලයට රු. 479,960/- ක ආදායමක් උපයා ගැනීමට කටයුතු කර ඇත.

5. මෙම කාර්යාලයේ පත්වීම් ලබා විවිධ අංශවලට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් 213 ක් සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

6. දිස්ත්‍රික්කයෙන් පිටත පැවැත්වෙන රැස්වීම්/උත්සව සඳහා සහභාගීවන නිලධාරීන් වෙත 2017 වර්ෂයේදී රු. 23,530,039 .00 ක අත්තිකාරම් ලබා දීම/පියවීම සඳහා කටයුතු කර ඇත.

7. අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් ප්‍රභූන් 190 කගේ අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමට කටයුතු කර ඇත.

## ➢ ගොඩනැගිලි නඩත්තු ඒකකය

- ජනාධිපති කාර්යාලයේ සියලුම ගොඩනැගිලිවල නඩත්තු කටයුතු වෙනුවෙන් රු. 143, 846,811.03 ක මුදලක් වැය කර ඇති අතර පැරණි ගොඩනැගිල්ලට සම්බන්ධව ඉදි කෙරෙන නව ගොඩනැගිල්ල නාවික හමුදා සහයෝගයෙන් ඉදිකර ඇත.

- තවද මෙම කාර්යාලය යටතේ පවතින ගොඩනැගිලිවල හා මන්දිරවල අලුත්වැඩියා / නඩත්තු කටයුතු ද නාවික හමුදා සහයෝගය යටතේ පවත්වා ගැනීමට කටයුතු සිදු කර ඇත.

## ➢ ප්‍රසම්පාදන ඒකකය

- 2017 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ඇස්තමේන්තු සකස් කිරීම, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඊට අනුකූලව භාණ්ඩ ඇණවුම් කිරීම, භාණ්ඩ නිකුත් කිරීම සිදු කරන ලදී.

- මෙම කාර්යාලයේ සුළු පරිමාණ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් රු. 290,852,815.70 ක මුදලක් හා මහා පරිමාණ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් රු. 329,539,042.96 ක මුදලක් වැය කරමින් නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියන්ට අනුකූලව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කර ඇත.

## ➢ තැපැල් I හා තැපැල් II ඒකක

කාර්යාලයේ තැපැල් *II* ඒකකයට 2017 වර්ෂයේදී පහත පරිදි ලිපි ලැබීම් සිදු වී ඇති අතර සියළු ලිපි ක්‍රමානුකූලව නියමිත පරිදි නොපමාවම අදාළ අංශ වෙත යොමු කර ඇත.

| | |
|---|---|
| • ලියාපදිංචි තැපැල | 8652 |
| • සාමාන්‍ය තැපැල | 14633 |
| • ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් අංශයට | 56182 |
| • අතින් | 6235 |
| • ෆැක්ස් | 5485 |
| • මුළු ලිපි ගණන | 91187 |

- කාර්යාලයේ තැපැල් 1 ඒකකයෙන් 2017 වර්ෂයේදී නියමිත පරිදි ලිපි යැවීම් කරන ලද අතර එහිදී කාර්යාලයෙන් පිටතට යැවෙන ලිපි නිසි පරිදි ක්‍රමානුකූලව යැවීමට කටයුතු කර ඇත.

- එහිදී ලිපි යැවීම සඳහා සාමාන්‍ය තැපැල හා ලියාපදිංචි තැපැල වෙනුවෙන් භාවිතා කරන ලද මුද්දර වටිනාකම රු 3,411, 000.00

## ➢ ලේඛනාගාරය

මෙම කාර්යාලයේ පවතින ආරක්ෂා කරගෙන පවත්වාගෙන යා යුතු පැරණි ලිපි ලේඛන හා ලිපිගොනු නිසියාකාරව ආරක්ෂිතව ගබඩා කිරීම හා අවශ්‍ය විටෙක ඒවා සොයා බලා තොරතුරු සැපයීම

## ➢ ප්‍රධාන දුරකථන හුවමාරුව හා පිළිගැනීමේ ඒකකය

- කාර්යාලයට පැමිණෙන සේවාලාභීන් සුහද ලෙස පිළිගෙන අවශ්‍ය උපදෙස් ලබා දීම හා අදාළ අංශ වෙත යොමු කිරීම

- මෙම කාර්යාලය වෙත පැමිණෙන දුරකථන ඇමතුම් සඳහා නිසියාකාරව සංයමයෙන් හා අප්‍රමාදීයව පිළිතුරු ලබා දීම මඟින් කාර්යක්ෂම සේවාවක් ලබා දීම

- කාර්යාලයේ අභ්‍යන්තර නිලධාරින් අතර සන්නිවේදන කටයුතු සඳහා සහාය වීම

### ➢ ගුවන් හමුදා සංග්‍රහ ඒකකය

මෙම කාර්යාලයේ පැවැත්වෙන සියලුම උත්සව හා රැස්වීම් සඳහා ඉතා ප්‍රණීත හා විශ්වාසදායී ලෙස ආහාරපාන කලට වේලාවට අඩු වියදමින් සැපයීම මඟින් සෑම උත්සව හා රැස්වීම් අවස්ථාවකදීම රජයට විශාල මුදලක් ඉතිරි කර දී ඇත.

### ➢ භාෂා පරිවර්තන ඒකකය

ජනාධිපති කාර්යාලය විසින් සකස් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සන්දේශ, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා, අමාත්‍ය මණ්ඩල සන්දේශ පිළිබඳ නිරීක්ෂණ, ගැසට් නිවේදන, චක්‍රලේඛ, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු, විවිධ ආයතන, හා පුද්ගලයින් වෙත යොමු කෙරෙන ලිපිලේඛන හා ලැබෙන ලිපිලේඛන 850 ක් පමණ 2017 වර්ෂයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාත්‍රයට පරිවර්තනය කිරීමේ කටයුතු ඉතා කාර්යක්ෂම ලෙස ඉටු කර ඇත.

### ➢ ප්‍රවාහන ඒකකය

01. ප්‍රවාහන අංශයේ කාර්ය භාරය

- ගරු ජනාධිපතිතුමන්ට අනුයුක්ත රථ වාහන වලට අදාල සියලු කටයුතු සිදු කිරීම.
- දෛනික ප්‍රවාහන සේවාවන් සැපයීම.
- ජනාධිපති කාර්යාලයට අයත් සියලු රථවාහන නඩත්තු කිරීම.
- ජනාධිපති කාර්යාලය සතු රථවාහන වලට අදාල රක්ෂණය, ආදායම් බලපත්‍ර, දුම් පරීක්ෂණ වාර්තා ලබා ගැනීම.
- රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීම.
- ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම, ඉන්ධන ඇණවුම් ගෙවීම් කටයුතු සඳහා නිවැරදි තාවය පරීක්ෂා කර වවුචර් පිළියෙල කර ගිණුම් අංශයට ඉදිරිපත් කිරීම.
- වාහන අළුත්වැඩියාවන් සහ අදාල සේවාවන් සඳහා වන බිල්පත් පරීක්ෂා කර ගෙවීම් කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කිරීම.
- ඉන්ධන නිකුත් කිරීම් වලට අදාලව ධාවන සටහන් පරීක්ෂා කිරීම සහ ඉන්ධන පිරිවැය නිසි කළමනාකරණයක් තුළින් පවත්වාගෙන යාම.
- රථවාහන වට්ටෝරු ලේඛණය පවත්වාගෙන යාම, පවරා ගැනීම, පවරා දීම, අපහරණය කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත බඳවා ගනු ලබන නවක රියදුරන් පුරප්පාඩු පවතින අදාල අංශ සඳහා අනුයුක්ත කිරීම.
- රියදුරන්ගේ සහ කාර්ය මණ්ඩලයේ දක්ෂතාවයන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා මානව සම්පත් සංවර්ධන අංශය හා එක්ව සංවිධානය කිරීම.

02. කාර්යය මණ්ඩලය

- රාජ්‍ය සේවයට බැඳුණු නවක නිළධාරීන් හා වෙනත් රාජ්‍ය ආයතනවලින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිළධාරීන්ගෙන් සමන්විතය. ඒ අනුව දැනට කාර්යාලයීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් හැර අනෙක් පුරප්පාඩු සම්පූර්ණ කර ඇති අතර, ඔවුනට අවශ්‍ය පුහුණුවීම් මානව සම්පත් සංවර්ධන අංශයෙන්

සංවිධානය කරනු ලැබේ. රියදුරු කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු ගණනාවක් ඇතිවී තිබෙන අතර ඒ සඳහා නව බඳවා ගැනීම් 2018 පළාත් පාලන මැතිවරණයෙන් පසු සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කරමි.

- එසේම දැනට රියදුරු කාර්යය මණ්ඩලයද නවක රියදුරන් සහ රාජ්‍ය සේවයේ වෙනත් ස්ථානවලින් ජනාධිපති ලේකම් කාර්යාලයට ස්ථාන මාරුවීම් ලැබ පැමිණි රියදුරන්ගෙන් සමන්විතය. සියලු රියදුරන් සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සහ වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තාක්ෂණික හා මාර්ග නීති පිළිබඳ දැනුමට අමතරව ධනාත්මක චින්තනය හා මානසික ආතති පාලනය පිළිබඳ වැඩමුළු ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙම සියලු පුහුණු සැසි අවසානයේ සහභාගි වූවන්ගෙන් ලැබූ ප්‍රතිචාර ඉතා යහපත් විය.

- රාත්‍රී සේවය නිමකරන රියදුරන් සඳහා විවේක ගැනීමට ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවූ අතර දහවල් කාලයේ රියදුරන්ට රැඳී සිටීමට සුදුසු ස්ථානයක් නොතිබිණි. ඒ සඳහා සුදුසු ආකාරයට සකස් කළ බහලුම් දෙකක් (Containers) ස්ථාපිත කරන ලදී.

- කාර්මික නිලධාරීන් දෙදෙනාට ද රාජකාරි සඳහා බහලුමක ඉඩකඩ ලබා දී ඇත.

03. සේවා සැපයීම

දැනට ප්‍රවාහන අංශය සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කොට ගෙන සතුටුදායක සේවාවක් ලබා දෙන අතර, කාර්යය මණ්ඩලයේ රියදුරන් 30 ක පමණ පුරප්පාඩු පවතී. මෙම තත්වය යටතේ රියදුරු පුරප්පාඩු හේතුවෙන් දැනට අනුයුක්ත රියදුරන්ගේ නිවාඩු ඉල්ලීම් පාලනය කිරීමට සිදුවී ඇත.

04. කාර්යාලය නවීකරණය

කාර්යාලය විධිමත් අයුරින් සැකසීමේ කටයුතු අවසන් කර ඇති අතර, නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු, එම කාර්යාලයේ ප්‍රවාහන අංශය ස්ථාපිත කිරීමට නියමිතව ඇත. ජනාධිපති කාර්යාලයේ තොරතුරු සන්නිවේදන අංශයේ සහායෙන් පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කර ඇත. එම පරිගණක මෘදුකාංගය සඳහා දත්ත ඇතුලත් කිරීම හා පරීක්ෂණ අදියරේ භාවිතය ආරම්භ කර ඇත. පරිගණක පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වාර්තාවන් ලබා ගැනීම, කඩදාසි භාවිතය අඩුකිරීම හා දෛනික කාර්යයන් කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කෙරේ.

05. රථවාහන අලුත්වැඩියා කටයුතු

- රථවාහන අලුත්වැඩියා කටයුතුවලට යොමු කිරීමේදී වාහන තාක්ෂණික නිළධාරීන්ගේ පූර්ව අධීක්ෂණයකින් පසු යොමු කරන බැවින් අනවශ්‍ය අළුත්වැඩියාවන් සඳහා ඉල්ලීම් පාලනය කර ඇත. අළුත්වැඩියාවන් ඉටුකළ පසුව ද වාහන පරීක්ෂාවන්ට ලක්කර ඉවත් කළ අමතර කොටස් නැවත භාරගෙන ගබඩා කිරීමට කටයුතු කර ඇත.

- දැනට ජනාධිපති කාර්යාලයේ ධාවනයෙන් ඉවත් කරන වාහන වෙනුවට අළුතින් මිලදී ගැනීම සිදු නොකරන බැවින් වෙනත් රාජ්‍ය ආයතනවල සතුටුදායක තත්වයේ ඇති වාහන ජනාධිපති කාර්යාලයට අනුයුක්ත කරවා ගෙන සාමාන්‍ය අළුත්වැඩියාවලින් පසු ධාවනයට එක් කර ගැනීම.

06. ඉන්ධන පරිභෝජනය

වෙනත් වර්ෂවලට සාපේක්ෂව ඉන්ධන පරිභෝජනය සතුටුදායක මට්ටමකට අඩුකර ගැනීමට හැකිවී ඇත. එම විස්තර පහත දක්වා ඇත.

| වර්ෂය | ඉන්ධන වියදම (රු) |
|---|---|
| 2015 | 120,000,000.00 |
| 2016 | 140,000,000.00 |
| 2017 | 180,000,000.00 |

*(ඉහත ගෙවීම් මේ වනවිට ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇති බිල්පත් සහිත වවුචර්වලට අදාලව ආසන්නතම වශයෙන් ගණනය කර ඇත.)*

07. රථවාහන හදිසි අනතුරු හා රක්ෂණ වන්දි ලබාගැනීමේ ප්‍රගතිය

- හදිසි අනතුරුවල වැඩිවීමක් දක්නට ඇති බැවින්, එම අනතුරුවලට අදාලව නිසි පරිදි පරීක්ෂණ කටයුතු සිදු කර, වග කිවයුතු රියදුරන්ට විරුද්ධව විනයානුකූලව පියවර ගැනීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් නොමිලයේ සම්මන්ත්‍රණ සැසි 02ක් කඩිනමින් පැවැත්වීමට පියවර ගෙන ඇත.

රක්ෂණ වන්දි පහත පරිදි ලබා ගෙන ඇත. (දළ වශයෙන් ගණනය කර ඇත)

| වර්ෂය | ලැබුණු මුදල (රු.) |
|---|---|
| 2017 වර්ෂයට පෙර සිදුවූ රිය අනතුරු වෙනුවෙන් 2017 වර්ෂයේදී ලද වන්දි | 13,000,000.00 |
| 2017 වර්ෂය තුල සිදු වූ රිය අනතුරු වෙනුවෙන් 2017 වර්ෂයේදී ලද වන්දි | 10,100,000.00 |

- පසුගිය වර්ෂවල (2014 සහ ඊට පෙර) හදිසි අනතුරුවලට අදාලව බොහෝමයක ලබා නොගත් රක්ෂණ වන්දි ලබා ගැනීම සහ ජනාධිපති ලේකම් නමට චෙක්පත් ලැබී අදාල ගරාජ වලට ගෙවා නිරවුල් නොකල රක්ෂණ වන්දි සියල්ලම නිරවුල් කිරීම සිදුකර ඇත.

- කාර්ය සාධන ඇගයීමේදී සහ වැටුප් වර්ධක ලබා දීමේ දී නොසැලකිලිමත් රිය ධාවනය, නිර්ණායකයක් ලෙස සැලකීමට ජනාධිපති ලේකම්තුමා උපදෙස් දී ඇත.

08. අධි ආරක්ෂිත වාහන

- අධි ආරක්ෂිත රථ නවීකරණය කර සාමාන්‍ය භාවිතයට ගත නොහැකි බැවින්, විකිණීමට හෝ පෞද්ගලික පරිහරණයට පවරාදිය නොහැක. එම රථ විනාශ කිරීමට හෝ පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව සාගර පරිසරයට හානිය අවම ලෙස ගැඹුරු මුහුදේ ගිල්වීම මේ දක්වා පැවති ක්‍රමවේදයයි. මීට අමතරව මෙම රථ සම්බන්ධයෙන් සැපයුම්කරුවන්ට නැවත මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳව ද විමසන ලදී. අපනයනය කිරීමේ නැව් ගාස්තු සහ ප්‍රතිචක්‍රීය කිරීමේ වියදම රජය විසින් දරනු ලබන්නේ නම් රථ භාරගත හැකි බව බෙන්ස් මෝටර් රථ නිෂ්පාදන සමාගම දන්වා ඇත.

- එබැවින් පාවිච්චියට ගත නොහැකි තත්වයේ හෝ භාවිතයෙන් ඉවත්කළ වෙඩි නොවදින රථ 08 ක් ශ්‍රී ලංකා නාවික හමුදාවට භාර දීමට කටයුතු කොට ඇත. එසේම තවත් වෙඩි නොවදින රථ 08 ක් පමණ කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ මහජන ප්‍රදර්ශනය සඳහා ලබා දීමට කටයුතු කර ඇත.

- භාවිතයෙන් ඉවත් කර ඇති සාමාන්‍ය වාහන අපහරණය කර විධිමත් ක්‍රමවේදය යටතේ විකුණා ඉවත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

09. **වාහන පවරාදීම**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන 16ක් සඳහා වාහන 95ක් පමණ පවරාදීමට කටයුතු කොට ඇත.

10. **නීති කටයුතු සඳහා උසාවි භාරයට පත්වූ වාහන නැවත ලබාගැනීම**

අස්ථානගතවීම, හදිසි අනතුරු, අවභාවිතය හා විවිධ හේතූන් මත උසාවිවල අත්අඩංගුවට පත් කර ගාල්කර තිබූ වාහනවල නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසු නැවත සේවයට එකතු කර ගැනීමට හැකි විය.

11. **නව මිලදී ගැනීම**

ආරක්ෂක රථ 10 ක් පමණ මිලදී ගැනීම අත්‍යවශ්‍ය වී ඇති අතර ඊට අදාල ඉල්ලීම අතිරේක ලේකම් (අභ්‍යන්තර පාලන) වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

12. **නව ව්‍යාපෘති සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම.**

නව ව්‍යාපෘති ලෙස ජනාධිපති කාර්යාලය යටතේ පවතින පිබිදෙමු පොළොන්නරුව, සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADEP) සඳහා අවශ්‍යතා පරිදි රාජකාරි කටයුතු වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සලසා දෙනු ලැබේ.

## 13. විගණන විමසුම් හා වාර්තා අනුව අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ප්‍රවාහන අංශයේ කටයුතු වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව කිරීම පිළිබඳ වැදගත් කරුණු සාකච්ඡා කරනු ලැබේ. එම රැස්වීමේදී එළඹෙන තීරණ අනුව කටයුතු කර ප්‍රගතිය වාර්තා කරනු ලැබේ.

ජාතික ඵලදායිතා සම්මානයක් දිනා ගැනීම අරමුණු කොට ආරම්භ කර ඇති වැඩපිළිවෙල සඳහා ප්‍රවාහන අංශයේ ද තත්ත්ව කව ආරම්භ කිරීම, ලිපිගොනු ප්‍රමිතියකට සකස් කිරීම, අනවශ්‍ය භාණ්ඩ ඉවත් කර කාර්යාලය නිසි පරිදි සකස් කිරීම දැනට අවසන් කර ඇති අතර ඉදිරි කටයුතු සඳහා ද දායකත්වයක් දක්වනු ලැබේ.

## ➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

**හැඳින්වීම**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය, අභ්‍යන්තර පාලන අංශය යටතේ පවතින අතර ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත සියලුම ස්ථානවල පරිගණක, දුරකථන සහ අනෙකුත් තාක්ෂණික උපකරණ නඩත්තු කටයුතු, වෙබ් අඩවි හා මෘදුකාංග නිර්මාණ කටයුතු , ජාලකරණ කටයුතු ආදිය සිදුකරනු ලබයි.

**ප්‍රධාන අරමුණු**

ජනාධිපති කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මගින් 2016 වර්ෂයේ දී සිදුකිරීම ආරම්භ කර ඇති කාර්යයන් සහ ඒවායේ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

01. ජනාධිපති කාර්යාලයේ ජාලකරණ පද්ධතිය විධිමත් කිරීම.

මෙම කාර්යයෙන් 60% ක් සම්පූර්ණ කර ඇත.




02. ජනාධිපති කාර්යාලයේ ජාලකරණ පද්ධතිය පිළිබඳ සම්පූර්ණ වාර්තාගත කිරීම.

2016 වර්ෂයේ දී ජනාධිපති කාර්යාලයේ ආරම්භ කරන ලද “upgrading the infrastructure at the Presidential Secretariat”ව්‍යාපෘතිය මගින් මෙම කාර්යය නිම කිරීමට බලාපොරොත්තු වූ අතර ඉන් 2017 වර්ෂය සඳහා ඉතිරි වූ කොටසින් 50%ක් නිම කර ඇත.




03. මෘදුකාංග පද්ධති සහ වෙබ් සර්වර් (Web Server)යන්ත්‍ර සඳහා උපස්ථ පද්ධති ස්ථාපිත කිරීම.

මෙම කාර්යයෙන් 2017 වර්ෂය සඳහා ඉතිරි වූ කොටසින් 60%ක් නිම කර ඇත.



04. Cloud Based සර්වර් යන්ත්‍රයක් වාර්ටර්ඩ් බැංකු ගොඩනැගිල්ලේ පිහිටි සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ ස්ථාපිත කිරීම.

මෙම කාර්යය 2017 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී.

05. සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයටProxy සර්වර් යන්ත්‍රයක් ස්ථාපිත කිරීම.

2017 වර්ෂයේ දී මෙම කාර්යය නිම කර ඇත.

06. ජනාධිපති කාර්යාලයට අනුබද්ධිත සියලුම ස්ථානවල ජාලකරණ පද්ධතිය සම්පූර්ණ වාර්තාගත කිරීම.

ජනාධිපති කාර්යාලයේ සිදුකරනු ලබන “upgrading the infrastructure at the Presidential Secretariat”ව්‍යාපෘතිය මගින් මෙම කාර්යයෙන් 50% ක් සම්පූර්ණ කර ඇත.




07. Cloud Based File සර්වර් යන්ත්‍රයක් ජනාධිපති කාර්යාලයේ ස්ථාපිත කිරීම.

මෙම වර්ගයේ සර්වර් යන්ත්‍ර සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ සහ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය සඳහා ස්ථාපිත කර ඇත. දැනට මෙම අංශ විසින් උක්ත පහසුකම භාවිතා කරනු ලබයි.

08. ජනාධිපති කාර්යාලයේ නිල වෙබ් අඩවිය නවීකරණය කර එහි දත්ත යාවත්කාලීන කිරීම.

මෙම කාර්යයන්ගෙන් 50% ක් සම්පූර්ණ කර ඇත.




09. මහජන සම්බන්ධතා අංශයේ ඇති "ජනපතිට කියන්න" ව්‍යාපෘතිය යාවත්කාලීන කිරීම.

"ජනපතිට කියන්න" ව්‍යාපෘතියේ දුරකථන මගින් සිදු කරන විමසීම් පිළිබඳව වාර්තා ලබා ගැනීම සහ පද්ධතිය පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික සහය ලබා දීම.

10. ජනාධිපති කාර්යාලය සඳහා Intranet පද්ධතියක් ස්ථාපිත කිරීම.

මෙම කාර්යයෙන් 20% ක් සම්පූර්ණ කර ඇත.






09. මහජන සම්බන්ධතා අංශයේ ඇති "ජනපතිට කියන්න" ව්‍යාපෘතිය යාවත්කාලීන කිරීම.

"ජනපතිට කියන්න" ව්‍යාපෘතියේ දුරකථන මගින් සිදු කරන විමසීම් පිළිබඳව වාර්තා ලබා ගැනීම සහ පද්ධතිය පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික සහය ලබා දීම.

10. ජනාධිපති කාර්යාලය සඳහා Intranet පද්ධතියක් ස්ථාපිත කිරීම.

මෙම කාර්යයෙන් 20% ක් සම්පූර්ණ කර ඇත.



11. ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත ස්ථානවල නියුතු නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මඟින් ජනාධිපති කාර්යාලය හා ඊට අනුබද්ධිත ස්ථානවල නියුතු නිලධාරීන්ට පරිගණක ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලද අතර කාර්යාලයීය විද්‍යුත් තැපැල් ලිපිනයන් භාවිතය පිළිබඳව ද ඉදිරියේ දී පුහුණුව ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.

12. ජනාධිපති කාර්යාලයේ පැරණි හා නව ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම Wi-Fi කලාපයක් බවට පත් කිරීම.

මෙම කාර්යයෙන් 50% ක් සම්පූර්ණ කර ඇත.




13. ජනාධිපති කාර්යාලයේ ජාතික පෝෂණ ලේකම් කාර්යාලයේ පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම ස්ථාපිත කිරීම.

මෙම කාර්යයෙන් 90% ක් සම්පූර්ණ කර ඇත.



14. ජනාධිපති කාර්යාලය සඳහා ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

මෙම කාර්යයෙන් 90% ක් සම්පූර්ණ කර ඇත.



# මානව සම්පත් සංවර්ධන අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් /ස්ථාන මාරු /උසස් කිරීම් /විනය පාලනය සම්බන්ධ ආයතනික කටයුතු සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම.

## පොදු අරමුණු / කාර්යයන්

ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලය බඳවා ගැනීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම් හා විනය පාලනය සම්බන්ධ ආයතන කටයුතු

ජනාධිපති කාර්ය මණ්ඩලය සඳහා මු.රෙ. 71 යටතේ තනතුරු ඇති කිරීමට අදාළ කටයුතු

- ජනාධිපති කාර්යාලයේ සහ අනෙකුත් කාර්යමණ්ඩලයට බඳවා ගනු ලබන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගෙන යාම.
- ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ / සේවකයින්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලබාගැනීම සම්බන්ධ කටයුතු.
- අනුමත සේවක සංඛ්‍යා විස්තර සකස්කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ජනාධිපති කාර්යාලයේ සංවිධාන ව්‍යුහය පවත්වාගෙන යාම.
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති රාජ්‍ය සේවයේ ස්ථිර/ තාවකාලික නිලධාරීන්ගේ කාර්ය සාධන වාර්තා ඇගැයීම් කටයුතු.
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති නිලධාරීන් සඳහා දේශීය/විදේශීය පුහුණු හා සංවර්ධන කටයුතු සංවිධානය කිරීම.
- රජයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ ලබාදිය හැකි නිවාස, දේපළ ණය, ආපදා ණය ඇතුළු වෙනත් ණය මුදල් නිර්දේශ කිරීම / අනුමත කිරීම.
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු දුම්රිය බලපත්‍ර,අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාදීමට අදාළ කටයුතු.
- අග්‍රහාර රක්ෂණ වන්දි ලබාදීම නිර්දේශ කිරීම.
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල දීමනා, ගමන් වියදම් හා අනෙකුත් දීමනා අනුමත කිරීමට අදාළ කටයුතු.
- කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම.
- ගුවන්තොටුපල පර්යන්ත විශේෂ පහසුකම් ලබාගැනීමට හිමිකම් ලබන ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා එම පහසුකම් සැලසීම සම්බන්ධ කටයුතු.

- විදේශ රාජකාරි ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ වීසා බලපත්‍ර ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී සේවය සහතික කිරීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ විදේශ සංචාරවලදී සහභාගී වන ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ට විදේශ ගමන් සඳහා හිමි දීමනා සහ ඒ ආශ්‍රිත වියදම් ගෙවීම.
- තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රාජකාරී.
- පුස්තකාලයට අදාළ පරිපාලන කටයුතු.
- එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම සම්බන්ධ කටයුතු හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු.
- පැමිණීමේ හා පිටවීමේ සටහන් තබා ගැනීම සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර සම්බන්ධව අධීක්ෂණය.
- වන්‍රිය සේවයේ යොදවන නිලධාරීන්ගේ හා කනිෂ්ඨ සේවකයින්ගේ මාසික වන්‍රිය වැඩසටහන් පිළියෙල කිරීම.

## 2017 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

- බඳවා ගැනීම් අනුයුක්ත කිරීම්, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැනීම් හා විනය පියවර ගැනීම පිළිබඳ රාජකාරි අදාළ කාලය තුළ පත්වීම් හා අනුයුක්ත කිරීම් 208 ක්ද ස්ථානමාරු කිරීම් හා ආපසු මුදා හැරීම් 157 ක් හා අග්‍රහාර වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම් 111 ක්ද සිදු කර ඇත.

2017.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය

අනුමත කාර්ය මණ්ඩලය : 1497

## 2017.12.31 දිනට කාර්ය මණ්ඩලයේ ස්වභාවය

| ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | අනුයුක්ත | එකතුව |
|---|---|---|---|---|
| 691 | 172 | 70 | 106 | 1039 |




## දේශීය හා විදේශීය පුහුණු අවශ්‍යතා සැපයීම

**විදේශීය පුහුණු**

විදේශීය පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලැබ එම පාඨමාලා සඳහා 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 34 කි.

විදේශීය සම්මන්ත්‍රණ, සමුළු හා වැඩසටහන් වෙනුවෙන් අනුමැතිය ලැබ ඒ සඳහා 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 15 කි.

**දේශීය පුහුණු**

ජනාධිපති කාර්යාලයේ සෑම අංශයකම / ඒකකයකම සිටින ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන්ගේ/සේවකයන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් / වැඩමුළු පහත පරිදි පවත්වා ඇත.

| අනු. අංකය | 2017.01.01 සිට 2017.12.31 දක්වා පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන් | පුහුණුලාභීන් කණ්ඩායම | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | රාජකාරි හා සේවා ස්වභාවය පිළිබඳ දැනුවත් කිරීමේ සේවාරම්භක පුහුණු වැඩසටහන | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධාරීන් | 25 |
| 2. | නව තාක්ෂණයෙන් යුතු අඩු වියදම් පරිසර හිතකාමී සිමෙන්ති මිශ්‍රණ යොදා ගනිමින් නව ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම් සම්බන්ධ පුහුණු වැඩමුළුව | ඉංජිනේරු අංශයේ නිලධාරීන්, ජනාධිපති කාර්යාලයට සම්බන්ධ නාවික හමුදා නිලධාරීන් හා සෙසු නිලයන් | 50 |
| 3. | තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීමේ දේශනය | ජනාධිපති කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් | 100 |
| 4. | රියදුරන් සඳහා පවත්වන ලද සේවාරම්භක පුහුණුව | ජනාධිපති කාර්යාලය සඳහා බඳවා ගන්නා ලද නවක රියදුරන් | 25 |
| 5. | මහජන සම්බන්ධතා අංශය වෙත පැවරී ඇති කාර්යභාරය හා වගකීම පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සහ 2017 – 2020 සැලැස්ම සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කිරීම. | මහජන සම්බන්ධතා අංශයේ සියලුම නිලධාරීන් | 50 |
| 6. | වෘත්තීය දියුණුවට උපකාරී වන ආතති කළමනාකරණ ක්‍රමවේද සම්බන්ධ වැඩමුළුව | ද්විතීක මට්ටමේ හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන් සඳහා | 40 |
| 7. | ධනාත්මක චින්තනය පිළිබඳ දේශනය | මාධ්‍ය අංශයේ සියලුම නිලධාරීන් | 72 |
| 8. | ඵලදායිතාවය සම්බන්ධ දේශනය | ජනාධිපති පෞද්ගලික ලේකම් අංශයේ නිලධාරීන් | 48 |
| 9. | ජනාධිපති මාධ්‍ය අංශයේ නිලධාරීන්ට කැමරාකරණය හා වීඩියෝකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | මාධ්‍ය අංශයේ සියලු නිලධාරීන් | 70 |
| 10. | ඵලදායී රාජ්‍ය සේවයක් හා සාර්ථක පෞද්ගලික ජීවිතයක් උදෙසා ධනාත්මක චින්තනය | මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් සඳහා | 64 |
| 11. | ඵලදායී රාජ්‍ය සේවයක් හා සාර්ථක පෞද්ගලික ජීවිතයක් උදෙසා ධනාත්මක චින්තනය | ද්විතීක මට්ටමේ හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන් සඳහා | 250 |
| 12. | තුලනාත්මක පාලන ක්‍රම හා කාර්ය සාධක දර්ශක පිළිබඳ පුහුණු වැඩමුළුව | මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් සඳහා | 75 |
| 13. | නිරෝගිමත් දිගු ජීවිතයක් සඳහා යහපත් ආහාර පුරුදු - වැඩමුළුව | ද්විතීක මට්ටමේ හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන් සඳහා | 125 |

# ආයතන සම්බන්ධීකරණ ඒකකය

## හැඳින්වීම

ආයතන සම්බන්ධීකරණ ඒකකය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින ස්වාධීන කොමිෂන් සභා අමාත්‍යාංශ/ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා සහ ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ. එසේ සම්බන්ධීකරණය කරනු ලබන ආයතනවලට අමතරව කිසියම් අමාත්‍යාංශයක් යටතට ඇතුළත් නොවන දෙපාර්තමේන්තුවල ආයතන හා පරිපාලන කටයුතු මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.
මෙම අංශය විසින් 2017 වර්ෂය තුළ සිදුකරනු ලැබූ රාජකාරී කටයුතු එක් එක් ආයතනය සඳහා වෙන වෙනම ඇමුණුම් IV හි සංඛ්‍යාත්මකව දක්වා ඇත.

## ප්‍රධාන අරමුණු

- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයන්හි සම්බන්ධීකරණ කටයුතු නොපමාව සිදු කිරීම.
- 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභා වෙත පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා, කමිටු සහ කාර්යසාධක බලකායන්හි ප්‍රතිපත්තිමය, ආයතන හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන ලිපි සඳහා කඩිනමින් පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් ආයතනයන්හි ආයතනික, පරිපාලන හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයිය යුතු සියලුම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා අදාළ අමාත්‍යාංශ, ආයතන හා අංශ සම්බන්ධීකරණය කොට පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශවල (අතිගරු ජනාධිපතිතුමන් විසින් කරනු ලැබූ පත්කිරීම් හැර) හා අමාත්‍යාංශයන් යටතට නොගැනෙන ස්වාධීන ආයතනවල විදේශ නිවාඩු හා දිවයිනෙන් බැහැර යාමට අදාළ කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම.
- සුවිශේෂ තැනැත්තන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර නිකුත් කිරීම හා ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානයට අදාළ කටයුතු.

**2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්**

| **ආයතනය** | **ඉටු කරන ලද කාර්යභාරය** | **ප්‍රගතිය** |
|---|---|---|
| **අතිගරු ජනාධිපතිතුමා අමාත්‍ය ධුරය හොබවනු ලබන අමාත්‍යාංශවල අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.** | | |
| ආරක්ෂක අමාත්‍යාංශය | අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම හා විවිධ | 20 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම හා විවිධ | 15 |
| ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | විවිධ | 02 |
| **19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ස්වාධීන කොමිෂන් සභාවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.** | | |
| මැතිවරණ කොමිෂන් සභාව | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 21 |
| | ආයතන කටයුතු | 09 |
| | විවිධ | 15 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 05 |
| | විවිධ ඉල්ලීම් | 04 |
| ජාතික පොලිස් කොමිෂන් සභාව | 2014, 2015 හා 2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | |
| | විවිධ ඉල්ලීම් | 06 |
| විගණන සේවා කොමිෂන් සභාව | ආයතන කටයුතු | 02 |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ආයතන කටයුතු | 16 |
| | මහජන පැමිණිලි | 05 |
| | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 16 |
| | ගොඩනැගිල්ලක් මිලදී ගැනීම | 04 |
| | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීම | 24 |
| | විවිධ | 13 |
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 19 |
| | විවිධ | 17 |
| මුදල් කොමිෂන් සභාව | ආයතන කටයුතු | 13 |
| | කාර්යාල සංකීර්ණය ඉදිකිරීම | 02 |
| | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 08 |
| | විවිධ | 08 |
| | 2015 හා 2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | |

| **ආයතනය** | **ඉටු කරන ලද කාර්යභාරය** | **ප්‍රගතිය** |
|---|---|---|
| සීමා නිර්ණය කොමිෂන් සභාව | ආයතන කටයුතු | 06 |
| | විවිධ | 06 |
| ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ආයතන කටයුතු | 08 |
| **අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබ ඇති පරීක්ෂණ කොමිෂන් සභා, ජනාධිපති කාර්ය සාධක බලකායන් සහ ආයතනවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.** | | |
| අමාත්‍ය මණ්ඩල කාර්යාලය | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 07 |
| විගණකාධිපති දෙපාර්තමේන්තුව | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 143 |
| | ආයතන කටයුතු | 23 |
| අධිකරණ සේවා කොමිෂන් සභාව | ආයතන කටයුතු | 03 |
| | වාර්ෂික වාර්තා | 06 |
| ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය | විවිධ | 06 |
| ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | ආයතන කටයුතු | 20 |
| | විවිධ | 11 |
| | සහනදායී පදනම මත වාහන බලපත්‍ර ලබාදීම | 04 |
| ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව | ආයතන කටයුතු | 04 |
| | විදේශ නිවාඩු | 02 |
| තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | ආයතන කටයුතු | 93 |
| බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව. | බිල්පත් පියවීම | 117 |
| | ආයතන කටයුතු | 25 |
| | විවිධ කටයුතු | 08 |
| රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය | ආයතන කටයුතු | 49 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 85 |
| | වීසා ලබාදීම් හා අනුමත කිරීම් | 100 |
| | ආයතන කටයුතු | 64 |
| | විවිධ කටයුතු | 70 |
| ශ්‍රී ලංකා පදනම | විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු | 28 |
| | ආයතන කටයුතු | 18 |

| **ආයතනය** | **ඉටු කරන ලද කාර්යභාරය** | **ප්‍රගතිය** |
|---|---|---|
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය | ආයතන කටයුතු | 14 |
| | වාර්ෂික වාර්තා | 03 |
| එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම, | ආයතන කටයුතු | 11 |
| | විවිධ ඉල්ලීම් | 04 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | ආයතන කටයුතු | 10 |
| | ක්‍රියාත්මක නොවූ නිර්දේශ | 08 |
| ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය | ආයතන කටයුතු | 22 |
| නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල | නඩත්තු කටයුතු | 155 |
| | විදුලි බිල් නිරවුල් කිරීම් | 22 |
| | ජල බිල්පත් නිරවුල් කිරීම් | 26 |
| | දුරකථන හා අන්තර්ජාල නිරවුල් කිරීම් | 13 |
| | පුවත්පත් බිල් නිරවුල් කිරීම | 12 |
| | මධ්‍යස්ථානය වෙන් කර ගැනීම | 36 |
| | පවිත්‍රතා කටයුතු සම්බන්ධ ලිපි | 16 |
| | ප්‍රසම්පාදන කමිටු පත් කිරීම | 48 |
| | සුළු මුදල් අග්‍රිමය | 45 |
| | විවිධ කටයුතු | 142 |
| | කාර්ය මණ්ඩලය සම්බන්ධ ගැටලු | 20 |
| | ගොඩනැගිලි කටයුතු | 07 |
| නෙළුම් කුළුණ | විවිධ කටයුතු | 11 |
| භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවන් පිළිබඳ පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව | ආයතන කටයුතු | 61 |
| | විවිධ කටයුතු | 03 |
| සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමේ ජනාධිපති කමිටුව | ආයතන කටයුතු | 07 |
| | විවිධ කටයුතු | 14 |
| 2017 අප්‍රේල් මස 14 වන දින මීතොටමුල්ල ප්‍රදේශයේ කුණු කන්ද කඩාවැටීම නිසා සිදුවූ හානිය පිළිබඳව සොයා බැලීමේ කමිටුව | ආයතන කටයුතු | 38 |
| | විවිධ කටයුතු | 21 |

| **ආයතනය** | **ඉටු කරන ලද කාර්යභාරය** | **ප්‍රගතිය** |
|---|---|---|
| උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය | ආයතන කටයුතු | 09 |
| ජොෂ්ඨ අමාත්‍ය කාර්යාලය | ආයතන කටයුතු | 11 |
| Indian Ocean Marine Affairs Co-Operation ආයතනය | ආයතන කටයුතු | 29 |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | ආයතන කටයුතු | 18 |
| | විවිධ කටයුතු | 10 |
| විවිධ කටයුතු | | |
| පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | | 14 |
| පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධ විවිධ කටයුතු | | 10 |
| රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර ලබාදීම | | 05 |
| ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිලධාරීන්ගේ විදේශ නිවාඩු | | 01 |

# මූල්‍ය කළමනාකරණ අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්යාලයට අදාළ සියලුම මූල්‍ය කළමනාකරණ කටයුතු ඉටු කිරීම .

## පොදු අරමුණු

- ස්ථිර, තාවකාලික, අනියම්, කොන්ත්‍රාත් හා අනුයුක්ත නිලධාරීන්ගේ මාසික වැටුප්, දීමනා හා පාරිශ්‍රමික ගෙවීම
- නිලධාරීන්ගේ අතිකාල දීමනා හා ගමන් වියදම් දීමනා ගෙවීම
- ජනාධිපති කාර්යාලය වෙනුවෙන් වූ සේවා සහ සැපයීම් වලට අදාළ ගෙවීම් කිරීම
- මාසික ගිණුම් සාරාංශ හා බැංකු සැසඳුම් පිළියෙළ කිරීම හා මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙළ කිරීම හා මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය පිළියෙළ කිරීම හා මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- අයවැය කාරක සභා අවස්ථාවට අදාළ කටයුතු
- කාර්යාලයීය ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමග සැසඳීම
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම

| විස්තරය | පුනරාවර්තන | මූලධන |
|---|---|---|
| මුළු ප්‍රතිපාදනය | 3,642 | 6,659 |
| මුළු වියදම | 3,240 | 4,677 |



**2015 , 2016 හා 2017 වර්ෂවල මුළු වියදම සැසඳීම**

රු.මි.

| වර්ෂය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| පුනරාවර්තන | 2,116 | 2,081 | 3,240 |
| මූලධන | 1,191 | 4,779 | 4,677 |



# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය

## හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මගින් අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කළ යුතු බවට සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම.

## ප්‍රධාන අරමුණ

ඉහත කී බලතල හා වගකීම් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුකූලව කාර්යක්ෂමව හා අනලස්ව ඉටු කිරීම.

### 2017 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම

| I. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලබන විවිධ තනතුරු සඳහා පත්කිරීම්** | |
|---|---|
| • අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන් | 01 |
| • රාජ්‍ය අමාත්‍යවරුන් | 04 |
| • පළාත් ආණ්ඩුකාරවරුන් | 01 |
| • ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් | 01 |
| • අභියාචනාධිකරණ විනිසුරුවරුන් | 03 |
| • මහාධිකරණ විනිසුරුවරුන් | 06 |
| • අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් | 01 |
| • ජනාධිපති නීතිඥවරුන් | 29 |
| • රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් | 02 |
| • රාජ්‍යසේවා කොමිෂන් සභා සාමාජිකයන් (පුරප්පාඩු වූ සාමාජික ධුරයන් සඳහා ) | 01 |
| • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා සාමාජිකයන් (පුරප්පාඩු වූ සාමාජික ධුරයන් සඳහා ) | 01 |
| • අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| • අමාත්‍යාංශ ලේකම්වරුන් | |
| විශ්‍රාම යාමෙන් ඇති වූ පුරප්පාඩු සඳහා | 12 |
| ස්ථාන මාරු කිරීම් හේතුවෙන් කරන ලද පත් කිරීම් | 22 |
| • පළාත් ප්‍රධාන ලේකම්වරුන් | 03 |
| • ලබා දී ඇති මරණීය දණ්ඩනය ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් බවට පරිවර්තනය කිරීම | 60 |

| | |
|---|---|
| වෙසක් උත්සවය වෙනුවෙන් ජනාධිපති සමාව ලබාදීම | ලබා දී ඇත |
| ජනාධිපතිතුමාගේ 02 වැනි පදවි ප්‍රාප්තිය නිමිතිකොට ජනාධිපති සමාව ලබාදීම | ලබා දී ඇත |
| • සන්නද්ධ හමුදා ප්‍රධානීන් | |
| ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී | 02 |
| යුද හමුදාපති | 01 |
| නාවික හමුදාපති | 02 |
| • විශ්වවිද්‍යාල කුලපතිවරුන් | 05 |
| • විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් | 09 |
| • ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් | 01 |
| • ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සාමාජිකයන් | 14 |
| • සහකාර පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර් | 01 |
| • බාලදක්ෂ විශේෂ කොමසාරිස්වරුන් | 01 |
| • බාලදක්ෂ දිස්ත්‍රික් කොමසාරිස්වරුන් | 05 |
| • ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සාමාජිකයන් | 03 |
| • වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයන් | 16 |
| • ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික සභාවේ සාමාජිකයන් | 01 |
| • සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමේ කමිටුවේ සාමාජිකයන් | 04 |
| • ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවට සාමිජිකයන් පත් කිරීම් | 06 |
| • ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම් | 05 |
| • පළාත් සභා මැතිවරණ සීමා නිර්ණය කමිටුව පත් කිරීම | 05 |
| • ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පත් කිරීම | 01 |
| • බුද්ධ ශාසන අරමුදලේ උපදේශක කමිටුවට සාමාජිකයන් පත් කිරීම් | 05 |
| • තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම | 11 |
| • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම් | 01 |

| | |
|---|---|
| II. **ඉඩම් ඔප්පු, දීර්ඝ කාලීන බදුකර** | |
| • දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීම | 169 |
| • සංවර්ධනය කළ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම | 373 |
| • රණවිරු ඔප්පු නිකුත් කිරීම | 13 |
| • සුනාමි දීමනාපත්‍ර නිකුත් කිරීම | 607 |
| • විහාරස්ථාන සඳහා දීමනාපත්‍ර | 13 |
| • ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉඩම් ලබාදීම | 02 |
| • නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම | 09 |
| • නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම | 16 |
| • විකල්ප ඉඩම් ලබාදීම | 18 |
| • මහවැලි බදුකර | 45 |
| • මහවැලි දීමනාපත්‍ර ලබාදීම (සංවර්ධනය කළ ඉඩම් සඳහා) | 80 |
| • මහවැලි දීමනාපත්‍ර ලබාදීම (ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ) | 7822 |
| • මහවැලි විහාරස්ථාන | 32 |
| • නව රන්බිම දීමනාපත්‍ර | 7437 |
| • රජයේ ඉඩම් ආඥා පනතේ 3 වගන්තියෙන් අවලංගු කිරීම | 76 |
| රජයේ ඉඩම් ආඥා පනතේ 4(1) වගන්තියෙන් අවලංගු කර,<br><br>4(3) වගන්තියෙන් නව දීමනාපත්‍ර ලබාදීම | 1102 |
| • රජයේ ඉඩම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ රජයට භාරගෙන ඇති දීමනාපත්‍ර වෙනුවෙන් නව දීමනාපත්‍ර සැකසීම | 95 |
| • මධ්‍යම පාන්තික ඉඩම් | 26 |
| • රජයේ ඉඩම් ආඥා පනතේ 104 වගන්තියෙන් අවලංගු කිරීම | 28 |
| III. **ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල** | |
| • ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල රැස්වීම් | 90 |
| IV. **සන්නද්ධ හමුදා සාමාජිකයන්ට වීර පදක්කම් ප්‍රදානය කිරීම** | 5330 |
| V. **ත්‍රිවිධ හමුදා අධිකාරීපත්‍ර ප්‍රදානය කිරීම** | 511 |
| VI. **ADC කැඳවීම** | 29 |

| | |
|---|---|
| VII.අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන මහජන නියෝජිතයින්ගේ සහ නිලධාරීන්ගේ විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබාදීම | 807 |
| VIII.පනත් කෙටුම්පත් පිළිබඳ පළාත් සභාවේ මතය විමසීම | 02 |
| IX. අමාත්‍ය මණ්ඩල සටහන්, පත්‍රිකා සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම | |
| අමාත්‍ය මණ්ඩල සටහන් | 05 |
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා | 02 |
| X. 1979 අංක 61 දරණ අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම් (ඛනිජ තෙල් / දුම්රිය සේවා ) | 02 |
| XI. (40 වැනි අධිකාරිය වූ ) මහජන ආරක්ෂක ආඥා පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම් (කසළ බැහැර කිරීම) | 01 |
| XII.විෂයයන් හා කාර්යයන් සංශෝධනපත්‍ර | 07 |



6 - CM 26894

# ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය

## හැඳින්වීම

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන මෙන්ම දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ පරිපාලන ඒකකයන් සමඟ සම්බන්ධීකරණය කරමින් සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය සහ පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මෙම අංශය වගකීම් දරනු ලබයි .

## ප්‍රධාන අරමුණු

- ප්‍රතිපත්ති සම්පාදනය පහසුකරණය හා සම්බන්ධීකරණය කිරීම,
- දිස්ත්‍රික් සංවර්ධන කටයුතු "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" අනුව සිදුවන්නේ දැයි තහවුරු කිරීම,
- "දියුණු හා වගකීම් සහගත රාජ්‍ය අංශයක්" "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව අන්තර් අමාත්‍යාංශ හා සම්බන්ධීකරණය,
- සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචන කටයුතු,
- සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටලු සහ සමාජ අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයන් කිරීම,
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේශනය කිරීම හා අවශ්‍යතාවය පරිදි වාර්තා සැපයීම,
- පෝෂණ වැඩසටහන සම්බන්ධ සියලු පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට සහයවීම, මෙහි ප්‍රධාන අරමුණ වනුයේ වයස අවු: 5ට අඩු දරුවන් අතර මිටිබව සහ බර අඩුතාවය 40% කින් අවම කිරීම සහ කෘෂවීම 5% කට අඩු සංඛ්‍යාවක් දක්වා අවම කිරීම මෙන්ම අධිබර දරුවන්ගේ ප්‍රතිශතය තවදුරටත් වර්ධනය නොවීම සඳහා කටයුතු කිරීම. අඩුබර දරු උපත් හා කාන්තාවන් අතර අඩුබර හා අධිබර පවතින මට්ටම්වලින් 30% දක්වා අඩුකර ගැනීම. නිරක්තය පවතින මට්ටමෙන් 50% කින් අඩුකිරීම.

**2017 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමාගේ සහ ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද රැස්වීම්.**

2017 වර්ෂයේදී ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශය මගින් සංවිධානය කරන ලද රැස්වීම් සහ වැඩසටහන් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| කාරණය | රැස්වීම්/ක්‍රියාකාරකම් |
|---|---|
| අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් | 36 |
| ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් | 64 |
| ජනාධිපති අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් | 13 |
| ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් | 01 |
| වෙනත් | 01 |
| එකතුව | 115 |

**අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය**

**01. පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් වෘත්තීය පුහුණුව සඳහා යොමුකිරීම- 2017.01.05**

ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම සාකච්ඡාවේදී, පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් වෘත්තීය පුහුණුව සඳහා ජාතික සැලැස්මක් සකස් කිරීමටත්, ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමටත් අදාළ පාර්ශවයන් වෙත උපදෙස් දෙන ලදී.

**02. පුරාවිද්‍යා ස්ථාන හා පුරාවස්තු සංරක්ෂණය පිළිබඳ විශේෂ සාකච්ඡාව - 2017.01.24**

අතිගරු ජනාධිපතිතුමා මෙහිදී දිවයිනෙහි පිහිටි පුරාවිද්‍යා ස්ථාන හා පුරාවස්තු සංරක්ෂණය පිළිබඳව අදාළ පාර්ශව වෙත විශේෂ උපදෙස් ලබා දුන් අතර, මෙම අංශය විසින් වසර පුරා මේ පිළිබඳ වරින් වර පසුවිපරම් කටයුතුද සිදු කරන ලදි.



**03. උතුර හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීම පිළිබඳ ප්‍රගති සමාලෝචනය - 2017.02.17 දින හා 2017.08.15**

උතුර හා නැගෙනහිර පළාතේ යුදගැටුම් නිසා විපතට පත්වූ ජනතාව නැවත පදිංචිකිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ගේ විශේෂ අවධානය යොමුව ඇත. ඒ අනුව යාපනය හා වවුනියාව දිස්ත්‍රික්කයන්හි පවතින සුබසාධන මධ්‍යස්ථානවල ජනතාව නැවත පදිංචිකිරීම කඩිනම් කිරීම ප්‍රධාන ඉලක්කයන් ලෙස සලකා ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ මෙහෙයවීම ජනාධිපති කාර්යාලය විසින් සිදුකරන ලදි. මෙහි ප්‍රගතිය මාසිකව ජනාධිපති ලේකම් වෙත වාර්තා කරන අතර, කාර්තුමය වශයෙන් අදාළ නිලධාරීන් කැඳවා රැස්වීම් පවත්වනු ලැබේ.

**04. අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ සහල්වල මිල ඉහළ යාම පිළිබඳ කරන ලද සාකච්ඡාව** -2017.02.13

වෙළඳපොලෙහි අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ සහල්වල මිල ඉහළ යාම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා වාර 04 ක් පමණ පවත්වන ලදි.

එහිදී සහල් මිල සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ වල මිල පාලනය කිරීම සහ සහල් ආනයනය කිරීම පිළිබඳව උපදෙස් ලබා දුන් අතර , අදාළ රැස්වීම් පැවැත්වීම සහ සම්බන්ධීකරණය මෙන්ම, ඒ පිළිබඳ වර්ෂය පුරා වරින් වර පසුවිපරම් කිරීමද මෙම අංශය විසින් සිදුකරන ලදි.



### 05. Little Hearts ව්‍යාපෘතිය- 2017.02.28

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම සාකච්ඡාවේදී, Little Hearts ව්‍යාපෘතිය යටතේ, බොරැල්ල, රිජ්වේ ආර්යා ළමා රෝහලේ ප්‍රතිකාර ලබන හෘද රෝගී දරුවන් සඳහා ආරම්භ කිරීමට යෝජිත නව දැඩි සත්කාර ඒකකය ඉදිකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලදී.

### 06. කෘෂි භෝගවල මිල ස්ථාවරව පවත්වා ගැනීම පිළිබඳ සාකච්ඡාව - 2017.03.02

කෘෂි අංශයට අදාළව කාලීන භෝගවල අස්වැන්න නෙළන කාලයන්හීදී මිල ස්ථාවරව පවත්වාගැනීම පිළිබඳව ජනාධිපති ලේකම් විසින් පත්කරන ලද තාක්ෂණික කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මෙම සාකච්ඡාව පවත්වන ලදි.

### 07. ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සොයාගනු ලැබූ/ එල්ටීටීඊ භාරයේ තිබී අත්අඩංගුවට ගන්නා ලද රත්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත භාරදීම.

ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සොයාගනු ලැබූ/ එල් ටී ටී ඊ භාරයේ තිබී අත්අඩංගුවට ගන්නා ලද රත්‍රන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත භාරදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මෙම සාකච්ඡා පවත්වන ලදී. අදාළ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා සාකච්ඡාවට සහභාගී වූ නිලධාරීන්ගෙන් සැදුම්ලත් අධීක්ෂණ මණ්ඩලයක් පත්කරන ලදී. මෙම සාකච්ඡාවේදී ගන්නා ලද තීරණ අනුව මේ වන විට ආරක්ෂක අමාත්‍යාංශය අදාළ පියවර ගෙන ඇති අතර, එහි පසුවිපරම් රැස්වීම්ද ජනාධිපති කාර්යාලය විසින් පවත්වා ඇත.

### 08. ආගමන විගමන නිලධාරීන්ගේ වෘත්තීය ගැටලු පිළිබඳ සාකච්ඡාව -2017.05.16

වර්ෂ ගණනාවක් පුරා ආගමන විගමන නිලධාරීන් විසින් මුහුණ දුන් සිය වෘත්තීයමය ගැටලු අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ අතර, ඒ අනුව හඳුනාගත් වෘත්තීයමය කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදි.



**09. මහනුවර දළදා පරිශ්‍රය ආශ්‍රිත ඓතිහාසික දේවාලයන්හි ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම-2017.06.14**

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහනුවර දළදා පරිශ්‍රය ආශ්‍රිත ඓතිහාසික දේවාලයන්හි ක්‍රියාකාරිත්වය සම්බන්ධ සාකච්ඡාවක් පැවැත්විණි. එහිදී පෙරහැර සඳහා අලි ඇතුන් අවශ්‍යා ප්‍රමාණය, බස්නායක නිලමේවරුන්ට ආරක්ෂාව ලබා දීම, නාථ දේවාලයට අයත් ඉඩම් පිළිබඳ, ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මුදල් ලබා දීම වැනි කරුණු පිළිබඳව සාකච්ඡා විය.

**10. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ අධි සේවක පදනමින් පත්කරන ලද නිලධාරීන්ගේ වෘත්තීයමය හා රාජකාරිමය ගැටලු පිළිබඳ විශේෂ සාකච්ඡාව- 2017.02.20**

සංවර්ධන නිලධාරී සේවයේ සිට, අධිසේවක පදනම මත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණිය සඳහා 2009.06.22 දිනැතිව අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් 268 දෙනාගේ වෘත්තීයමය ගැටලු පිළිබඳ සාකච්ඡාව ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම නිලධාරීන් සියලු දෙනාගේ තොරතුරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබාදීමටත්, ඉන් අනතුරුව එම අමාත්‍යාංශය විසින් අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීමටත් උපදෙස් දෙන ලදී.

**11. උතුරු පළාත් ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයින්ගේ සේවය ස්ථිර කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාව - 2017.07.26**

ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මෙම සාකච්ඡාවේදී, උතුරු පළාතේ ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයින්ගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධව පවතින නෛතික විධිවිධාන යටතේ ගත හැකි ඉදිරි පියවර ගැනීමට අදාළ ආයතන වෙත උපදෙස් ලබා දෙන ලදි.

**12. කතෝලික කටයුතු පිළිබඳ කමිටු රැස්වීම - 2017.07.28**

ආගමික සහයෝගීතාවය ඉහළ නැංවීම සඳහා කතෝලික ආගම සම්බන්ධව අධ්‍යාපන ක්ෂේත්‍රය සහ කතෝලික සිද්ධස්ථාන ආශ්‍රිත ඉඩම් ආදී කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත්කරන ලදි. එම කමිටුව කැඳවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

**13. දේශීය උළු නිපදවන්නන්ගේ සහ සම්භාණ්ඩ නිපදවන්නන්ගේ සංගම් සමඟ පැවති රැස්වීම- 2017.09.11**

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් දේශීය උළු නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ සහ දේශීය පාවහන් නිෂ්පාදකයින්ගේ සංගමයේ නියෝජිතයින් සමඟ ඔවුන් මුහුණ පා ඇති වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි. මෙහිදී එම කර්මාන්තකරුවන්ගේ උන්නතිය උදෙසා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි.

**14. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රගති සමාලෝචන රැස්වීම 2017.09.13**

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රගති සමාලෝචන රැස්වීම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී පැවැත්වූ අතර එහිදී අතිගරු ජනාධිපතිතුමා විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරන ලදි.



**15. බද්දේගම නගර සංවර්ධන - 2017.09.28**

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බද්දේගම නගර සංවර්ධන සැලැස්ම සම්බන්ධ කටයුතු පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විණි. එහිදී නගරය තුළ ඉදිරියේදී සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු, විකල්ප මාර්ග ඉදිකිරීම, බස්නැවතුම්පල ඉදිකිරීම, ශාන්ත අන්තෝනි විද්‍යාලයේ රැස්වීම් ශාලාව ඉදිකිරීම, ගාල්ල බද්දේගම සංවර්ධනය හා වෙනත් සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා විය.

**16. වැම්පිට විහාර සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව - 2017.10.13**

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම සාකච්ඡාව පවත්වන ලද අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සංකථන පර්යේෂණ කේන්ද්‍රය විසින් සිදුකරන ලද පර්යේෂණ වාර්තාවක් පිළිබඳ මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කරන ලදි. ඉදිරිපත් වූ යෝජනා සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමැතිය ලබාදුන් අතර, දිවයින පුරා පිහිටි වැම්පිට විහාරස්ථාන සංරක්ෂණය සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ග කඩිනමින් සිදුකරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. මේ පිළිබඳ පසුවිපරම් කටයුතු අඛණ්ඩව මෙම අංශය විසින් සිදුකරමින් පවතී.



**17. නිල කාලය අවසන් වූ පළාත් සභාවන්හි ඉදිරි කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ සාකච්ඡාව - 2017.10.16**

විසුරුවන ලද පළාත් සභාවන්හි (උතුරුමැද/සබරගමුව/නැගෙනහිර පළාත් සභාවන්හි) ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුතුව මෙම සාකච්ඡාව පවත්වන ලදී.



**18. සමෘද්ධි නිලධාරීන්ගේ වෘත්තීයමය ගැටලු පිළිබඳ සාකච්ඡාව - 2017.11.01**

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මෙම සාකච්ඡාවේදී සමෘද්ධි නිලධාරීන්ගේ ගැටලු සඳහා විසඳුම් ලබා දීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් උපදෙස් ලබා දෙන ලදි.



### 19. ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා දේශීය මැණික් සම්පත සුරක්ෂිත කිරීම (2017.11.01/2017.12.13)

විදේශීය බහුජාතික සමාගම්වලින් සිදු කර ඇති බලපෑම්, ඇතැම් යල්පැන ගිය නීති රීති, මැණික් හා පතල් කර්මාන්තය ආශ්‍රිත සේවක හිඟය වැනි තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයට සිදු වී ඇති අහිතකර බලපෑම් අවම කර ගැනීම උදෙසා අතිගරු ජනාධිපතිතුමා සිය විශේෂ අවධානය යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් 2017.12.13 දින සහ 2017.11.01 දින රැස්වීම් පවත්වන ලදි. එකී රැස්වීම්, ප්‍රතිපත්ති, සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය විසින් සංවිධානය කරනු ලැබීය.

### 20. පෙට්‍රල් හිඟය පිළිබඳව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාව 2017.12.11

රටේ පැවති පෙට්‍රල් හිඟයට හේතු වූ කරුණු සහ තත්ත්වය සමනය කිරීම සඳහා ගතහැකි පියවර පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ පිළිබඳව අදාළ සියලු පාර්ශ්ව සමඟ අතිගරු ජනාධිපතිතුමන් විසින් සාකච්ඡාවක් පවත්වන ලදි.

### 21. ග්‍රාම නිලධාරීන්ගේ වෘත්තීය ගැටලු පිළිබඳ සාකච්ඡාව - 2017.12.15

ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති විසින් ඉදිරිපත් කර තිබූ තම සේවාවට අදාළ වෘත්තීය ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙම සාකච්ඡාව පවත්වන ලදී. එම ගැටලු අධ්‍යයනය කර ඒවා විසඳීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා, ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත්කරන ලදී. එම කමිටුවේ නිර්දේශ 2018 මාර්තු මස අතිගරු ජනාධිපතිතුමන් වෙත ලබාදීමට නියමිතය.

### 22. උතුරු නැගෙනහිර පළාත්වල කැලෑ ඉඩම් එළිපෙහෙළි කිරීම - ජාතික කමිටු රැස්වීම -2017.12.27

උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුධමය වාතාවරණය පහව යෑමත් සමග, වගා කටයුතු හා වෙනත් කාර්යයන් සඳහා එකී ප්‍රදේශවල පවතින කැලෑ ඉඩම් සීඝ්‍ර ලෙස එළිපෙහෙළි කිරීම හේතුවෙන් මතුවූ පාරිසරික බලපෑම් අවම කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ජාතික කමිටුවක් පත් කළ අතර, එකී ජාතික කමිටුවේ දෙවන රැස්වීම 2017.05.18 වන දින ද, තෙවන රැස්වීම 2017.12.27 දින ද පැවැත්විණි. මෙහි දී එම පළාත්වල දිස්ත්‍රික් තාක්ෂණික කමිටු විසින් ජාතික කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ එක් එක් දිස්ත්‍රික්කයන්ට අදාළව යොමුකරන ලද ඉඩම් නිදහස් කිරීම පිළිබඳ නිර්දේශ ලබා දෙන ලදී. මෙම රැස්වීම් ප්‍රතිපත්ති, සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය සංවිධානය කරනු ලැබීය.

### 23. ප්‍රාදේශීය මාධ්‍ය වේදීන් මුහුණ දී සිටින වෘත්තීය ගැටලු පිළිබඳ සාකච්ඡාව - 2017.12.27

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මුහුණ දී සිටින වෘත්තීය ගැටලු පිළිබඳ සාකච්ඡාවක් අමාත්‍යවරුන්, රාජ්‍ය නිලධාරින් ඇතුළු මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වයෙන් පැවැති අතර, මෙහිදි අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට තීරණය විය.



**24. ඩෙංගු මර්දනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය**

පසුගිය වසර කිහිපය පුරාම කාලීනව ඩෙංගු රෝගය වැඩි වීමක් දක්නට ලැබුණු අතර, 2017 වසරේදී එහි තීව්‍ර අවස්ථාව විය. ඒ අනුව පැවති වසංගත තත්ත්වය නිසා දිවයිනේ ජනතාවගේ සෞඛ්‍යයට සිදුවූ අහිතකර තත්ත්වය අවම කිරීමට අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි කඩිනමින් මැදිහත්වීම ඩෙංගු මර්දනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් සිදුකරන ලදි.




සියලු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, ඇතුළු රාජ්‍ය, පුද්ගලික හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය හා මෙහෙයවීමටත්, ජාතික ඩෙංගු මර්දන ඒකකයේ තාක්ෂණික දායකත්වයෙන් ඩෙංගු මර්දනය වළක්වාලීම සහ පාලනය සඳහා කඩිනම් අන්තර්පාර්ශ්වීය වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2017.05.16 වන දින ඩෙංගු මර්දනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය පැවති අතර එම රැස්වීමේ ගනු ලැබූ තීරණ පිළිබඳ සතිපතා සහ මාසිකව ජනාධිපති ලේකම් විසින් ප්‍රගතිය සමාලෝචනය කරන ලදි. 2017 වසර තුළ එවැනි රැස්වීම් වාර 18 ක් පවත්වා ඇත.



## 25. ආපදා කළමනාකරණ කාර්ය සාධන බලකාය

ව්‍යසන කළමනාකරණ ජාතික සභාවේ ප්‍රධානත්වය අතිගරු ජනාධිපතිතුමා විසින් හොබවන අතර, ආපදාවන්ගෙන් තොර සුරක්ෂිත ශ්‍රී ලංකාව යන දැක්මෙන් යුතුව ශ්‍රී ලංකාවේ වැසියන්, දේපළ හා පරිසරය ආපදාවන්ගෙන් ආරක්ෂා කිරීම එහි අරමුණ වේ. මේ යටතේ කාලීන වශයෙන් දිවයින මුහුණ දෙන විවිධ ආපදා තත්ත්වයන් මනා ලෙස කළමනාකරණය , අවම කිරීම සහ පූර්ව සූදානම් කිරීම විධිමත් කිරීම උදෙසා සියලු අංශයන් සාමූහිකව කටයුතු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන, පුද්ගලික මෙන්ම ජාත්‍යන්තර සහයෝගීත්වය හා අන්තර් සම්බන්ධතාව පැවතීමද අත්‍යවශ්‍ය කරුණකි.

මේ අනුව 2017 වසර තුළ මුහුණ පෑ විවිධ ආපදාවන්හිදී අවශ්‍ය මැදිහත්වීම ව්‍යසන කළමනාකරණ ජාතික සභාව මඟින් අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකර ඇත.

මේ යටතේ නියඟය හා වියළි කාලගුණික තත්ත්වය නිසා පීඩාවට පත් ජනතාවට සහන සැලසීම, ගංවතුර හා නායයෑම් විපතට පත් ජනතාව යළි නගා සිටුවීම, කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදුවූ නායයෑම නිසා සිදුවූ ආපදාව මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීම නිසා සිදුවූ හදිසි තත්ත්වයන් කළමනාකරණය යන ආපදා තත්ත්වයන් සඳහා මැදිහත් වීම් සිදුකර ඇත.

මේ යටතේ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් වාර 08ක් පවත්වා ඇති අතර, එම සාකච්ඡාවන්හීදී ගනු ලබන තීරණයන් ක්‍රියාත්මක වීම පිළිබඳ ජනාධිපති ලේකම් විසින් වරින්වර අදාළ නිලධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් 05 ක් 2017 වර්ෂයේ පවත්වා ඇත.



**ආපදා කළමනාකරණයේ සුවිශේෂී අවස්ථා.**

01. පානීය ජලය බෙදාහැරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ලොරි හා ට්‍රැක්ටර් බවුසර බෙදාහැරීම. (මේ සඳහා ඉන්දීය ජනරජයේ ප්‍රදානයන් සහ ශ්‍රී ලංකාවේ අරමුදල් යොදාගන්නා ලදි.) 2017.03.21

02. අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත, විදේශ රටවලින් මෙරටට සහල් තොග ප්‍රදානයන් ලෙස ලබාගැනීමට හැකිවිය. (පකිස්ථානය, චීනය, ඉන්දුනීසියාව, ආදී රටවල්)




**අතිගරු ජනාධිපතිතුමන් විසින් පිහිටුවා ඇති විශේෂ කමිටු සම්බන්ධීකරණය**

### 01. සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා සභාපතිවරුන් පත්කිරීම

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති, නිර්ණායක මත පදනම්ව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා සභාපතිවරුන් පත්කිරීම පිළිබඳව නිර්දේශ අදාළ කමිටුව හරහා අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

### 02. උතුර හා නැගෙනහිර පළාත්වල සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් නිදහස් කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමේ කමිටුව - 2017.10.03

උතුරු නැගෙනහිර පළාත්වල පසුගිය දශක කිහිපය තුළ පැවති අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වය මත එම පළාත්වල අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම, පුනරුත්ථාපනය සහ ආර්ථික යටිතල පහසුකම් සඳහා අවශ්‍ය රජයේ ඉඩම් නිදහස් කිරීම, වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, ගැසට් කිරීම හා එමඟින් ඇති වූ සාමාජීය බලපෑම් පිළිබඳ නිරීක්ෂණය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරන ලද සිව් පුද්ගල කමිටුව මඟින් අදාළ නිර්දේශ සහිත වාර්තාව 2017.10.03 දින අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි. එකී කමිටුව සහ ජනාධිපති කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය විසින් සිදුකරන ලදි.





**අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචනය**

සෑම කාර්තුවක් අවසන් වූ සැණින් සියලුම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති සියලුම ආයතන විසින් කරගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘති ළඟාකර ගෙන ඇති ප්‍රගතිය වෙන් වෙන්ව විමසීම සඳහා මෙම අංශය අඛණ්ඩව කටයුතු කරගෙන යනු ලබයි. එමඟින් පිළියෙළ කරනු ලබන වාර්තාවක් සෑම කාර්තුවක් අවසානයේදීම ජනාධිපති ලේකම්තුමාට ඉදිරිපත් කරනු ලබයි.

**2017 පළමු කාර්තුව**

පළමු කාර්තුව තුල අප වෙත වාර්තා ලබාදුන් රේඛීය අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන සඳහා රු. බිලියන 539.0 ක ප්‍රතිපාදන ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ අතර එමඟින් රු. බිලියන 108.5 ක වියදමක් දරා ඇත. එය 20% ආසන්න මූල්‍ය ප්‍රගතිය අත්කර ගැනීමකි. 2017.04.27 දින කෘෂි අංශයට අයත් අමාත්‍යාංශ 4 ක නිලධාරීන් කැඳවා ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදි. එනම් 2017.06.13 දින 2016 වර්ෂයේදී හා 2017 පළමු කාර්තුවේ අවම ප්‍රගතියක් දක්වන ලද අමාත්‍යාංශ කැඳවා ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදි.

**2017 දෙවන කාර්තුව**

දෙවන කාර්තුව තුළ ද අප වෙත වාර්තා ලබාදුන් රේඛීය අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන සඳහා රු. බිලියන 787.5 ක ප්‍රතිපාදන ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ අතර එමඟින් රු. බිලියන 325.6 ක වියදමක් දරා තිබූ අතර එය 41% ක ආසන්න මූල්‍ය ප්‍රගතියකි.

**2017 තෙවන කාර්තුව**

තෙවන කාර්තුව තුළ ද අප වෙත වාර්තා ලබාදුන් රේඛීය අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන සඳහා රු. බිලියන 719.7 ක ප්‍රතිපාදන ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ අතර එමඟින් රු. බිලියන 348.3 ක වියදමක් දරා තිබූ අතර එය 48% ක ආසන්න මූල්‍ය ප්‍රගතියකි.

**2017 සිව්වන කාර්තුව**

සිව්වන කාර්තුවට අදාළ වාර්තා මේවන විට කැඳවා ඇති අතර එමඟින් 2017 සමස්ත වර්ෂයේ රේඛීය අමාත්‍යාංශ ප්‍රාග්ධන ප්‍රතිපාදන වියදම් කිරීමේ ප්‍රගතිය විමසීමට නියමිතව ඇත.

**පොකුරු රැස්වීම් (Cluster meetings )**

අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචනය වඩාත් විධිමත් කිරීමේ අරමුණින් 2017 අයවැය කතාවේදී රජය විසින් පෙන්වා දෙනු ලැබූ අමාත්‍යාංශ සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) ක්‍රියාවට නැංවීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශ වලට පැවරී ඇති ප්‍රධාන වගකීම් හා කාර්ය භාරය සමාලෝචනය කිරීමට සියලුම අමාත්‍යාංශ කාණ්ඩ 09 කට බෙදා වෙන්කරන ලදී.

මෙම එක් එක් කාණ්ඩ(Cluster ) වලට අදාළ අමාත්‍යාංශ වල ප්‍රගතිය ජනාධිපති ලේකම් ප්‍රමුඛ ජනාධිපති උපදේශකවරුන්, අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්, ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශ ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා ජනාධිපති අතිරේක ලේකම්වරයකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් ඉදිරියේ අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීම් ආරම්භ කරන ලදී.

| අංකය | දිනය | අමාත්‍යාංශ විෂය සංයෝජනය | කැඳවන ලද අමාත්‍යාංශ ගණන |
|---|---|---|---|
| 01 | 2017.08.04 | කෘෂිකර්ම උප විෂය I | 5 |
| 02 | 2017.08.14 | කෘෂිකර්ම උප විෂය II | 4 |
| 03 | 2017.08.18 | අධ්‍යාපන, මානව සම්පත් සහ ජාතික සමඟිය උප විෂය I | 4 |
| 04 | 2017.09.08 | සෞඛ්‍ය | 2 |
| 05 | 2017.10.13 | ආර්ථික යටිතල පහසුකම් උප විෂය II | 2 |
| 06 | 2017.11.29 | ආර්ථික යටිතල පහසුකම් උප විෂය I | 3 |

**සංවර්ධන ව්‍යාපෘතීන් හා ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යභාරය විමසා බැලීම - 2017.03.14**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය යන ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යභාරය පිළිබඳව සහ එම ආයතනවල කාර්ය සාධනය පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී.

**අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන උත්සව සංවිධානය කිරීම හා ඒවායෙහි සියලු කටයුතු සම්බන්ධීකරණය.**

**01. "තිරසර යුගයක තෙවසර ඇරඹුම" යන මැයෙන් මඩකලපුව උත්සවයට අදාල පවැත්වූ ක්ෂේත්‍ර කටයුතු**

"තිරසර යුගයක තෙවසර ඇරඹුම" යන මැයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ පැවැත් වූ උත්සවයට අදාල මූලික ක්ෂේත්‍ර කටයුතු මඩකලපුව දිස්ත්‍රික් සම්බන්ධීකරණය යටතේ 2017.01.10 සිදුකරන ලදි.








**02. ප්‍රධාන අමාත්‍යවරුන්ගේ සමුළුව -** 2017.06.19

2017.05.06 වන දින හබරණ සිනමන් ලොජ් හිදී පවත්වන ලද, 33 වන ප්‍රධාන අමාත්‍ය සමුළුවේදී සාකච්ඡා වූ කරුණු අනුව, අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කළයුතු කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුතුව මෙම සාකච්ඡාව පවත්වන ලදී.

**03. ජපන් මිත්‍රත්ව සංගමය විසින් ගිණි නිවන රථය පරිත්‍යාග කිරීම - 2017.07.24**

ජපන් මිත්‍රත්ව සංගමය විසින් පරිත්‍යාග කරන ලද සියලු උපාංග සහිත ගිණි නිවන රථය 2017.07.24 වන දින නිල වශයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත භාරදීම ජනාධිපති නිල මැදුරේදී සිදු කළ අතර, එම අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමා විසින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත භාර දෙන ලදි.



**04. වාර්ෂික නත්තල් උත්සවය - 2017.12.19**

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අතිඋතුම් මැල්කම් කාඩිනල් රංජිත් හිමිපාණන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂික නත්තල් උත්සවය දින ජනාධිපති මන්දිරයේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදි. මෙහිදී කැරොල් ප්‍රසංගයක් හා උත්සවය අවසානයේ රාත්‍රී භෝජන සංග්‍රහයක්ද පැවැත්වුණි.

(මෙම උත්සවය සම්බන්ධ සියලු සම්බන්ධීකරණ කටයුතු මෙම අංශයේ මැදිහත්වීම යටතේ සිදු විය.)





**දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.**

**1. යාපනය දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ රැස්වීම.**

ජාතික සංවර්ධන සැලසුම් වලට අනුකූලව දිස්ත්‍රික් මට්ටමේදී රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීමේ අරමුණින් 2017.06.12 වන දින යාපනය දිස්ත්‍රික්කයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී. එදින ගන්නා ලද තීරණ යටතේ පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතී.

**චක්‍රලේඛ නිකුත් කිරීම**

| | චක්‍රලේඛය | චක්‍රලේඛ අංකය | දිනය |
|---|---|---|---|
| **1.** | කසළ කළමනාකරණ ජාතික වැඩසටහන (ජනාධිපති ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද චක්‍රලේඛය) | PCMD/PS/02/PCG | 2017.01.03 |
| **2.** | ආයතන පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන නිරන්තර පරීක්ෂාව හා ඩෙංගු මදුරුවන් බෝවීම අවම කිරීම ඩෙංගු මර්දන - විශේෂ ත්‍රෛමාසිකය (ජනාධිපති ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද චක්‍රලේඛය) | PCMD/SD/01/MoHealth - Dengue | 2017.05.18 |
| **3.** | ආයතන පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන නිරන්තර පරීක්ෂාව හා ඩෙංගු මදුරුවන් බෝවීම අවම කිරීම ඩෙංගු මර්දන - විශේෂ වැඩසටහන (ජනාධිපති ලේකම්ගේ අත්සනින් නිකුත් කරන ලද චක්‍රලේඛය) | PCMD/SD/01/MoHealth - Dengue (II) | 2017.09.11 |

**පෝෂණ වැඩසටහන**

**2017 වර්ෂයේදී ඉටු කරන ලද ක්‍රියාකාරකම්**

- පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම 2017-2020 සකස් කිරීම.
- පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම 2017-2020 යටතේ අමාත්‍යාංශ, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමින් පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, පසු විපරම් කිරීම සහ ඇගයීම.
  - පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම 2017 යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මන්දපෝෂණය තුරන් කිරීම සඳහා හඳුනාගත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් 2020 වනවිට මෙරට,

- වයස අවුරුදු 05ට අඩු දරුවන් අතර කුරුබව 8.1% දක්වාත්, කෘෂ බව 5.8% දක්වාත්, අඩු බර උපත් සංඛ්‍යාව 10% ක් දක්වාත්, අධිබර තත්ත්වය වර්ධනය වීම වැළැක්වීමත්, රක්තහීනතාවය 8.8% දක්වා අඩු කිරීමත්, ගෘහස්ත ආහාර සුරක්ෂිතතාවය 25% කින් වැඩි කිරීමත් මූලික වශයෙන් අපේක්ෂිත ය.

**2017 වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති**

- පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකක හඳුනාගැනීම හා දත්ත ලබා ගැනීම
- පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකක වෙත සමෘද්ධි දීමනාව ලබාදීම තහවුරු කිරීම
- දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් තුළින් පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකක සවිබල ගැන්වීම
- දිළිඳුකම පිටු දැකීම හා ස්වයං රැකියා උත්පාදනය කිරීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ආර්ථික සංවර්ධන නිලධාරින් දැනුවත් කර ඒ තුළින් පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකක දැනුවත් කිරීම හා සවිබල ගැන්වීම
- ව්‍යාපාරික සන්ධාන ඇති කිරීම හා ඒ තුළින් සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගර්භණී මවුවරුන් සඳහා "පෝෂණ මල්ල" ලබා දීමේ වැඩසටහන නියාමනය කිරීම
- රැකියා සඳහා දීර්ඝ කාලීනව මව නිවසින් බැහැරව සිටින, පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකකවල වයස අවුරුදු 05ට අඩු දරුවන්ගේ පෝෂණය සම්බන්ධයෙන් එම දරුවන්ට රැකවරණය සලසන්නන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් දැනුවත් කිරීම
- රැකියා ස්ථානයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා සේවායෝජකයන් උනන්දු කරවීම.
- මවු හවුල් ඇති කිරීම හා පවත්නා මවු හවුල් ශක්තිමත් කිරීම
- පෙර පාසල් දරුවන්ගේ ආහාර පුරුදු සම්බන්ධයෙන් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම හා ඒ තුළින් එම දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම
- අන්තර් අධ්‍යාපනය හා සාර්ථක අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් වාර්ෂික සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකකවල මවුවරුන් හා දරුවන් රැකබලා ගන්නන් දරුවන්ගේ වර්ධන දුබලතා පූර්ව වශයෙන් හඳුනාගැනීම සහ ළදරු හා ළමා පෝෂණ පුරුදු පිළිබඳ පුහුණු කිරීම
- ගොවි සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන පෝෂණය හා සම්බන්ධ සියලු නිලධාරින් දැනුවත් කිරීම
- පොකුරු රැස්වීම් පැවැත්වීම මඟින් පෝෂණය පිළිබඳව ග්‍රාමීය වශයෙන් ඇති අවධානය තීව්‍ර කිරීම
- පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකකවල පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා සමාජ පරිවර්තකයන් ලෙස ක්‍රියාකිරීම උදෙසා ස්වේච්ඡා සේවකයින් පුහුණු කිරීම

- පෝෂණ අවදානම් සහිත ගෘහ ඒකකවල පෝෂණ වර්ධන ප්‍රගතිය නියාමනය කිරීම හා අපේක්ෂිත පරිදි වර්ධනයක් රහිත ගෘහ ඒකක වේ නම් එම ගෘහ ඒකක ඉලක්ක කර සුදුසු වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ද්විමාසික වශයෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පෝෂණ කමිටු රැස්වීම් පැවැත්වීම මඟින් නිතිපතා උක්ත වැඩසටහන් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සමාලෝචනය කර වාර්තා කැඳවීම
- බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වයස අවුරුදු 05ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණ මට්ටම 10% දක්වා අඩු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද ක්‍රියාකාරකම් වෙනුවෙන්, ප්‍රතිපාදන නිකුත් කරන ලදී.

උක්ත ව්‍යාපෘතිය මඟින් බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කළ කාලය තුළ (2016 ජුනි - 2016 දෙසැම්බර් දක්වා) අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය 14.7% සිට 11.3% දක්වා, 3.4% කින් අඩු වී ඇත.



පෝෂණය අවදානම් සහිත ගෘහ ඒකක වල මව්වරුන් හා දරුවන් රැකබලා ගන්නන් සඳහා දරුවන්ගේ වර්ධන දුර්වලතාවයන් පෙර හඳුනාගැනීම සහ ළදරු හා ළමා පෝෂණ පුරුදු පිළිබඳ පුහුණු කිරීම - කුරුණෑගල දිස්ත්‍රික්කය



ආර්ථික සංවර්ධන නිලධාරින් සඳහා පුහුණු කිරීමේ වැඩසටහන - මඩකලපුව දිස්ත්‍රික්කය



පෝෂණය අවදානම් සහිත ගෘහ ඒකක වල මව්වරුන් හා දරුවන් රැකබලා ගන්නන් සඳහා දරුවන්ගේ වර්ධන දුර්වලතාවයන් පෙර හඳුනාගැනීම සහ ළදරු හා ළමා පෝෂණ පුරුදු පිළිබඳ පුහුණු කිරීම - මහනුවර දිස්ත්‍රික්කය



ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන පෝෂණය හා සම්බන්ධ සියලු නිලධාරින් දැනුවත් කිරීම - බදුල්ල දිස්ත්‍රික්කය



7 - CM 26894






බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව ක්‍රියාත්මක මන්දපෝෂණය අවම කිරීමේ විශේෂ ව්‍යාපෘතියේ විවිධ අවස්ථා

**ජාතික පෝෂණ තොරතුරු පද්ධතිය (National Nutrition Information System)**

- ජාතික පෝෂණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජාතික පෝෂණ දත්ත පද්ධතිය භාවිතය පිළිබඳව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත පෝෂණය හා සම්බන්ධ නිලධාරින් ආවරණය වන පරිදි ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම

| අනු අංකය | දිස්ත්‍රික්කය | දිනය |
|---|---|---|
| 1 | නුවරඑළිය | 2017.03.06 |
| 2 | මහනුවර | 2017.03.07 |
| 3 | මාතලේ | 2017.03.09 |
| 4 | කෑගල්ල | 2017.03.10 |
| 5 | මඩකලපුව | 2017.03.13 |
| 6 | ත්‍රිකුණාමලය | 2017.03.14 |
| 7 | යාපනය, කිලිනොච්චිය | 2017.03.16 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | දිනය |
|---|---|---|
| 8 | මන්නාරම, මුලතිව් සහ වවුනියාව | 2017.03.17 |
| 9 | මොණරාගල | 2017.03.20 |
| 10 | අම්පාර | 2017.03.21 |
| 11 | රත්නපුර | 2017.03.23 |
| 12 | බදුල්ල | 2017.03.24 |
| 13 | අනුරාධපුර | 2017.03.27 |
| 14 | පොළොන්නරුව | 2017.03.28 |
| 15 | හම්බන්තොට | 2017.03.30 |
| 16 | මාතර | 2017.03.31 |
| 17 | ගාල්ල | 2017.04.03 |
| 18 | කළුතර | 2017.04.03 |
| 19 | කොළඹ | 2017.04.04 |
| 20 | ගම්පහ | 2017.04.04 |
| 21 | කුරුණෑගල | 2017.04.06 |
| 22 | පුත්තලම | 2017.04.07 |




ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ මූලික සාකච්ඡාව




ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ ප්‍රථම පුහුණු වැඩසටහන - නුවරඑළිය දිස්ත්‍රික්කය



ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - මඩකලපුව දිස්ත්‍රික්කය



ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - යාපනය දිස්ත්‍රික්කය



ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කය



ජාතික පෝෂණ දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කය

**➢ දත්ත ඇතුළත් කිරීමේ ප්‍රගතිය - 2017 දෙසැම්බර් මස 31 දිනට**

| අනු. අංකය | දිස්ත්‍රික්කය | ඇතුළත් දත්ත සංඛ්‍යාව | | | දිස්ත්‍රික්කය සඳහා එකතුව |
|---|---|---|---|---|---|
| | | වයස අවුරුදු 5ට අඩු ළමුන් | පූර්ව ගර්භණී කාන්තාවන් | ගර්භණී කාන්තාවන් | |
| 1 | කොළඹ | 3899 | 11 | 1232 | 5142 |
| 2 | ගම්පහ | 8905 | 39 | 1991 | 10935 |
| 3 | කළුතර | 12560 | 210 | 3155 | 15925 |
| 4 | මහනුවර | 14337 | 57 | 2571 | 16965 |
| 5 | මාතලේ | 4701 | 18 | 927 | 5646 |
| 6 | නුවරඑළිය | 11468 | 66 | 222 | 11756 |
| 7 | හම්බන්තොට | 6815 | 113 | 1776 | 8704 |
| 8 | ගාල්ල | 3840 | 11 | 679 | 4530 |
| 9 | මාතර | 7364 | 36 | 1491 | 8891 |
| 10 | යාපනය | 7543 | 7267 | 1724 | 16534 |
| 11 | මන්නාරම | 615 | 1783 | 310 | 2708 |
| 12 | වවුනියාව | 1794 | 2486 | 332 | 4612 |
| 13 | මුලතිව් | 1446 | 67 | 147 | 1660 |
| 14 | කිලිනොච්චිය | 1637 | 2150 | 569 | 4356 |
| 15 | මඩකලපුව | 6060 | 2366 | 1452 | 9878 |
| 16 | අම්පාර | 8618 | 72 | 1928 | 10618 |
| 17 | ත්‍රිකුණාමලය | 1704 | 10 | 823 | 2537 |
| 18 | කුරුණෑගල | 15443 | 34 | 2068 | 17545 |
| 19 | පුත්තලම | 4868 | 52 | 1055 | 5975 |
| 20 | අනුරාධපුර | 9820 | 28 | 1603 | 11451 |
| 21 | පොළොන්නරුව | 3870 | 45 | 257 | 4172 |
| 22 | බදුල්ල | 9877 | 64 | 882 | 10823 |
| 23 | මොණරාගල | 6176 | 3 | 731 | 6910 |
| 24 | කෑගල්ල | 4497 | 39 | 626 | 5162 |
| 25 | රත්නපුර | 9673 | 72 | 1218 | 10963 |
| එකතුව | | 142166 | 16839 | 23391 | 182396 |

➢ **2017 ඔක්තෝබර් මස 10-12 වන දින දක්වා පැවති පොදු රාජ්‍ය මණ්ඩලයීය ඩිජිටල් සෞඛ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණය සහ සම්මාන උළෙලේ දී පෝෂණ අංශයේ හොඳම දත්ත පද්ධතිය ලෙස සම්මාන ලැබීම**






# සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

රටක සංවර්ධනය හුදෙක් යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි පමණක් සීමා නොකොට පුද්ගල සංවර්ධනය තුළින් සදාචාරවත් සමාජයක් තුළ ජීවත් වන ශක්තිමත් පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කරගෙන, අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ ජනාධිපති කාර්යාලයේ “**සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය**” විසින් පහත සඳහන් සුවිශේෂී ජාතික වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ.

1. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
2. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන
3. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන
4. “දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන
5. තිරසර පාසල් වැඩසටහන.
6. ආගමික කටයුතු පිළිබඳ වැඩසටහන්
7. වෙනත් විශේෂ වැඩසටහන් (ජාතික පොත් ප්‍රතිපත්තිය සැකසීම, කලා හා සංස්කෘතික ප්‍රතිපත්තිය සැකසීම,“අපේ සුවය රටේ සවිය” වැඩසටහන,දිස්ත්‍රික් තරුණ කඳවුරු පැවැත්වීම වැනි වැඩසටහන් )

ඉහත වැඩසටහන් සඳහා ස්ථාපනය කරන ලද ‘ජනාධිපති කාර්ය සාධක බලකායන්’ හා විශේෂිත ඒකක මඟින්,

- නිශ්චිත කාල වකවානු සහිතව ජාතික සැලසුම් සකස් කිරීම.
- අන්තර් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන අතර මනා සම්බන්ධීකරණය.
- නීතිමය හා ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධව මැදිහත් වීම.
- අවශ්‍ය අවස්ථා වලදී මූල්‍ය ප්‍රතිපාදන හා පහසුකම් සැපයීම.
- සිවිල් සංවිධාන හා ප්‍රතිලාභීන් සමඟ මනා සම්බන්ධීකරණය.
- අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලැබේ.
- නිරන්තර පසු විපරම.

2016 වසරේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය වෙත රු.මි.1000 ක් වෙන් වූ අතර, එයින් 98% කට වැඩි මූල්‍ය ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. 2017 වසරේ වෙන් වූ රු.මි.1250 න් 92% කට වඩා වැඩි ප්‍රමාණයක් විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීම් හා වියදම් වෙනුවෙන් දරන ලදී.

**සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය සඳහා වෙන්වූ අයවැය ප්‍රතිපාදන සහ වියදම - 2016**




**සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය සඳහා වෙන්වූ අයවැය ප්‍රතිපාදන සහ වියදම - 2017**




**එක් එක් ජාතික වැඩසටහන් යටතේ 2017 වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිච්ඡේද තුළින් විස්තර කෙරේ.**

## 01. "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

**දැක්ම**

තිරසර පරිසරයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම

**මෙහෙවර**

අන්තර් ආයතනික සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා පුළුල් ජනතා සහභාගීත්වයක් තුළින්, හඳුනාගත් ප්‍රමුඛ පරිසර ගැටලු සඳහා විසඳුම් ලබා දෙමින් ශ්‍රී ලංකාව තුළ තිරසර පරිසරයක් ස්ථාපිත කිරීම.

**අරමුණු**

1. ශ්‍රී ලංකාවේ තිරසර පැවැත්ම සඳහා අවශ්‍ය වන සම්පත සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.
2. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් තිරසර උපයෝජනය , සංරක්ෂණය හා කළමනාකරණය තුළින් ජීවනප්‍රිය පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම.
3. තිරසර කසළ කළමනාකරණයක් තුළින් නිකසල ජීවන පරිසරයක් නිර්මාණය කිරීම.
4. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසර කළමනාකරණය.
5. පරිසර සංරක්ෂණය පිළිබඳව මහජනතාව සවිඥාණිකව සවිබල ගැන්වීම.
6. ශ්‍රී ලාංකික ජනතාව පරිසර සංරක්ෂණය කෙරෙහි සංවේදී ජනතාවක් බවට පත් කිරීම.

**හැඳින්වීම**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත්වීම, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස් වීම, ජනගහනය හා මානව අවශ්‍යතා ඉහළ යාම වැනි කරුණු හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටලු අවම කරමින් ස්වභාවික සම්පත් ආරක්ෂා කර තිරසර පරිසරයක් ස්ථාපිත කිරීමේ අරමුණින් "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන (2016-2018) හඳුන්වා දෙන ලදී. ජනාධිපති කාර්යාලය යටතේ පිහිටුවා ඇති ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් පාර්ශවකාරී ආයතන හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ මෙන්ම එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තු හා ආයතන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සක්‍රීය දායකත්වය සපයයි. මෙහිදී පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 6 යටතේ ජාතික වැඩසටහන් 21ක් හඳුනාගෙන ඇත.

i. **පරිසර දූෂණ පාලනය**
ii. **වන සංරක්ෂණය හා සංවර්ධනය**
iii. **තිරසර ඉඩම් කළමනාකරණය**
iv. **වන සත්ව මිනිස් සහජීවනය**
v. **ජෛව සම්පත් සංරක්ෂණය**
**vi. ආයතනික ප්‍රතිව්‍යූහගත කිරීම හා ප්‍රවර්ධනය**

පාර්ශ්වකාරී ආයතන විසින් ඒ ඒ ක්ෂේත්‍ර යටතේ හඳුනාගන්නා ලද වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර පරිසර සංරක්ෂණ ජනාධිපති කාර්යය සාධන බලකාය මේ සඳහා අවශ්‍ය මෙහෙයවීම, සම්බන්ධීකරණය, පසුවිපරම, අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබයි.

ජනාධිපති කාර්යාලය විසින් 2017 වසරේ පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර පාර්ශ්වකාරී ආයතන වෙත පහසුකම් සපයන ලදී.

| **ජනාධිපති කාර්යාලය මගින් පරිසර සංරක්ෂණය සඳහා ප්‍රතිපාදන ලබා දීම - 2017** | | | |
|---|---|---|---|
| | **ක්ෂේත්‍රය** | **වෙන්කර ඇති ප්‍රතිපාදන (රු.)** | **ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)** |
| 1 | පරිසර දූෂණ පාලනය, කසළ කළමනාකරණය | 226,000,000 | 225,455,319 |
| 2 | වන සංරක්ෂණය සහ සංවර්ධනය | 34,000,000 | 33,743,450 |
| 3 | හායනයට ලක්වී ඇති ජලමූලාශ්‍ර සහ ජල පෝෂක ප්‍රදේශ විධිමත් පරිදි සංරක්ෂණය කිරීම | 67,000,000 | 66,077,055 |
| 4 | තිරසර පාසල් වැඩසටහන | 40,000,000 | 36,509,540 |
| 5 | පාරිසරික සාක්ෂරතාව වර්ධනය කිරීම | 48,000,000 | 34,038,549 |
| 6 | පරිසර සංරක්ෂණය හා ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම | 25,000,000 | 8,663,287 |
| 7 | පසු විපරම අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය | 10,000,000 | 612,800 |
| **එක් එක් ක්ෂේත්‍ර අනුව ලබා දී ඇති මුළුප්‍රතිපාදන ප්‍රමාණය** | | **450,000,000** | **405,100,000** |




### 1.1 පරිසර දූෂණ පාලනය

පරිසර දූෂණය පාලනය කිරීම සඳහා “පුනරුදය” යටතේ හඳුනාගත් උපාය මාර්ග පහත සඳහන් වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වේ.

නිකසළ ලංකා
නිකසළ පුරවර
හරිත වෙරළ
සුනිල සයුර
පිරිසිදු වායු - දීඝායු
ජනදිවි රකින - ජල රැකවරණය
සාර නගර

**ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් පරිසර දූෂණ පාලනය සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2017**

**හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය එළිදැක්වීම**

"පුනරුදය" තුන් අවුරුදු පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනෙහි හඳුනාගත් එක් වැඩසටහනක් ලෙස නගර හා ගොඩනැගිලි නිර්මාණයේදී හරිත සංකල්ප ආශ්‍රිත ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. මේ සිදුකිරීම යටතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි පුළුල් ලෙස පරිසර හිතකාමී හරිත ගොඩනැගිලි ලෙස 2017 වර්ෂයේ සිට ඉදිකිරීම හා පවත්වාගෙන යාම සඳහා ජනාධිපති කාර්යාලයේ මූල්‍ය දායකත්වය ඇතිව හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය නිර්මාණය කරන ලදී. 2017 ජනවාරි මස 09 වෙනි දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී එම හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය එළිදැක්වීමේ නිල උත්සවය පැවැත්විණි. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම් සිදුකෙරෙමින් පවතින අතර නව ගොඩනැගිලි ඉදිකිරීමේදී හරිත සංකල්ප ක්‍රියාවට නැංවීම සඳහා ජනතාව දිරිගැන්වීමට ක්‍රියාකාරකම් මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මෙහිදී විශේෂයෙන්ම 2018 වසරේ සිට ඉදිකරනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන හරිත ගොඩනැගිලි ලෙස ඉදිකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

**1.1.2 පළාත් පාලන ආයතනවල කසළ කළමනාකරණය**





ශ්‍රී ලංකාව තුළ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු, අවිධිමත් කසළ බැහැර කිරීම් හේතුවෙන් මෑතකාලීනව සිදු වූ ආපදාවන් සඳහා පිළියම් හා පළාත් පාලන ආයතනයන්හි කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනේ මෙහෙයවීමෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා වැදගත් තීරණ රැසක් ගන්නා ලදී.

මේ වන විට ආරම්භ කර ඇති කෙරවලපිටිය, අරුවක්කාල්, කරදියාන, ගම්පහ පෙතියාකන්ද, මහනුවර ගොහාගොඩ හා මාතර කොටවිල යනාදී කසළ කළමනාකරණ ව්‍යාපෘතීන්හි කටයුතු සඳහා රු.මි. 226ක ප්‍රතිපාදන ලබා දුන් අතර පසුව්පරම් කරමින් දීර්ඝ කාලීන කසළ කළමනාකරණ ක්‍රමවේදයක් සකස් කරන ලදි. සියලු පළාත් සඳහා කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍ර ස්ථාපනය කිරීම, පළාත් පාලන ආයතනයන්ට අඩුපාඩුවක්ව පැවති කම්පැක්ටර්, ට්‍රැක්ටර් මිලදී ගැනීමේ කටයුතු සිදු කිරීම, කසළ කළමනාකරණය සඳහා විධිමත් මාර්ගෝපදේශයකට අනුව කටයුතු කිරීමට සියලු පළාත් පාලන ආයතන යොමු කරවීම පවත්වන ලද සාකච්ඡාවන්හි ප්‍රධානතම ප්‍රතිඵලයන් විය.



2017 මාර්තු 10 වන දින සාකච්ඡාව



2017 අප්‍රේල් 25 වන දින සාකච්ඡාව

### 1.1.3 පරිසර මිතුරු සිරිපා සමය වැඩසටහන

2016 – 2017 සිරිපා සමය වෙනුවෙන් ජනාධිපති කාර්යාලයෙහි පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මගින් **"පරිසර මිතුරු සිරිපා සමය"**වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව වන්දනාකරුවන් සිරි පා සමයට පෙර සිටම දැනුවත් කිරීම් සිදු කළ අතර විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ද දැනුවත් කිරීම් සිදු කරන ලද අතර එක් රැස් වන කසළ වර්ගීකරණයට හා ප්‍රතිචක්‍රීකරණයට කටයුතු සලස්වන ලදී. එබැවින් ප්ලාස්ටික් හා පොලිතින් පරිසරයට බැහැරලීම මෙවර සිරි පා සමයේ බොහෝ සෙයින් අවම විය. වන්දනාකරුවන්ට කසළ පහළට රැගෙන ඒම පහසු කිරීමේ අරමුණින් පරිසර හිතකාමී බෑගයක්ද බෙදා දෙන ලදී.

තවද ශ්‍රී පාදයට පිවිසෙන මාර්ග දෙපස පිහිටි අම්බලන්හි වැසිකිළි පද්ධති පිළිසකර කිරීම අවට පරිසරය හා ජල මූලාශ්‍ර රැක ගැනීමට ඉවහල් වන නිසාවෙන් වර්ණගල, සීතගඟුල, මැදහින්න, දෙමළමලහින්න හා ඉඳිකටුපාන යන අම්බලන්හි වැසිකිළි පද්ධති පිළිසකර කිරීම සඳහා රු. රු.මි.4.015 ක ප්‍රතිපාදන රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දෙන ලදී.

වනජීවී දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ශ්‍රී පාද රක්ෂිතයේ ඇති වැදගත්කම හා පරිසරය අපවිත්‍ර කිරීමෙන් සිදුවන හානිය පිළිබඳව බැතිමතුන් කණ්ඩායම් වශයෙන් දැනුවත් කිරීම් කටයුතු වඩාත් පහසු කරනු පිණිස මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක්, මෙහෙයුම් පද්ධතිය රහිත පරිගණක යන්ත්‍රයක් හා වෝල් මවුන්ට් තිරයක් ලබා ගැනීම සඳහා (අවශ්‍ය මූල්‍ය සහය රු. 176,645.25 ක) ප්‍රතිපාදන නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලදී.















**පරිසර මිතුරු සිරිපා සමය ක්‍රියාත්මක කිරීම**

### 1.1.4 වෙරළ සංරක්ෂණ වැඩසටහන්

ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය එක්ව වෙරළ ආශ්‍රිත ප්‍රදේශ සංරක්ෂණය කිරීම අරමුණු කරමින් ජනාධිපති කාර්යාලයේ මැදිහත්වීමෙන් 2018 වර්ෂය සඳහා වැඩසටහනක් සැලසුම් කරන ලදී. අපිරිසිදු තත්ත්වයේ පවතින ධීවර වරායන් පිරිසිදුව පවත්වා ගැනීම, වෙරළ ආශ්‍රිත කඩොලාන පරිසරය සංවර්ධනය, ධීවර වරාය ආශ්‍රිත ප්‍රජාව හා වෙරළාසන්න පාසල් දරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, කුඩා ජල පහරවලින් සාගරයට එකතුවන අපද්‍රව්‍ය අවම කිරීම හා වෙරළ ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු වැඩසටහන් රැසක් 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**පරිසර දූෂණ පාලනය - කසළ කළමනාකරණය සඳහා ප්‍රතිපාදන ලබා දීම 2017**

| කාරණය | ප්‍රතිපාදනය ලබාදුන් / ගෙවීම් කරන ලද ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| රාජ්‍ය ආයතනවල ඉදිකිරීම් හරිතකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වාදීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 3,000,000 |
| බලංගොඩ ප්‍රා.ලේ.කොට්ඨාසයේ කසළ කළමනාකරණය ව්‍යාපෘතිය | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2,776,743 |
| මානව සහ පාරිසරික පැවැත්ම වෙනුවෙන් රසායනික පොහොර භාවිතය අවම කිරීම | දිස්ත්‍රික් ලේකම්,මාතලේ | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 790,000 |
| "ගුරු ගෙදරට කළ එළියක්" මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ජාතික පාසල් තුළ ආදර්ශ කාබනික පොහොර කුටීර සෑදීමේ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | දිස්ත්‍රික් ලේකම්, මොණරාගල | දිස්ත්‍රික් ලේකම්, මොණරාගල | 603,756 |
| බලශක්ති ජනනය හා පරිභෝජනයේදී සිදුවන හරිතාගාර විමෝචනය අවම කිරීමේ ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සඳහා වූ ව්‍යාපෘතිය යටතේ බෙලිඅත්ත ප්‍රා.ලේ.කාර්යාලය සඳහා ජීව වායු ඒකකයක් ස්ථාපිත කිරීම. | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 68,352 |
| ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය විධිමත්ව එක්රැස්කිරීමට ආර්ථික සංවර්ධන නිළධාරී කාර්යාල සඳහා බඳුන් ලබා දීමේ ව්‍යාපෘතිය | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 381,341 |
| කෙරවලපිටිය කසළ අංගනය ඉදි කිරීම | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 115,000,000 |
| 2017 කතරගම වන්දනා සමයේ කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා බැතිමතුන්ට බෙදා දීම සඳහා පරිසර හිතකාමී බෑග් 10,000ක් නිර්මාණය | දිස්ත්‍රික් ලේකම්, මොණරාගල | දිස්ත්‍රික් ලේකම්, මොණරාගල | 600,000 |

| කාරණය | ප්‍රතිපාදනය ලබාදුන් / ගෙවීම් කරන ලද ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| කසළ කළමනාකරණය සහ ඩෙංගු මර්ධන වැඩසටහන | පොළොන්නරුව දි.ලේ. | පොළොන්නරුව දි.ලේ.කා. | 58,250 |
| නිකසළ පුලතිසි පුරවරයක් - පළමු පියවර ව්‍යාපෘති යෝජනාව | පුත්තලම දි.ලේ. | පුත්තලම දි.ලේ.කා. | 970,625 |
| පොලිතීන් මගින් ඇති වී තිබෙන පාරිසරික ගැටලු අවමකිරීම සඳහා පොලිතීන් භාවිතය නිසි පරිදි කළමනාකරණය කිරීමට අදාළ කැබිනට් මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 20,000,000 |
| ගම්පහ දිස්ත්‍රික් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අමතර ගොඩනැගිලි ඉදි කිරීම | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 50,000,000 |
| රත්නපුර මහ නගර සභාව සඳහා පර්යේෂණ මට්ටමින් කොම්පෝස්ට් යන්ත්‍රයක් නිර්මාණය කිරීම | ලේකම්, සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - රත්නපුර | 320,000 |
| කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අමතර ගොඩනැගිලි ඉදිකිරීම (ගම්පහ දිස්ත්‍රික් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ) | ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 26,512,353 |
| ශ්‍රීපාදයට පිවිසෙන මාර්ගවල වැසිකිළි පද්ධති 16ක් ඉදි කිරීම | දිස්ත්‍රික් ලේකම්, රත්නපුර | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 4,015,000 |

## 1.2 වන සංරක්ෂණය හා සංවර්ධනය

වන හරණය හා වන හායනය හේතු කොට ගෙන, ජෛව විවිධත්වය විනාශ වීම, සතුන්ගේ වාසස්ථාන අහිමි වීම, ජල පෝෂක ප්‍රදේශවල ගුණාත්මකභාවය අඩු වීම, පාංශු ඛාදනය ඉහළ යාම, දේශගුණික විපර්යාස ඇති වීම වැනි අහිතකර බලපෑම් රැසක් ඇති වේ. එබැවින් වන සංරක්ෂණය හා සංවර්ධනය උදෙසා පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- වනරෝපා
- වන අරණ - රැකවරණ
- වන සරණ

**ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් වන සංරක්ෂණය සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2017**

### 1.2.1 නකල්ස් ඉඩම් අත්පත් කරගැනීම

2016.06.05 දින මාතලේ එඩ්වඩ් ක්‍රීඩාංගනයේ පැවති පරිසර සමුළුවට සමගාමීව ආරම්භ කරන ලද පරිසර සංරක්ෂණ වැඩසටහනක් ලෙස ලෝක උරුම නකල්ස් රක්ෂිතයට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම සිදුකෙරෙමින් පවතියි. ඉඩම් හිමිකම් ප්‍රකාශ කරන්නන් සොයාගැනීම හා ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීම හා සහයෝගය ලබා දෙන ලදී.

### 1.2.2 පැල මිලියන 3ක් නිෂ්පාදනය

පරිහානියට පත් වනාන්තර නැවත වගා කිරීම සඳහා 2017 වර්ෂයට අවශ්‍ය පැල මිලියන 3 ක් නිෂ්පාදනය කිරීමට 2016 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය මගින් රු.මි.42 ක ප්‍රතිපාදනයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් අතර එම පැල නඩත්තු කිරීම සඳහා 2017 වර්ෂයෙදී රු.මි.10 ක ප්‍රතිපාදනයක් ලබා දී ඇත. දිවයින පුරා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ වැඩසටහන් හා රුක් රෝපණ වැඩසටහන් සඳහා අවශ්‍ය පැල ලබා දීමට එමගින් හැකියාව ලැබී ඇත.

### 1.2.3 ශ්‍රී ලංකාවේ වන වැස්ම 1% කින් වැඩිකිරීමේ නියමු ව්‍යාපෘතිය

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ගල්ගමුව මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී, වෛද්‍ය එච්.එම්.බී. ආසිරි මුණසිංහ මහතා විසින් යොමු කරන ලද වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාවේ වන වැස්ම 1% කින් වැඩිකිරීම සඳහා යෝජනා ඇතුළත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික පියවර ගන්නා ලදී. නියමු ව්‍යාපෘතියක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලු පාසල් වල පළමු ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් සඳහා පැලයක් ලබාදීම (නැණවත් ගස සංකල්පය) හා දිස්ත්‍රික්කයේ සියලු රෝහල්වල ඉපදෙන දරුවන් සඳහා පැලයක් ලබා දීම (නිවුන් සහෝදර ගස සංකල්පය) සඳහා කටයුතු සිදුකර ඇත.

### 1.2.4 ජනාධිපති කාර්යාලයීය නිලධාරීන් හට පළතුරු පැල බෙදා දීමේ ව්‍යාපෘතිය

සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මගින් ජනාධිපති කාර්යාලයීය සියලු නිලධාරීන් හට 2018 නව වසරේ පළමු රාජකාරී දිනයේදී පළතුරු පැලයක් ලබා දීමට කටයුතුකරන ලදී. ඒ අනුව 2018.01.02 පළමු රාජකාරී දිනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පළතුරු පැල බෙදා දීමේ වැඩසටහන පවත්වන ලදී. පළතුරු පැලය බහාලීම සඳහා පරිසර හිතකාමී බෑගයක් සමග රුක් රෝපනයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වන අත්පත්‍රිකාවක් බෙදා දීමද ඒ සමග සිදු කරන ලදී.



8 - CM 26894







**ජනාධිපති කාර්යාලයේ නිලධාරීන්ට පළතුරු පැල ලබා දීම - 2018.01.02**

**වන සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම - 2017**

| කාරණය | ප්‍රතිපාදනය ලබාදුන් / ගෙවීම් කරන ලද ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| මාදම්පේ සිට රක්වාන මාර්ගය දෙපස නා පැළ සහ පළතුරුපැළ 1000ක් සිටුවීම | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 182,000 |
| 2017 වර්ෂයේ සිට උපදින සෑම දරුවෙක් සඳහාම තිළිණයක් ලෙස බද්ධ කොස් පැළයක් ලබා දීමේ " චූටි බබයි - බත් ගසයි" ව්‍යාපෘතිය | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 396,000 |
| ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලයේ සියවස් සැමරුම් උළෙලේදී පළතුරු පැල 4300 ක් ලබා දීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 972,800 |

| කාරණය | ප්‍රතිපාදනය ලබාදුන් / ගෙවීම් කරන ලද ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| 2017 වර්ෂය සඳහා නිෂ්පාදිත පැල මිලියන 03 නඩත්තු කටයුතු | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 10,000,000 |
| තෝරාගත් ගම්මාන 10ක ගෙවතු වන වගාව | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 130,600 |
| 2017 වන රෝපා ජාතික රුක් රෝපන වැඩසටහන වෙනුවෙන් අවශ්‍ය පැල මිලදී ගැනීම | දිස්ත්‍රික් ලේකම් - මොණරාගල, බදුල්ල, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, කළුතර, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වව්නියා, මාතලේ, නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම් - මොණරාගල, බදුල්ල, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, කළුතර, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වව්නියා, මාතලේ, නුවරඑළිය | 20,531,050 |
| 2017 වනරෝපා ජාතික රුක්රෝපණ මාසය වෙනුවෙන් මහනුවර දි. ලේ. කාර්යාලයට අවශ්‍ය පළතුරු පැල ලබා ගැනීම | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 735,000 |
| ඇතාගල ජෛව විවිධත්ව සංරක්ෂණය හා ජාතීන් අතර සංහිඳියාව ගොඩනැගීමේ ව්‍යාපෘතිය | දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව | දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව | 460,000 |
| නිල්ල පිරුණු හෙටක් - ජාතික රුක් රෝපණ වැඩසටහන | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 200,000 |

### 1.3 තිරසර ඉඩම් කළමනාකරණය

හායනය වී ඇති භූමි සම්පත රැකගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සිදුවන පාංශු ඛාදනයන් සහ විවිධ දූෂ්‍යකාරක එකතු වීම නිසා සිදුවන භූමි හායනයන් වළක්වාලීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කර ජල සම්පත ආරක්ෂා කර ගැනීම, සියලු මැණික් පතල්, වැලි, ගල් සහ අනෙකුත් ඛනිජ නිධි වැඩබිම් සහ වෙරළ කලාප යථාවත් කර පරිසර පද්ධති පුනරුත්ථාපනය කිරීම, දේශගුණ විපර්යාසවලට අනුහුරු ගම්මාන ලංකාව පුරා ස්ථාපිත කිරීම, භූමි පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම, ඉලක්ක කරගනිමින් පහත සඳහන් වැඩසටහන් තිරසර ඉඩම් කළමනාකරණය යටතේ ක්‍රියාත්මකයි.

- හායන සායන
- ක්ෂේම භූමි
- කැණීම් භූමි සායන
- දේශගුණ අනුහුරු
- සාර භූමි

**ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් හායනයට ලක් වී ඇති ජලමූලාශ්‍ර සහ ජල පෝෂක ප්‍රදේශ විධිමත් පරිදි සංරක්ෂණය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2017**

ජනාධිපති කාර්යාලයේ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන හා අදාළ සියලු ආයතන ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී මහනුවර, නුවරඑළිය, බදුල්ල, රත්නපුර, කෑගල්ල,මාතලේ යන දිස්ත්‍රික්ක 6 සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී කටයුතු කරනු ලබයි.

මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාවට නැංවීමේදී "ශ්‍රී ලංකාව සඳහා වූ ජල මූලාශ්‍ර හා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ ඒකාබද්ධ ප්‍රවේශය" ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. 2016 වර්ෂයේ මෙම කාර්යාලය මගින් ලබා දුන් ප්‍රතිපාදනවලින් ඉතා සාර්ථක අන්දමින් දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලද අතර 2017 වර්ෂයේදී දිස්ත්‍රික්ක 23 ක ව්‍යාපෘති 216 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.

එසේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වන ප්‍රාදේශීය වැවිලි සමාගම් සම්බන්ධ කර ගනිමින් වතු ඉඩම් ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ වැඩසටහනක් ආරම්භ කොට ඇති අතර එහි ප්‍රථම වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන්න ලදී. එහි දෙවන වැඩසටහන 2017.05.02 දින මහනුවර දිස්ත්‍රික්කයේද තෙවන වැඩසටහන 2017.06.02 දින බදුල්ල දිස්ත්‍රික්කයේ ද, සිව්වන වැඩසටහන 2017.07.03 දින මාතලේ දිස්ත්‍රික්කයේද පවත්වන ලදී.

සෑම වසරකම ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික රුක් රෝපණ මාසයට සමගාමීව සිදුකරන "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහනෙහි හා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ වැඩසටහනෙහි සමාරම්භක උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ඔක්තෝබර් 11 වන දින පෙ.ව.10.00 ට මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේතැන්න වැව් පරිශ්‍රයේදී පැවැත්විණි.

මෙහිදී සිඳී යාමේ තර්ජනයට ලක්ව ඇති කන්දේතැන්න ජලපෝෂකය සංරක්ෂණය සඳහා පැල 5000 කට අධික ප්‍රමාණයක් සිටුවීමට පියවර ගන්නා ලදී. ඒ සඳහා පාසල් සිසුන්, ආරක්ෂක අංශ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් මෙන්ම ප්‍රදේශවාසීන් රැසක් ද සහභාගී වන ලදී. සහභාගීවන සෑම අයෙක් සඳහාම පළතුරු පැලයක් ලබා දීම හා පාසල් සිසුන් සඳහා පරිසර විෂයට අදාළ අධ්‍යාපනික උපකරණ කට්ටලයක් ලබා දීමද එහිදී සිදු විය.




2017.06.02 දින බදුල්ල දිස්ත්‍රික් වැඩසටහන




2017.07.03 දින මාතලේ දිස්ත්‍රික් වැඩසටහන








ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය











ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය වැඩසටහනෙහි සමාරම්භක උත්සවය, දෙල්තොට

**හායනයට ලක් වී ඇති ජලමූලාශ්‍ර සහ ජල පෝෂක ප්‍රදේශ විධිමත් පරිදි සංරක්ෂණය කිරීම (තිරසරභූමි කළමනාකරණය) සඳහා ප්‍රතිපාදන ලබා දීම - 2017**

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| රත්නපුර දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | රත්නපුරෙ දිස්ත්‍රික් ප්‍රා.ලේ කාර්යාලය | රත්නපුර දිස්ත්‍රික් ප්‍රා.ලේ. කාර්යාල | 6,109,070 |
| වේලි ඔය ජලාධාර ප්‍රදේශ කළමනාකරණය සඳහා සැලැස්මක් සැකසීමේ වැඩසටහන | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 552,625 |
| නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, රත්නපුර, කෑගල්ල, මාතර, ගාල්ල, පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ආදර්ශ ව්‍යාපෘති ලෙස අක්කර 20 බැගින් ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව වන වගාව සිදු කිරීම. | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 2,745,786 |
| පොළොන්නරුව දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - පොළොන්නරුව | 833,900 |
| මහනුවර දිස්ත්‍රික් ජල පෝෂක ප්‍රදේශ හා ජලමූලාශ්‍ර කළමනාකරණ ව්‍යාපෘති යෝජනා | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 3,635,000 |
| කෑගල්ල දිස්ත්‍රික් ජල පෝෂක ප්‍රදේශ හා ජලමූලාශ්‍ර කළමනාකරණ ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - කෑගල්ල | 1,457,190 |
| බදුල්ල දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - බදුල්ල | 2,580,309 |
| මොණරාගල දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මොණරාගල | 2,277,830 |
| මාතර දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මාතර | 2,516,556 |
| මහනුවර දිස්ත්‍රික් ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මහ නුවර | 3,717,000 |
| නුවරඑළිය දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - නුවරඑළිය | 1,530,633 |

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| මාතලේ දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | ඉඩම් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මාතලේ | 4,247,405 |
| ජල පෝෂක සංරක්ෂණ වැඩමුළුව බදුල්ල දි.ලේ.කා. | බදුල්ල දි.ලේ.කා. | බදුල්ල දි.ලේ.කා. | 104,850 |
| ජල පෝෂක සංරක්ෂණ වැඩමුළුව මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | 39,375 |
| කන්දෙතැන්න ජලාශය ආශ්‍රිත ජල පෝෂක කලාපය සංරක්ෂණය කිරීම | මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | 1,152,000 |
| ඕකේවෙල සහ හීනටිහතමූණ ග්‍රාම නිලධාරී වසම් හරහා ගලා බසින කිරම ඔය දෙපස පුවක් පැල සිටුවීම | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 19,000 |
| ජල පෝෂක සංරක්ෂණ වැඩමුළුව | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 75,000 |
| කොළඹ දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | දිස්ත්‍රික් ලේකම්, කොළඹ | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - කොළඹ | 98,000 |
| කළුතර දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | දිස්ත්‍රික් ලේකම්,කළුතර | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - කළුතර | 4,310,595 |
| හම්බන්තොට දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - හම්බන්තොට | 364,000 |
| මාතර දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | දිස්ත්‍රික් ලේකම්, මාතර | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - මාතර | 456,550 |
| පාළුගම ඉහළ කොටසේ ජල මූලාශ්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය | මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | 200,000 |
| දකුණු මහගම දිය බුබුල ස්වභාවික ජල මූලාශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | පුත්තලම දි.ලේ.කා. | මාදම්පේ ප්‍රා.ලේ.කා. | 149,800 |

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| වෙරළ පවිත්‍රතා වැඩසටහන් සිදුකිරීම, කඩොලාන සහ වැටකෙයියා පැල සිටුවීම | පුත්තලම දි.ලේ.කා. | මහවැව ප්‍රා.ලේ..කා. | 72,500 |
| හොරේවෙල ග්‍රාම නිළධාරී වසමේ රුක් රෝපණය කිරීමේ ව්‍යාපෘතිය | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට | වලස්මුල්ල ප්‍රා.ලේ.කා. | 13,750 |
| භූමි සංවර්ධනය සහ භූමි කළමණාකරණය - උඩවෙල පහුරුගොල්ලවත්ත ජල පෝෂක ප්‍රදේශය | මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | 1,253,800 |
| ගාල්ල දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | ගාල්ල දි.ලේ.කා. | ගාල්ල දි.ලේ.කා. | 2,404,620 |
| බදුල්ල දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | බදුල්ල දි.ලේ.කා. | බදුල්ල දි.ලේ.කා. | 247,600 |
| කිළිනොච්චි දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | කිළිනොච්චි දි.ලේ.කා. | කිළිනොච්චි දි.ලේ.කා. | 925,705 |
| මාතලේ දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | මාතලේ දි.ලේ.කා. | මාතලේ දි.ලේ.කා. | 230,562 |
| රත්නපුර දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 818,600 |
| කුරුණෑගල දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | කුරුණෑගල දි.ලේ.කා. | කුරුණෑගල දි.ලේ.කා. | 416,585 |
| අම්පාර දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | අම්පාර දි.ලේ.කා. | අම්පාර දි.ලේ.කා. | 378,500 |
| රදාකඳුර හා හිප්පවෙල ඇල ඉවුර සංරක්ෂණය කිරීම | මහනුවර දි.ලේ.කා. | මහනුවර දි.ලේ.කා. | 30,600 |
| කෑගල්ල දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | කෑගල්ල දි.ලේ.කා | කෑගල්ල දි.ලේ.කා. | 339,000 |
| මඩකලපුව දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | මඩකලපුව දි.ලේ.කා | මඩකලපුව දි.ලේ.කා. | 415,500 |

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| හම්බන්තොට දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | හම්බන්තොට දි.ලේ.කා | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 1,205,500 |
| පුත්තලම දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | පුත්තලම දි.ලේ.කා. | පුත්තලම දි.ලේ.කා. | 498,000 |
| ගම්පහ දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | ගම්පහ දි.ලේ.කා. | ගම්පහ දි.ලේ.කා. | 1,075,375 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | ත්‍රිකුණාමලය දි.ලේ.කා. | ත්‍රිකුණාමලය දි.ලේ.කා. | 917,250 |
| යාපනය දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | යාපනය දි.ලේ.කා. | යාපනය දි.ලේ.කා. | 471,000 |
| වව්නියාව දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | වව්නියාව දි.ලේ.කා. | වව්නියාව දි.ලේ.කා. | 433,000 |
| පුත්තලම දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | පුත්තලම දි.ලේ.කා. | පුත්තලම දි.ලේ.කා. | 100,000 |
| මන්නාරම දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | මන්නාරම දි.ලේ.කා. | මන්නාරම දි.ලේ.කා. | 324,990 |
| යාපනය දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | යාපනය දි.ලේ.කා. | යාපනය දි.ලේ.කා. | 874,400 |
| කළුතර දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | කළුතර දි.ලේ.කා. | කළුතර දි.ලේ.කා. | 80,000 |
| මොණරාගල දිස්ත්‍රික් පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා | මොණරාගල දි.ලේ.කා. | මොණරාගල දි.ලේ.කා. | 2,068,179 |
| කන්දෙතැන්න වැව් රක්ෂිතයේ පැල සිටුවීම හා නඩත්තුව සඳහා | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | 941,525 |

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| ගලමුණේආර දොළ රක්ෂිතය සංරක්ෂණය කිරීම - දෙමටපස්සග්‍රාම නිලධාරී වසම | මාතර දි.ලේ.කා. | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය | 200,000 |
| කුඩා පරිමාණ වාරි වැව් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | කිළිනොච්චි දි.ලේ.කා. | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය | 300,000 |
| හරිත ඵලදායිතා වැඩසටහන - පරිසරයට මුදාහරින අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන | වව්නියාව දි.ලේ.කා. | වව්නියාව දි.ලේ.කා. | 26,000 |
| ඉහළදෙනිය වැව හා එහි රක්ෂිතය සංරක්ෂණ වැඩසටහන - ගල්ලිඳමුල්ල ග්‍රාම නිලධාරී වසම | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - හම්බන්තොට | 115,000 |
| දොරගල පීකොක්හිල් වැව ආශ්‍රිත ප්‍රදේශය සංරක්ෂණ ව්‍යාපෘතිය | මහනුවර දි.ලේ.කා. | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 3,026,291 |
| කන්දෙතැන්න වැව් රක්ෂිතයේ රෝපණය කරන ලද වන පැලආරක්ෂාවට ආරක්ෂිත වැටක් ඉදි කිරීම | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 200,000 |
| රැකව කලපුව සීමා මායිම් යොදා සංරක්ෂණය කිරීම | හම්බන්තොට දි.ලේ.කා. | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1,926,250 |

**1.4 වන සත්ත්ව මිනිස් සහජීවනය හා ජෛව සම්පත් සංරක්ෂණය**

අලි මිනිස් ගැටුම්වලින් තොර සහජීවන කලාප නිර්මාණය කිරීම ඉලක්ක කරගනිමින් පහත සඳහන් වැඩසටහනවන සත්ත්ව මිනිස් සහජීවනය යටතේ ක්‍රියාත්මකයි.

- **ජනවරණ රැකවරණ**

තර්ජනයට ලක්ව ඇති ජීවී විශේෂ 05 ක පැවැත්ම ස්ථාපිත කිරීම හා ජෛව සම්පත් මංකොල්ලය පාලනය කිරීම ඉලක්ක කරගනිමින් පහත සඳහන් වැඩසටහන් ජෛව සම්පත් සංරක්ෂණය යටතේ ක්‍රියාත්මකයි.

- **තර්ජනයට ලක්ව ඇති විශේෂ සංරක්ෂණ වැඩසටහන**
- **ජෛව සම්පත් හරන - වාරන වැඩසටහන**

සමස්ත "පුනරුදය" වැඩසටහන යටතේ ප්‍රගතිය පසු විපරම් කිරීමේ අරමුණෙන් 2017.08.30 දින ජනාධිපති කාර්යාලයේදී පැවති සාකච්ඡාවේදී වන සත්ත්ව හා මිනිස්, සහජීවනය ජෛව සම්පත්

සංරක්ෂණය යන ක්ෂේත්‍රයන්හි ඉලක්කගත අරමුණු ඉටුකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරි සැලසුම් පිළිබඳ අදාල ආයතනයන් සමග සාකච්ඡා කරන ලදී. ජනාධිපති කාර්යාලයෙන් අවැසි සහයෝගය ලබාදීමට ද එහිදී එකඟතාව පලකරන ලදී.

### 1.5 ආයතනික ප්‍රතිව්‍යූහගත කිරීම හා ප්‍රවර්ධනය

පරිසර විෂය පුළුල් පරාසයකින් මෙන්ම එකිනෙක විෂයයන් සහසම්බන්ධ වනනිසා ද සෑම ක්ෂේත්‍රයකම අඩු වැඩි වශයෙන් පරිසර සංරචක පවතින නිසාවෙන් ද, පරිසර සංරක්ෂණ වැඩසටහනකදී ආයතනික සම්බන්ධීකරණය හා ප්‍රවර්ධනය සඳහා ඉහළ අවධානයක් ලබා දිය යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- **පරිසර බලමුළු**
- **පද්ධති ප්‍රතිනිර්මාණය**
- **ජන අඬහැරය**

**ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්යයන් - 2017**

### 1.5.1 පාරිසරික සාක්ෂරතාව වර්ධනය කිරීම

පාර්ශවකාරී ආයතන සම්බන්ධකර ගනිමින් විශේෂයෙන් පාසැල් සිසුන්, ගුරු භවතුන් හා ප්‍රජාව වෙනුවෙන් මේ යටතේ විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති අතර ඒ යටතේ විවිධ වැඩසටහන් රාශියක් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළ ශක්තිමත් කිරීම, පරිසර අධ්‍යාපනය පිළිබඳව නව විෂය නිර්දේශයට අනුකූලව රජයේ පාසල් ගුරුභවතුන් දැනුවත් කිරීම, පාසැල් පුස්තකාල තුළ පරිසර අංශයක් පිහිටුවීම, මෙවර ජනාධිපති පදක්කම්ලාභී පරිසර නියමුභටයින් සඳහා යෝජිත ඉන්දියානු විදේශ ශිෂ්‍යත්ව ලබාදීම යනාදී වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කර ඇත.

එමෙන් ම පාරිසරික වැඩසටහන්වලට අදාල මාධ්‍ය ආවරණය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දීම ද සිදු කෙරුණි.

**පාරිසරික සාක්ෂරතාව වර්ධනය කිරීම - ප්‍රතිපාදන ලබා දීම 2017**

| කාරණය | ප්‍රතිපාදනය ලබා දුන් / ගෙවීම් කරන ලද ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළ ශක්තිමත් කිරීම<br>• පළමු පදක්කම් සකස් කිරීම<br>• සටහන් පොත් මුද්‍රණය කිරීම<br>• ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 2,900,000 |
| පිළිසරු ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක පාරිසරික වැඩසටහන් වලට අදාල මාධ්‍ය ආවරණය සඳහා | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 5,000,000 |
| පරිසර අධ්‍යාපනය පිළිබඳව නව විෂය නිර්දේශයට අනුකූලව රජයේ පාසල් ගුරුභවතුන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | 10,000,000 |
| පාසැල් පුස්තකාල තුළ පරිසර අංශයක් පිහිටුවීම | මහ. සං. හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 1,000,000 |
| පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය ශක්තිමත්කිරීම (පරිසර නියමු හිස් වැසුම් ලක්ෂයක් සකස් කිරීම) | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 9,200,000 |
| මෙවර ජනාධිපති පදක්කම්ලාභී පරිසර නියමු භටයින් සඳහා යෝජිත ඉන්දියානු විදේශ ශිෂ්‍යත්වය සඳහා | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මධ්‍යම පරිසර අධිකාරිය | 1,800,000 |

### 1.5.2 පරිසර සංරක්ෂණය හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දී ඇත. දිස්ත්‍රික් පරිසර සමුළු පැවැත්වීම ද මේ යටතේ සිදුකරන ලද සුවිශේෂී වැඩසටහනකි.

කොළඹ දිස්ත්‍රික් පරිසර සමුළුව 2017.06.20 වන දින මහරගම ජාතික තරුණ සේවා සභා ප්‍රධාන ශාලාවේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සාර්ථක අන්දමින් පවත්වන ලදී. ඒ සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, විදුහල්පතිවරුන්, ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් ඇතුළු 2000 ක පමණ රාජ්‍ය නිලධාරීන් සහභාගී වන ලදී. එසේම ගම්පහ දිස්ත්‍රික් පරිසර සමුළුව 2017.06.30 වන දින ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සාර්ථක අන්දමින් පවත්වන ලදී. ඒ සඳහා ද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්,

විදුහල්පතිවරුන්, ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් ඇතුළු 5000 ක පමණ රාජ්‍ය නිලධාරීන් සහභාගී වන ලදී. එසේම එම කාලසීමාව තුල උග්‍ර ගැටළුවක්ව පැවති කසල කළමනාකරණය හා ඩෙංගු උවදුර පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම මෙම පරිසර සමුළුවල අරමුණ විය.එහිදී ඩෙංගු රෝගය වළකාලීම සහ පාලනය සඳහාවන කඩිනම් අන්තර් පාර්ශවීය වැඩසටහන පිළිබඳවත්, පාසල් පද්ධතිය තුල පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවත්, කසළ කළමනාකරණය පිළිබඳවත් විද්වත් දේශන පවත්වන ලදී. කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක තුළ කසල කළමනාකරණය හා ඩෙංගු මර්දනයට අවශ්‍ය මගපෙන්වීම හා සම්බන්ධීකරණය සමුළුව තුලින් සිදු කරන ලද ප්‍රධානතම කාර්යය විය.







**පරිසර සංරක්ෂණය හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම**

| කාරණය | ප්‍රතිපාදනය දුන් / ගෙවීම් කරන ආයතනය | වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නිදහස් කළ / ගෙවන ලද මුදල රු. |
|---|---|---|---|
| සුරකිමු පරිසරය රැකගමු පොදු දේපල ව්‍යාපෘතිය | හම්බන්තොට දි.ලේ.කා. | හම්බන්තොට දි.ලේ.කා. | 124,425 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක "සැමට සෙවණ" ආදර්ශ ගම්මාන තුළ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | හම්බන්තොට දි.ලේ.කා. | හම්බන්තොට දි.ලේ.කා. | 150,150 |
| තිරසර පරිසර සංරක්ෂණය පිළිබඳව සම්මන්ත්‍රණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | දිස්ත්‍රික් ලේකම් මන්නාරම | දිස්ත්‍රික්ලේකම් මන්නාරම | 125,800 |
| සිරිපා වන්දනාකරුවන් දැනුවත් කිරීම සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් මෙහෙයුම් පද්ධතිය රහිත පරිගණක යන්ත්‍රයක් හා වෝල් මවුන්ට් තිරයක් ලබා ගැනීම | නුවරඑළිය දි.ලේ.කා. | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 176,645 |
| "සැමට සෙවන" නිවාස සංවර්ධන වැඩසටහන යටතේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකළ ආදර්ශ ගම්මාන 06ක් තුළ පැල රෝපණය සහ කසළ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය | හම්බන්තොට දි.ලේ.කා. | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 3,304,020 |
| "සැමට සෙවන" නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකළ සතිරගම ආදර්ශ ගම්මානය තුළ රුක් රෝපණය සහ කසළ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 573,350 |
| කුඩා පරිමාණ සත්ත්ව ගොවිපළ තිරසාර ලෙස සංවර්ධනය කිරීම සඳහා වූ ජීව වායු ජනක ඉදිකිරීම | හම්බන්තොට දි.ලේ.කා. | ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 389,661 |
| ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් බද්ධ කොස් පැලසිටුවීම | රත්නපුර දි.ලේ.කා. | කුරුවිට ප්‍රා.ලේ.කා. | 386,180 |

## 02. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

මත්ද්‍රව්‍ය නිවාරණයට අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධ කර ගනිමින් 2015 වසරේදී **මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය** පිහිටුවන ලද අතර මෙම කාර්ය සාධන බලකාය විසින් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනෙහි සියලු අධීක්ෂණ හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

2014 වසරට සාපේක්ෂව වසර 2020 වන විට ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය හා අලෙවිය 80% කින් අඩු කිරීම, ඒක පුද්ගල මද්‍යසාර භාවිතය 25% කින් අඩු කිරීම හා දුම්කොළ නිෂ්පාදන භාවිතය 50% කින් අඩු කිරීම මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහනේ ප්‍රධාන ඉලක්කයන් වේ. ඒ අනුව මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම මෙන්ම සැපයුම අවම කිරීම පිළිබඳවද අවධානය යොමු කරමින් පහත ප්‍රධාන අංශ 03 යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

1. ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා වැටලීම්
2. ප්‍රතිකාර හා පුනරුත්ථාපනය
3. නිවාරණය

### 2.1 ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා වැටලීම්.

ශ්‍රී ලංකාව තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය හා අලෙවිය පිළිබඳ පවතින නීති රීතිවල කාලීන සංශෝධනයන් සිදු කිරීම මෙන්ම අනෙක් මත්ද්‍රව්‍ය භාවිතය හැකිතාක් අවම කිරීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව “මතින් නිදහස් රටක්” නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය හා නීතිමය වශයෙන් සිදුකළ යුතු ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම, මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් සිදුකරනු ලැබේ.

#### 2.1.1 ත්‍රිවිධ හමුදාව හා පොලීසියේ ක්‍රියාකාරිත්වය

මත්ද්‍රව්‍ය භාවිතය සීග්‍ර ලෙස ව්‍යාප්ත වීමට බලපාන මූලික කරුණක් වන්නේ මත්ද්‍රව්‍ය රට තුළ සුලභ වීමය. එම ව්‍යාප්තිය අවම කිරීම අරමුණු කරගෙන, ත්‍රිවිධ හමුදාව හා ඊට අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරගනිමින් මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා පවතින ගැටළු ඉවත් කර වැටලීම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ද මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් සිදුකෙරේ.

ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය හා ඊට සම්බන්ධ අනෙකුත් ආයතන 2017 වර්ෂය තුළ සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් හා මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් අත්අඩංගුවට ගැනීම් (2017.01.01 සිට 2017.11.21දක්වා)**

| මත්ද්‍රව්‍යය | අත්අඩංගුවට ගැනීම් | සැකකරුවන් | අල්ලා ගන්නා ලද ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| හෙරොයින් | 247 | 264 | 5,257.337(g) | 52,573,370.00 |
| දුම්වැටි | 46 | 47 | 643,882(g) | 8,783,100.00 |
| නීතිවිරෝධී ආසුත ස්ප්‍රීතු | 539 | 587 | 16,340.093(l) | 7,630,823.43 |
| විදේශ මද්‍යසාර | 13 | 27 | 7,930.000(l) | 71,507,980.00 |
| රජයේ අරක්කු | 53 | 56 | 545(bott) | 383,406.50 |
| මත් කරල් | 19 | 20 | 822 | 1,165,130.00 |
| මත් පෙති | | | 10,306 | |
| ගංජා | 434 | 365 | 152.092(kg) | 78,412,864.69 |
| කේරල ගංජා | | | 550,529(kg) | |
| **එකතුව** | **1,351** | **1,366** | - | **220,456,674.62** |

**මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් (වෙනත්) (2017.01.01 සිට 2017.11.20 දක්වා)**

| මත්ද්‍රව්‍ය | හෙරොයින් | | කංසා | | කොකේන් | | හෂීස් | |
|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | නඩු ගණන | ප්‍රමාණය kg | නඩු ගණන | ප්‍රමාණය Kg | නඩු ගණන | ප්‍රමාණය kg | නඩු ගණන | ප්‍රමාණය kg |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය | 169 | 22.852 | 48 | 188.343 | 1 | 2.50 | 4 | 0.285 |
| දිවයින පුරා පොලිස් ස්ථාන | 25,216 | 234.37 | 44,627 | 3433.851 | 14 | 218.639 | 27 | 3.400 |
| වලාන දූෂණ මර්දන ඒකකය | 95 | 0.59 | 35 | 57.676 | - | - | - | - |
| කොළඹ අපරාධ කොට්ඨාසය | 355 | 17.449 | 75 | 6.396 | - | - | - | - |
| බන්ධනාගාරය | 2 | 0.140 | 1 | 0.110 | - | - | - | - |
| ශ්‍රී ලංකා රේගුව | 8 | 8.651 | 0 | 0 | - | - | - | - |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 3 | 27.700 | 5 | 326.300 | - | - | - | - |
| **එකතුව** | **25,848** | **311.752** | **44,791** | **4012.676** | **15** | **221.139** | **31** | **3.685** |

### 2.1.2 දුම්කොළ ගොවීන් වෙනත් වගාවන් වෙත යොමු කිරීම.

දුම්කොළ වගාව අධෛර්යමත් කිරීම සඳහා දුම්කොළ ගොවීන්ට වඩා ආකර්ෂණීය වගාවන් හඳුන්වාදීමේ කටයුතු, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකායේ මඟපෙන්වීම මත ආරම්භකර ඇත.

වසර 2020 වනවිට හෙක්. 2,000 ක පමණ දුම්කොළ වගා කරන ගොවීන් ඉන් ඉවත් කර වෙනත් බෝග සඳහා ක්‍රමිකව යොමු කිරීමට අපේක්ෂා කරන අතර 2017.08.29 වැනි දින පෙ.ව. 9.00 ට ජනාධිපති කාර්යාලයේ පැවති විශේෂ සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ අනුව දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග හඳුන්වාදෙමින් දුම්කොළ ගොවීන් වී, මිරිස්, කව්පි, මුං, කුරහන් වැනි වෙනත් භෝග වගාව කෙරෙහි යොමු කරවීම සඳහා විශේෂ ව්‍යාපෘතියක්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ එක්ව සකස් කරමින් පවතින අතර එම ව්‍යාපෘතිය 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් පවතී .

### 2.1.3 ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙලට අනුව රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන රැසක් සඳහා සෘජු වගකීම් පැවරී ඇති අතර, ඔවුන් හරහා සියලුම රාජ්‍ය ආයතන මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් 2017 වසරේදී මෙම ආයතන සියල්ලම කැඳවා ඔවුන්ගේ ප්‍රගතිය හා ගැටලු පිළිබඳ සාකච්ඡා කොට ඉදිරි වසර කිහිපය සඳහා සැලසුම් සකස් කිරීමද ආරම්භ කෙරිණි.







### 2.1.4 දකුණු ආසියානු කලාපීය බුද්ධිමය හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය හා UNODC ආයතනය සමග එක්ව දකුණු ආසියානු රටවල් කිහිපයක් සමඟ 2017.11.27 හා 28 දෙදින විශේෂ සාකච්ඡාවක් පවත්වා දකුණු ආසියානු කලාපීය බුද්ධිමය හුවමාරු මධ්‍යස්ථානයක් කොළඹ ස්ථාපිත කිරීමට කටයුතු සිදුකරමින් සිටී.

### 2.2 ප්‍රතිකාර හා පුනරුත්ථාපනය.

දිවයින පුරා පිහිටි, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කරනු ලබන මධ්‍යස්ථානයන්හි සිදුකරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන් අධීක්ෂණ කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් සිදුකරනු ලැබේ.

| පුනරුත්ථාපන මධ්‍යස්ථානය | වැඩසටහන් පවත්වන ලද දිනය | සහභාගීත්වය |
|---|---|---|
| පබෝදා මෙත් සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (අඹේපුස්ස) | 2017.06.26 | නේවාසිකයන් 48 |
| තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය (මීගමුව) | 2017.08.21 – 2017.08.30 | නේවාසිකයන් 45 |
| ජයවිරු සමාධි නිවහන, මත්ලෝලී පුනරුත්ථාපන මධ්‍යස්ථානය (අවිස්සාවේල්ල) | 2017.09.15 – 2017.07.25 | නේවාසිකයන් 50 |
| **එකතුව** | | **නේවාසිකයන් 143** |





එසේම කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය හා මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකායේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම සියලු පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි මානව හා භෞතික සම්පත් අවශ්‍යතාවයන් සපුරාලීම, අදාල අමාත්‍යාංශයන් හා සෘජු සම්බන්ධීකරණ කටයුතු ජනාධිපති කාර්යය සාධන බලකාය මඟින් සිදුකරනු ලැබේ.

### 2.2.2 නීතිමය කටයුතු හා පුනරුත්ථාපන කටයුතු පිළිබඳ විශේෂ සාකච්ඡාව

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට සිරගතවූවන් සඳහා නීතිමය කටයුතු හා පුනරුත්ථාපන කටයුතු පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2017.10.30 දින පැවති අතර එහිදී හඳුනාගත් ගැටලු සඳහා විසඳුම් සාකච්ඡා කිරීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් දීමද සිදු කෙරිණ.

### 2.3 නිවාරණය
### 2.3.1 විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන දිස්ත්‍රික් මට්ටමෙන් පැවැත්වීම.

“ මතින් නිදහස් රටක්” යන තේමාව යටතේ ජාතික වැඩසටහන් 08 ක් (ගම්පහ, ගාල්ල, කෑගල්ල, කොළඹ, කුරුණෑගල, නුවරඑළිය, පුත්තලම හා යාපනය) 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර 2017.07.19 වැනි දින කළුතර දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන පානදුර නගර සභා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.





මෙම දිස්ත්‍රික් වැඩසටහන් තුළින් මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිඵල හා ඉන් වැළකීමෙන් අත්වන යහපත පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමත්, මද්‍යසාර හා දුම්වැටි සමාගම් සිදු කරන මිථ්‍යාචාරවලට එරෙහිව මහජනතාව අවදි කරවීමත්, මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ආදීනව අවබෝධ කරගනිමින් ඒවා ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් බලාත්මක කිරීමත් සිදු කෙරේ.

### 2.3.2 දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීම.

මේ වනවිට දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 25 ක් ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 331 ක් හා ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 14022ක් පිහිටුවා ඇති අතර, ග්‍රාමීය කමිටු වල ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් මට්ටමින්ද ප්‍රාදේශීය කමිටු වල ප්‍රගතිය දිස්ත්‍රික් කමිටු මගින්ද නිරීක්ෂණය කෙරේ. මෙම කමිටු හරහා "මතින් නිදහස් නිවසක්" නිර්මාණය කිරීමත්, එවැනි පවුල් වල එකමුතුවෙන් "මතින් නිදහස් ගමක්" සැකසීමත් අවසානයේදී "මතින් නිදහස් රටක්" ගොඩ නැගීමත් අපේක්ෂා කෙරේ. ඒ සඳහා මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිඵල හා ඉන් වැළකීමෙන් අත්වන යහපත පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමත්, මද්‍යසාර හා දුම්වැටි සමාගම් සිදු කරන මිථ්‍යා ප්‍රචාරණ වලට එරෙහිව මහජනතාව අවදි කරවීමත්, මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ආදීනව අවබෝධ කරගනිමින් ඒවා ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් බලාත්මක කිරීමත් සිදු කෙරේ.

**මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (2017)**







| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ප්‍රා/ලේ/කො ගණන | වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ග්‍රා/නි/කො ගණන | සහභාගීත්වය |
|---|---|---|---|---|
| 01 | මහනුවර | 01 | 80 | 4241 |
| 02 | කළුතර | 14 | 762 | 23021 |
| 03 | රත්නපුර | 02 | 74 | 9487 |
| 04 | පොළොන්නරුව | 01 | 45 | 1416 |
| 05 | මාතලේ | 01 | 39 | 1462 |
| 06 | බදුල්ල | 01 | 35 | 1280 |
| 07 | මඩකලපුව | 01 | 17 | 1278 |
| 08 | කුරුණෑගල | 04 | 171 | 5416 |
| 09 | පුත්තලම | 16 | 548 | 26558 |
| 10 | අනුරාධපුරය | 06 | 243 | 7505 |
| **එකතුව** | | **47** | **2014** | **81,664** |

### 2.3.3 මත්ද්‍රව්‍ය නිවාරණ තාක්ෂණික නිලධාරි සංචිතයක් නිර්මාණය කිරීම

මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවලට අයත් සාමාජිකයින්ගෙන් තෝරාගත් පිරිසක් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමින් යුත් පුහුණුකරුවන් බවට පත් කරමින් පුහුණු සංචිතයක් ගොඩ නගා, ඔවුන් හරහා ප්‍රජාව බලගැන්වීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ.

මේ වනවිට දිස්ත්‍රික් මට්ටමින් පුහුණුකරුවන් 100(25x4) කින්ද, ප්‍රාදේශීය මට්ටමින් පුහුණුකරුවන් 1,986(331x6) කින්ද ග්‍රාමීය මට්ටමින් පුහුණුකරුවන් 70,110(14,022x5) කින්ද යුත් පුහුණු සංචිතයක් නිර්මාණය වී ඇත.















**2.3.5 මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලයෙන් චක්‍රලේඛ හා විශේෂ ලිපි නිකුත් කිරීම**

- ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය ප්‍රකාශයට පත්කිරීම

(සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත) - චක්‍රලේඛ අංකය SP/DSP/DP/13/17

- ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය ප්‍රකාශයට පත්කිරීම

(සියලුම රාජ්‍ය ආයතන වෙත) - චක්‍රලේඛ අංකය SP/DSP/DP/14/17

- මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික ප්‍රතිපත්ති හා ක්‍රියාකාරි වැඩපිළිවෙල යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයේ කාර්ය භාරය

ලිපි අංකය HAF/Add.sec/01/ මත්ද්‍රව්‍ය

- ප්‍රජා පොලිස් කමිටුව, ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව ලෙස බලගැන්වීම

චක්‍රලේඛ අංකය SP/DSP/DPU/19/17

**2.3.6. පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්**

- “තිරසර පාසල් වැඩසටහන යටතේ” දිවයිනේ පාසල් තුළ “තිරසර පාසල් කමිටු” 3409 ක් පිහිටුවා ඒ යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 3409 ක් පිහිටුවා ඇත. මෙම සෑම කමිටුවක් සඳහාම එක් ගුරුවරයෙක් හා පාසල් 3409 හි ම විදුහල්පතිවරයා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ විශේෂයෙන් පුහුණු කර ඇත.
- පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම

දිවයිනේ පාසල් මගින් සංවිධානය කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා සෘජු සම්පත්දායකත්වය ලබා දීම මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් සිදුකරන ලද අතර එම වැඩසටහන්වලදී මත්ද්‍රව්‍ය භාවිතයේ අහිසි ප්‍රතිඵල හා ඉන් වැළකීමෙන් අත්වන යහපත, මද්‍යසාර සහ දුම්කොළ සමාගම් විසින් සිදු කරගෙන යන මිථ්‍යා ප්‍රචාරණ , මාධ්‍ය මඟින් සිදු කරනු ලබන ප්‍රචාරණ, මත්ද්‍රව්‍යවල මවා දක්වන ආකර්ෂණීයත්වයේ සැබෑ තත්ත්වය පිළිබඳව පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ කටයුතු සිදුකර ඇත.

සෘජු සම්පත්දායකත්වය ලබා දී ක්‍රියාත්මක කරන ලද පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

| **දිනය** | **වැඩසටහන පවත්වන ලද ස්ථානය** | **සහභාගී වූ සිසුන් ගණන** |
|---|---|---|
| 2017.04.08 | මහනුවර ගේට්වේ විද්‍යාලය (රෝටරැක්ට් සංගමය ) | 100 |
| 2017.05.16 | කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේදී (රතු කුරුස සංගමය) | 1000 |
| 2017.06.04 | මහියංගන මහජන ක්‍රීඩාංගණයේදී | 2000 |
| 2017.07.03 | කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයේ (මත්ද්‍රව්‍ය නිවාරණ සංගමය විසින්) ප්‍රධාන ශාලාවේ දී | 400 |
| 2017.07.04 | අවිස්සාවේල්ල සීතාවක මධ්‍ය මහා විද්‍යාලයේ 9/10 ශ්‍රේණිවල සිසු දරුවන් | 700 |
| 2017.07.04 | අවිස්සාවේල්ල සීතාවක මධ්‍ය මහා විද්‍යාලයේ 12,13 ශ්‍රේණිවල සිසු දරුවන් | 100 |
| 2017.07.05 | කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයේ (මත්ද්‍රව්‍ය නිවාරණ සංගමය විසින්) ප්‍රධාන ශාලාවේ දී | 250 |
| 2017.07.06 | බප/හෝ සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයේදී 8,9,10 ශ්‍රේණියේ සිසුදරුවන් | 400 |
| 2017.07.06 | බප/හෝ සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයේදී 12,13 ශ්‍රේණියේ සිසුදරුවන් | 200 |
| 2017.07.24 | බප/කැල/බියගම මද්‍ය මහා විද්‍යාලයේදී 10, 11 ශ්‍රේණියේ සිසුදරුවන් | 200 |
| 2017.07.27 | බප/තෙල්/කුඹුක්ගොල්ල කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රාථමික ශ්‍රේණිවල සිසු දරුවන් | 20 |
| 2017.09.22 | බප/කළු/බේ/පාදාගොඩ මහා විද්‍යාලයේ 9,10,11,12 හා 13 ශ්‍රේණිවල සිසු දරුවන් | 400 |










තවද පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු නිවැරදි දිශාවක් ඔස්සේ ප්‍රතිඵලදායී නිවාරණ ක්‍රියාවලියකට යොමු කිරීම සඳහා පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ උපදෙස් සංග්‍රහයක් ද සකස්කර ඇත.



**2.3.7 ජාතික ශිෂ්‍ය  බට බලකාය හා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හරහා පාසල් ප්‍රජාව අතර මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රවර්ධනය කිරීම**

පාසැලක ක්‍රියාකාරී, ආකර්ෂණීය සිසු සිසුවියන් හරහා පාසැල් ප්‍රජාව අතරට මත්ද්‍රව්‍ය නිවාරණය ගෙනයාම මෙහි අරමුණයි. ඒ සඳහා ජාතික ශිෂ්‍ය භට බලකායේ හා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ විෂය නිර්දේශ තුළට මත්ද්‍රව්‍ය නිවාරණය ඇතුලත් කොට නව පදක්කම් හඳුන්වා දී ශිෂ්‍ය සාමාජික සාමාජිකාවන් මේ සඳහා අභිප්‍රේරණය කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී.

ඒ යටතේ ශිෂ්‍ය භට බලකා උපදේශකවරුන් පුහුණු කිරීම සහ රන්ටැඹේ කඳවුර ආදී විශේෂ අවස්ථාවල දරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.





### 2.3.8. නවක විශ්ව විද්‍යාල සිසුන් බලගැන්වීමේ වැඩසටහන්

මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිඵල හා ඉන් වැළකීම පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5,700 ක් වැඩසටහන් මාලා 16ක් මගින් 2016 වර්ෂයේදී දැනුවත් කරන ලද අතර 2017 වර්ෂයේදී වැඩසටහන් දෙකක් මගින් සිසුන් 900 ක් දැනුවත් කරන ලදී.







**නවක විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම සඳහා 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

| දිනය | දිස්ත්‍රික්කය | වැඩසටහන පවත්වන ලද ස්ථානය | සහභාගී වූ සිසුන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| 2017.01.06 | කොළඹ | මහරගම තරුණ සේවා සභාව | 400 | 138,500.00 |
| 2017.01.07 | මාතර | මාතර බෞද්ධ විද්‍යාලය | 500 | 415,100.00 |
| දැනුවත් කරනු ලැබූ මුළු සිසුන් ගණන/ මුළු වියදම | | | 900 | 553,600.00 |

### 2.3.9. දහම් පාසල් කල්‍යාණ මිත්‍ර සමාජ වැඩසටහන හරහා සිසුන් බලගැන්වීම

බොදු ගුණ නැණින් යුත් දහම් පාසල් දරුවන්ගේ නායකත්වය තුළින් තම මිතුරන් සහ ප්‍රජාව මතින් නිදහස් කර ගැනීම අරමුණු කර ගනිමින් බුද්ධ ශාසන අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, ශාසනාරක්ෂක බල මණ්ඩලය හා එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ වනවිට දහම් පාසල් මට්ටමින් කල්‍යාණ මිත්‍ර සමාජ කමිටු 10,018 ක් පිහිටුවා ඇත.

ඊට සමගාමීව කල්‍යාණ මිත්‍ර සමාජ කමිටු නිවැරදි දිශාවක් ඔස්සේ ප්‍රතිඵලදායී නිවාරණ ක්‍රියාවලියකට යොමු කිරීම සඳහා දහම් පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ උපදෙස් සංග්‍රහයක් ද සකස් කර ඇත.






## 2.3.10. විශේෂ අවස්ථා පදනම් කරගනිමින් දියත් කෙරෙන වැඩසටහන්

- **"මතින් නිදහස් රටක්" පාගමන හා ජාතික සරුංගල් උත්සවය**

මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් 2016 වර්ෂයේ සිට රොටරි ආයතනය හා Kite Sri Lanka ආයතනය සමඟ එක්ව ජාතික සරුංගල් උත්සවය හා පාගමන පවත්වන ලදී. 2017 වසරේදී එය මීගමුව වෙරළ තීරයේදී අගෝස්තු 12, 13 දිනයන්හිදී පවත්වන ලදී.















- **මැයි 31, ලෝක දුම්වැටි නිවාරණ දිනයට සමගාමී වැඩසටහන්**

සියලුම රාජ්‍ය ආයතන තුළ විවිධ වැඩසටහන් පැවැත්වීමටත් බැනර්, පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමටත් චක්‍රලේඛයක් මඟින් උපදෙස් ලබා දීම. ඊට සමගාමීව විවිධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළු පැවැත්වීම මේ දිනයට සමගාමීව සිදුකරන ලදී.

- **පොහෝ දින හා කතරගම පෙරහැර ආදී ආගමික උත්සවවලට සමගාමී විශේෂ වැඩසටහන්**

පොසොන් පොහොයට සමගාමීව අනුරාධපුර පොසොන් කලාපය මතින් තොර කලාපයක් බවට පත්කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, බැනර් පෝස්ටර් ප්‍රදර්ශන, වීදි නාට්‍ය රඟ දැක්වීම, නීති කඩ කරන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම ද සිදු කෙරිණි.
කතරගම මහා දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය, මහනුවර දළදා පෙරහැර ආදී ආගමික උත්සවවලට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ද දියත් කෙරිණ.

- **රාජ්‍ය නොවන ආයතන හා අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.**

ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ අනුබද්ධිත ආයතන ආදී ජාත්‍යන්තර සංවිධාන මෙන්ම මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය, හෙල්දි ලංකා ආයතනය වැනි රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් විවිධ කටයුතු සිදු කරනු ලබයි.

එමෙන්ම ජාතික සහ අන්තර්ජාතික සමුළු සඳහා පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරනු ලැබූ අතර ඉන් වාර්තා පහත සමුළු සඳහා තේරී පත් විය.




උදා: Symposium of International Cancer Society 2018 - Nepal
Scientific Symposium 2018 -ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
IFNGO Awards 2017
Presenting at the UNODC even

- **රජරට විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාල සමඟ එක්ව කෙරෙන සමීක්ෂණ**

මහජනතාව ඉලක්ක කරගනිමින් මද්‍යසාර හා දුම්වැටි කර්මාන්ත විසින් ප්‍රචාරය කරනු ලබන මිත්‍යා මත හා අසත්‍ය දත්ත හා තොරතුරු විද්‍යාත්මක පදනමක් යටතේ ප්‍රතික්ෂේප කිරීමටත් ඒවායේ සත්‍ය දත්ත ඉදිරිපත් කිරීමටත්, මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ ප්‍රගමනයටත් පර්යේෂණ සිදු කිරීම අත්‍යවශ්‍යවේ. ඒ අනුව රජරට විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාල සමඟ එක්ව පර්යේෂණ කිහිපයක් සිදු කෙරේ.

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය තුළින් නිවාරණ කටයුතු සිදු කිරීම






| වැඩසටහන | ප්‍රචාරය වූ වාර ගණන |
|---|---|
| **පොහෝදින මත්ද්‍රව්‍ය නිවාරණ ගුවන් විදුලි වැඩසටහන (පැය 1)**<br>2017 වෙසක් පොහොය සිට 2017 උදුවප් පොහොය දක්වා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එක් වැඩසටහනක් සඳහා රු.70,380.00 බැගින් ගෙවීම් සිදු කරන ලදී. | **08** |
| **පොහෝදින මත්ද්‍රව්‍ය නිවාරණ ගුවන් විදුලි දැන්වීම් (තත්.60x5 + තත්.30x2 + තත්.20 x28)** | **280** |
| **ගුවන් විදුලි කෙටි දැන්වීම්(සිටි එෆ්.එම්. හා ස්වදේශීය සේවය)**<br>(2017 ජූනි සිට 2017 දෙසැම්බර් දක්වා ප්‍රචාරණය කරන ලද අතර මාස දෙකක් සඳහා රු.1,200,000.00 බැගින් ගෙවීම් සිදු කරන ලදී.) | **එක් නාලිකාවක 2880 වාරයක් බැගින්** |
| **ලෝක ළමා දින විදුලි ගුවන් විදුලි වැඩසටහන (පැය 1)**<br>(වියදම රු.200,000.00) | 01 |
| **ලෝක ළමා දින ගුවන් විදුලි දැන්වීම් (තත්.60x5 + තත්.30x2 + තත්.20 x28)** | 35 |
| **රූපවාහිනී දැන්වීම් - ජාතික රූපවාහිනිය (තත්.45)** | 195 |
| **- සියත (තත්.45)** | 27 |
| **- ස්වාධීන රූපවාහිනී සේවය (තත්.45 x19 + තත්.5 x27)** | 46 |
| **සිරස(තත්.45 x16+ තත්.5 x34)** | 50 |
| **අයි.සී.සී.ශූරයින්ගේ කුසලතා තරඟාවලිය අතරතුර දැන්වීම් (තත්.10)**<br>(වියදම රු.1,173,000.00) | 1500 |
| **නොමිලේ - Y එෆ්.එම් ගුවන් විදුලි දැන්වීම්** | 180 |
| **සිළුමිණ(වියදම-රු.115,000.00), තරුණයා - (වියදම - රු.46,000.00), සිරිකත පුවත්පත් දැන්වීම් - (වියදම - රු.120,750.00)** | 23 |
| **මුළු දැන්වීම්** | **8105** |







එමෙන්ම මාධ්‍ය සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා මඟින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සිදු කෙරේ.

- **සමාජ වෙබ් ජාල හරහා නිවාරණ කටයුතු සිදු කිරීම**

මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සමාජ ජාලා හරහා පැතිරවීමද අද කාලයේ අවශ්‍යතාවයකි. අපගේ ෆේස්බුක් අඩවිය හා වෙබ් පිටුව හරහා අප වෙත යෝජනා, අදහස් එවිය හැකි අතර අප විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳවද යාවත්කාලීන කරනු ලබයි.

**මත්ද්‍රව්‍ය නිවාරණ ආධාරක තුළින් ජනතාව දැනුවත් කිරීම**

| ආධාරක | මුද්‍රණය | බෙදාහැරීම |
|---|---|---|
| අත්පත්‍රිකා | 1173600 | 516733 |
| පෝස්ටර් | 880700 | 626408 |
| බැනර් | 2166 | 822 |
| ස්ටිකර් | 292500 | 180610 |




ඔවුන්ගේ ඉලක්කය
ඔබේ පාසල් දරුවාය
අරක්කු, සිගරට් සමාගම් වල
උපක්‍රමවලට
එරෙහි වන්න
මතින් නිදහස් රටක්


අපේ මඟුල,
අපේ විදිහට.....
අපි දෙන්නගෙ
ජීවිතේ
ලස්සනම දවසේ
අපේ යාළුවොත්
සතුටින් ඉන්න
ඕන නිසා,
අපි නම්
වෙඩිං එකට
අරක්කු, බියර්
දෙන්නෙ නෑ.
මතින් නිදහස් රටක්




Still wondering why you got
rejected?
# bad breath
#pale look
#kissing tastes bad
#stained teeth
#always impatient
#bad smell
Not only that...
Now all the girls know that
Smoking causes sexual impotence !
මතින් නිදහස් රටක්
Presidential Secretariat

### 03. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

**දැක්ම**

නිදන්ගත වකුගඩු රෝගය තවදුරටත් වැළැක්වීම හා වකුගඩු රෝගීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධනය

**මෙහෙවර**

අවශ්‍ය දැනුම ලබාදීම හා නිරවද්‍ය ක්‍රමවේදයන් යොදා ගැනීම,රෝගය වැළැක්වීම හා ප්‍රතිකාර ලබාදීම සහ පීඩාවට පත්වූවන්ගේ සුබ සාධනය හා සම්බන්ධීකරණ ක්‍රියාදාමයක් මගින් සහතික වීම

**හැඳින්වීම**

1990 දශකයේදී පමණ මෙරට මූලික වශයෙන්ම රජරට ප්‍රදේශයෙන් හඳුනාගත් මෙම වකුගඩු රෝගය මේ වන විට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත. මෙම රෝගීන් උතුරු මැද පළාත, ඌව පළාත, වයඹ පළාත, උතුරු පළාත, මධ්‍යම පළාත සහ නැගෙනහිර පළාත යන පළාත්වල වැඩිවශයෙන් ව්‍යාප්ත වී ඇත. මීට අමතරව මේ වන විට දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද රෝගීන් වාර්තා වී තිබේ. දිස්ත්‍රික්ක වශයෙන් සළකා බැලීමේදී මෙම රෝගය ප්‍රධාන දිස්ත්‍රික්ක 11ක (අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මාතලේ, වව්නියාව, බදුල්ල, හම්බන්තොට, අම්පාර, මොණරාගල, මුලතිව්, ත්‍රිකුණාමලය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 60ක ජනතාවට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය තවදුරටත් ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහාත් එම රෝගය නිසා පීඩා විඳින රෝගීන් ඇතුළු පවුල්වල සාමාජිකයින් සඳහා පවතින ගැටලු රාශියක් විසඳීම සඳහාත් වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක වේ.

**මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා වූ වැඩසටහනේ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්**

1. රෝග නිවාරණය සඳහා චර්යා ප්‍රවර්ධනය
2. රෝගීන් පෙර හඳුනා ගැනීමේ කටයුතු
3. රෝගීන්ට ප්‍රතිකාර කිරීම
4. රෝගියා, පවුල සහ ප්‍රජාව සඳහා සුබසාධනය
5. පිරිසිදු පානීය ජලය සම්පාදනය
6. සෞඛ්‍ය ආරක්ෂිත ආහාර සහ පෝෂණය
7. සක්‍රීය, නිරීක්ෂණ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම
8. සමීක්ෂණ, පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්පාදනය

ඉහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් ඔස්සේ වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම මෙරට පාර්ශ්වකාරි අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන් සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කරමින් පවතී. මෙම සියලු කටයුතු මනා සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී පහසුකම් සැපයීම සඳහා වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය පිහිටුවා ඇත.



10 - CM 26894

**2017 වර්ෂය තුළ ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

**3.1 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

- සියලු ආයතන සම්බන්ධීකරණය වූ විධිමත් ක්‍රමවේදයක් තුළින්, එනම් රැස්වීම්, වැඩමුළු, කණ්ඩායම් සාකච්ඡා හා සිද්ධි අධ්‍යයනය මගින් වකුගඩු රෝගය ඇතිවෙන ආකාරය, පැතිරීම හා වැළැක්වීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම. මේ යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 5,578 ක් ක්‍රියාත්මක කරමින් ගොවි ජනතාව, පාසල් සිසුන්, ගුරුවරුන්, තරුණ තරුණියන්, ගැබිණි මාතාවන්, ගෘහණියන්, ප්‍රජා සංවිධාන, රාජ්‍ය නිලධාරීන් ඇතුලුව පුද්ගලයින් 1,380,647 දෙනෙකු දැනුවත් කිරීම සිදු කොට ඇත.

**දැනුවත් කරන ලද ජනගහනය දිස්ත්‍රික් වශයෙන් - 2017**

| දිස්ත්‍රික්ක | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | දැනුවත් කරන ලද ජනගහනය |
|---|---|---|
| අනුරාධපුරය /පොළොන්නරුව | 865 | 274,410 |
| කුරුණෑගල/පුත්තලම | 1,177 | 268,060 |
| බදුල්ල / මොණරාගල | 639 | 98,965 |
| අම්පාර/ත්‍රිකුණාමලය | 499 | 117,181 |
| නුවර /මාතලේ | 1,302 | 225,793 |
| මුලතිව්/ වව්නියා | 302 | 91,080 |
| කොළඹ/ ගම්පහ | 460 | 181,058 |
| ගාල්ල/ හම්බන්තොට/මාතර | 329 | 121,700 |
| රත්නපුරය/ කෑගල්ල | 05 | 2,400 |
| **එකතුව** | **5,578** | **1,380,647** |

**විද්‍යුත් මාධ්‍ය තුළින් දැනුවත් කිරීම**

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ගුවන් විදුලි නාලිකා 12ක දිනකට විකාශන වාර 5 බැගින් 2017 අගෝස්තු 16 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා වකුගඩු රෝග නිවාරණය පිළිබඳව හා වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ වැඩසටහන් සඳහා සහභාගී වීමේ වැදගත්කම පිළිබඳ දැන්වීම් ප්‍රචාරණය
- ගුවන්විදුලි සම්මුඛ සාකච්ඡා පැවැත්වීම. (සුභාරතී ගුවන් විදුලි වැඩසටහන)

**මුද්‍රිත මාධ්‍ය තුළින් දැනුවත් කිරීම**

- වකුගඩු රෝගය පිළිබඳ විශේෂ ලිපි ඇතුලත් ආරෝග්‍යා සඟරාව මුද්‍රණය කොට බෙදාහැරීම
- වකුගඩු රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහ විද්වතුන්ගේ ලිපි ඇතුලත් කොට සකසන ලද ශාස්ත්‍රීය සංග්‍රහය පොත මුද්‍රණය කොට බෙදාහැරීම
- ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය
- වකුගඩු රෝග නිවාරණය පිළිබඳ අත්පත්‍රිකා, පෝස්ටර් හා බැනර් මුද්‍රණය කොට බෙදාහැරීම

**දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වැයවූ වියදම - 2017**

| **කාරණය** | **වියදම (රුපියල්)** |
|---|---|
| ආරෝග්‍යා සඟරා 3000ක් මුද්‍රණය | 70,000 |
| ශාස්ත්‍රීය සංග්‍රහය මුද්‍රණය | 1,048,340 |
| දැනුවත් කිරීමේ අත් පත්‍රිකා මුද්‍රණය | 2,519,650 |
| දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය | 492,000 |
| ගුවන් විදුලිය මගින් දැනුවත් කිරීමේ දැන්වීම් ප්‍රචාරණය | 1,085,700 |
| වකුගඩු රෝගය පිළිබඳ පාසල් සිසුන් අතර දැනුම මිනුම තරඟ වැඩසටහන් පැවැත්වීම | 42,500 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 650,000 |
| වකුගඩු රෝගය පිළිබඳ ප්‍රදර්ශන හා චිත්‍ර ප්‍රදර්ශන පැවැත්වීම | 29,400 |
| **එකතුව** | **5,937,590** |





**චිත්‍ර ප්‍රදර්ශනය - ගිරාඳුරුකෝට්ටේ**





**විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**






### 3.2 වකුගඩු රෝගීන් පෙර හඳුනා ගැනීමේ කටයුතු

රෝග ලක්ෂණ බාහිරව නොපෙන්වන මූලික අවධිවලදී රෝගය හඳුනාගැනීමෙන් අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හා වෛද්‍ය උපදෙස් නිසි ආකාරව පිළිපැදීමට රෝගීන්ට උපදෙස් ලබා දිය හැක. මෙම අරමුණින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ජනාධිපති කාර්යාලයේද සහාය ඇතිව වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ක්‍රියාත්මක කරන ලද පෙර හඳුනාගැනීමේ වැඩසටහන් - 2017

| **දිස්ත්‍රික්කය හා රෝගී අවදානම සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස** | **ඉලක්කගත ජනගහනය** | **පරීක්ෂා කරන ලද ජනගහනය** |
|---|---|---|
| අනුරාධපුරය ( සියලුම ප්‍රා/ලේ කොට්ඨාස) | 607,323 | 188,154 |
| පොළොන්නරුව (සියලුම ප්‍රා/ලේ කොට්ඨාස) | 271,000 | 101,206 |
| බදුල්ල (ගිරාඳුරුකෝට්ටේ, රිදීමාලියද්ද, මහියංගනය) | 119,885 | 47,736 |
| අම්පාර(දෙහිඅත්තකණ්ඩිය, මහ ඔය) | 59,076 | 43,161 |
| කුරුණෑගල (පොල්පිතිගම, ඇහැටුවැව, ගිරිබාව, කොටවෙහෙර, මහව, නිකවැරටිය) | 286,306 | 72,954 |
| මාතලේ (විල්ගමුව, නාඋල, පල්ලේගම, ගලේවෙල, දඹුල්ල) | 75,459 | 56,149 |
| මොනරාගල (බුත්තල, වැල්ලවාය, තණමල්විල) | 106,963 | 29,859 |
| මුලතිව් (වැලිඔය, මලාවි) | 18,879 | 22,453 |
| ත්‍රිකුණාමලය (පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, කන්තලේ) | 54,472 | 19,460 |
| වව්නියාව(වව්නියාව, වව්නියාව දකුණ, වෙට්ටිකුලම්) | 116,160 | 29,666 |
| හම්බන්තොට (තිස්සමහාරාමය, සූරියවැව, අඟුණකොලපැලැස්ස, ලුණුගම්වෙහෙර) | 403,640 | 41,553 |
| මහනුවර(හසලක) | 38,556 | 25,309 |
| **එකතුව** | **2,157,719** | **677,660** |





**වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ සායන පැවැත්වීම**

## 3.3 පිරිසිදු පානීය ජලය ලබා දීම.

අවදානම් ප්‍රදේශවල මහජනයා වෙත පිරිසිදු පානීය ජලය සම්පාදනය කිරීම තුළින් වකුගඩු රෝගය මෙන්ම ජලය ආශ්‍රිතව ඇතිවිය හැකි වෙනත් රෝගාබාධවලින් සුරක්ෂිත කිරීම අපේක්ෂා කෙරේ. මේ යටතේ වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් පාර්ශ්වකාරී ආයතන සමඟ ඒකාබද්ධව පිරිසිදු පානීය ජල සම්පාදනය සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති (RO plants) ලබා දීම.
- විශාල වැසි ජල ටැංකි ඉදි කිරීම.
- පවතින ජල සම්පාදන ක්‍රමවල සේවා දීර්ඝ කිරීම.
- පවතින ජල සම්පාදන ක්‍රම පුනරුත්ථාපනය කිරීම.
- ගෘහස්ථ ජල පෙරණ යන්ත්‍ර ලබා දීම.
- ජලයේ ගුණාත්මකභාවය සහ ජල සැපයුම් ක්‍රමවල තාක්ෂණික යෝග්‍යතාවය පරීක්ෂාව හා අධීක්ෂණය

**ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති ලබාදීම - 2017 වර්ෂය**

| **දිස්ත්‍රික්කය** | **ජල පද්ධති සංඛ්‍යාව** | **වියදම (රුපියල්)** |
|---|---|---|
| මොණරාගල | 16 | 24,330,684.76 |
| යාපනය | 03 | 4,566,214.15 |
| කුරුණෑගල | 17 | 25,875,190.85 |
| වව්නියාව | 2 | 3,044,140.10 |
| මහනුවර | 1 | 2,080,300.00 |
| අනුරාධපුරය | 43 | 65,700,322.65 |
| බදුල්ල | 16 | 24,353,120.80 |
| මුලතිව් | 02 | 3,044,140.10 |
| පොළොන්නරුව | 02 | 3,044,140.10 |
| පුත්තලම | 01 | 1,522,070.05 |
| **එකතුව** | **120** | **183,435,514.41** |






**ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධතීන්හි විදුලි බිල්පත් පියවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම**

| **දිස්ත්‍රික්කය** | **වෙන්කර ඇති මුදල (රුපියල්)** |
|---|---|
| මාතලේ | 1,287,430 |
| මොණරාගල | 870,000 |
| කුරුණෑගල | 608,549 |
| වව්නියාව | 540,000 |
| හම්බන්තොට | 36,000 |
| අනුරාධපුරය | 4,381,092 |
| බදුල්ල | 1,278,000 |
| මුලතිව් | 108,000 |
| පොළොන්නරුව | 1,404,000 |
| ත්‍රිකුණාමලය | 144,000 |
| **එකතුව** | **10,657,071** |

මීට අමතරව අවදානම් දිස්ත්‍රික්ක සඳහා වැසි ජල ටැංකි හා ගෘහස්ථ ජල පෙරණ ලබා දීම සිදුකර ඇත.

**වැසි ජල ටැංකි ලබා දීම - 2017 වර්ෂය**

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|
| අනුරාධපුරය | 85 | 425 | 8,165,077 |
| මාතලේ | 10 | 50 | 774,500 |
| හම්බන්තොට | 50 | 250 | 4,802,986 |
| **එකතුව** | **145** | **725** | **13,742,563** |

**ගෘහස්ථ ජල පෙරණ ලබා දීම - 2017 වර්ෂය**

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|
| අනුරාධපුරය | 800 | 4,000 | 3,600,000 |
| වව්නියාව | 100 | 500 | 450,000 |
| බදුල්ල | 276 | 1,380 | 1,242,000 |
| කුරුණෑගල | 302 | 1,510 | 1,488,415 |
| පුත්තලම | 351 | 1,700 | 1,729,913 |
| **එකතුව** | **1,829** | **9,090** | **8,510,328** |





**පිරිසිදු පානීය ජල සම්පාදනය**

## 3.4 රෝගියා, පවුල සහ ප්‍රජාව සඳහා සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වකුගඩු රෝගයෙන් මව/පියා අහිමි වූ අ.පො.ස. (උ/පෙ) හදාරන දරුවන් සඳහා එක් අයෙකුට රු. 3000.00 බැගින් දීමනාවක් (ජනාධිපති අධ්‍යාපනික ශිෂ්‍යත්ව) ලබාදීම වකුගඩු අරමුදල මගින් සිදු කෙරේ. මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සවිබල ගැන්වීම, සුබසාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ද සහාය දක්වනු ලැබේ.

**ශිෂ්‍යත්ව ලබාදීම - 2017**

| දිස්ත්‍රික්කය | ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රුපියල්) |
|---|---|---|
| අනුරාධපුරය | 52 | 1,108,000 |
| අම්පාර | 04 | 112,000 |
| කුරුණෑගල | 02 | 68,000 |
| ත්‍රිකුණාමලය | 19 | 514,000 |
| පොළොන්නරුව | 08 | 248,000 |
| බදුල්ල | 23 | 560,000 |
| මාතලේ | 05 | 146,000 |
| මුලතිව් | 04 | 112,000 |
| මොනරාගල | 02 | 56,000 |
| වවුනියාව | 09 | 258,000 |
| **එකතුව** | **128** | **3,182,000** |









**විවිධ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය මගින් අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් වෙත රු.3,000 ක ජීවනාධාර මුදලක් ලබා දීම සිදු කරන ලදි. මෙම මුදල ප්‍රමාණවත් නොවන බැවින් 2017 ජූනි මස සිට එය රු.5,000 දක්වා කරන ලදි.

**ආධාර ලබා දෙන අඩු ආදායම්ලාභී රෝගී සංඛ්‍යාව - 2017**

| **දිස්ත්‍රික්කය** | **ආධාර ලබාදෙන රෝගීන් සංඛ්‍යාව** |
|---|---|
| අනුරාධපුරය | 8,607 |
| පොළොන්නරුව | 4,447 |
| මාතලේ | 1,754 |
| ත්‍රිකුණාමලය | 603 |
| අම්පාර | 957 |
| වවුනියාව | 1,807 |
| කුරුණෑගල | 1,250 |
| මුලතිව් | 485 |
| හම්බන්තොට | 181 |
| **එකතුව** | **20,091** |

**නිවාස ලබාදීම හා අලුත්වැඩියාව**

මේ යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් වෙත නිවාස ආධාර ලබා දෙනු ලබන අතර පහත වගුව මගින් දක්වා ඇත්තේ 2017 වර්ෂය තුල නිවාස සංවර්ධන අධිකාරිය මගින් එලෙස ලබා දෙන නිවාස ආධාර පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවකි.

| **දිස්ත්‍රික්කය** | **පවුල් සංඛ්‍යාව** |
|---|---|
| අනුරාධපුරය | 648 |
| පොළොන්නරුව | 355 |
| කුරුණෑගල | 174 |
| වවුනියාව | 105 |
| මාතලේ | 106 |
| බදුල්ල | 48 |
| අම්පාර | 53 |
| ත්‍රිකුණාමලය | 47 |
| මුලතිව් | 20 |
| මොණරාගල | 75 |
| රත්නපුරය | 26 |
| ගම්පහ | 10 |
| කළුතර | 25 |
| මහනුවර | 65 |
| **එකතුව** | **1,757** |

### 3.5 රෝගී ප්‍රතිකාර සඳහා අවශ්‍ය සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය

මේ යටතේ වකුගඩු රෝගීන්ගේ සුබසාධනය උදෙසා වකුගඩු රෝගී සහන සත්කාරක හා සුබසාධන මධ්‍යස්ථාන ඉදිකිරීම සිදුකරයි.

#### 3.5.1 අනුරාධපුර මහ රෝහල් භූමියේ ඉදිකෙරෙන "මෙත්සිරි සෙවණ" වකුගඩු රෝගී සහන සත්කාරක හා සුබසාධන මධ්‍යස්ථානය

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වියදම | රු. මි. 291.8 |
| යුධ හමුදාව ශ්‍රම දායකත්වය සපයන බැවින් රජයට ඉතිරි වන මුදල් | රු. මි. 134.8 |
| සත්‍ය වශයෙන් වැය වන මුදල | රු. මි. 157 |
| ජනාධිපති කාර්යාලය විසින් මෙතෙක් ප්‍රතිපූර්ණය කරන ලද වියදම | රු. මි. 48 |

**යෝජිත නේවාසිකාගාර සංකීර්ණය - අනුරාධපුරය**



**අනුරාධපුරය "මෙත්සිරි සෙවණ" ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල වර්තමාන තත්ත්වය**









**3.5.2 මහනුවර මහ රෝහල් භූමියේ ඉදිකෙරෙන වකුගඩු රෝගී සහන සත්කාරක හා සුබසාධන මධ්‍යස්ථානය**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වියදම | රු. මි. 326.6 |
| යුධ හමුදාව ශ්‍රම දායකත්වය සපයන බැවින් රජයට ඉතිරි වන මුදල් | රු. මි. 108.8 |
| නව ඇස්තමේන්තුගත මුදල | රු. මි. 217.7 |
| ජනාධිපති කාර්යාලය විසින් මෙතෙක් ප්‍රතිපූර්ණය කරන ලද වියදම | රු. මි. 38.6 |



යෝජිත නේවාසිකාගාර

**මහනුවර වකුගඩු රෝගී සහන සත්කාරක හා සුඛසාධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වල වර්තමාන තත්ත්වය**




**3.5.3 චීන ජනරජයේ ආධාර මත ඉදි කෙරෙන පොළොන්නරුව චීන ශ්‍රී ලංකා මිත්‍රත්ව ජාතික වෘක්කවේද විශේෂ රෝහල ඉදිකිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.**

අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි මහජන චීන සමූහාණ්ඩුව විසින් මෙරටට පරිත්‍යාග කරන ලද ජාතික වෘක්කවේද විශේෂ රෝහල සඳහා මුල්ගල තැබීමේ උත්සවය 2017.12.06 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් සිදුකරන ලදී.

රුපියල් මිලියන 12,000ක වියදමකින් ඉදිකෙරෙන මෙම විශේෂ වෘක්කවේද ජාතික රෝහල පහත අංගයන්ගෙන් සමන්විත වේ.

- ඇඳන් 200 ක්
- රුධිර කාන්දුකරණ ඇඳන් 100 ක්
- අංග සම්පූර්ණ ශල්‍යාගාර ඒකකයක්
- වකුගඩු හා අවයව බද්ධ කිරීමේ ඒකකයක්
- නිර්වින්දන ඒකකයක්, ශල්‍ය දැඩි සත්කාරක ඒකකයක් හා වෛද්‍ය දැඩි සත්කාරක ඒකකයක්






**ඉදිකරනු ලබන පොළොන්නරුව වකුගඩු රෝහල**

**වෙනත් සිදුකරන ලද විශේෂ කාර්යයන් - 2017**

| කාරණය | වියදම (රුපියල්) |
|---|---|
| මොලය මියගිය වකුගඩු රෝගීන්ගේ වකුගඩු බද්ධ කරන ලද රෝගීන් සඳහා රජයේ රෝහල් මගින් සාත්තු කිරීමේ කාමර පහසුකම් ලබාගත නොහැකි අවස්ථාවන්හිදී පෞද්ගලික රෝහල් මගින් අදාල පහසුකම් ලබාගැනීම සඳහා ගෙවීම් කිරීම | 998,258 |
| වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ කටයුතු සඳහා රසායනාගාර ශිල්පීන්ට ගෙවීම් කිරීම | 1,967,040 |
| වකුගඩු රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 91,200 |

### 3.6 පර්යේෂණ කටයුතු සිදුකිරීම

මේ යටතේ වකුගඩු රෝගය සඳහා මූලය හඳුනාගැනීම හා රෝග නිවාරණය සම්බන්ධයෙන් සිදුකෙරෙන පර්යේෂණ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදුකරයි. ඒ යටතේ 2017 වර්ෂය තුළ සිදුකරන ලද පර්යේෂණ, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| දිනය | පර්යේෂණය/වැඩමුළුව/ සම්මන්ත්‍රණය | වියදම (රු.මි.) |
|---|---|---|
| 2017.07.13 හා 14 | බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද නිදන්ගත වකුගඩු රෝගයට මූලය හඳුනාගැනීමේ පරීක්ෂණ පාර්ශ්වකරුවන්ගේ සම්මේලනය | 1.1 |
| 2016-2017 වර්ෂ | සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය මගින් සිදුකරන ලද නිදන්ගත වකුගඩු රෝගීන්ගේ පවුල්වල සුබසාධනය නංවාලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග සොයාබැලීමේ සමීක්ෂණය | 1.9 |
| 2017.11.02 | ගාලු මුවදොර හෝටලයේ දී ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සංවිධානය (ANSTO) මගින් පවත්වන ලද වකුගඩු රෝගයට මූලය හඳුනා ගැනීමේ පර්යේෂණ පිළිබඳ සමාලෝචනය හා ඉදිරි කටයුතු පිළිබඳ වැඩමුළුව | ---- |






### 3.7 සක්‍රීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම

වකුගඩු රෝගීන් පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කොට පවත්වාගෙන යාම සඳහා අභ්‍යාසලාභී පරිගණක පුහුණුලාභීන් රෝහල් වෙත අනුයුක්ත කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර පහත වගුව මගින් එය දක්වා ඇත.

| **ආයතනය** | **වියදම (රුපියල්)** |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 225,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය | 75,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | 37,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව | 37,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | 75,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව | 37,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | 262,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | 225,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 150,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 112,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | 150,000 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 112,500 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | 750,000 |
| **එකතුව** | **2,250,000** |

### 3.8 ජාතික වැඩසටහන් පැවැත්වීම

වකුගඩු රෝග නිවාරණය සම්බන්ධව මේ වන විට වව්නියාව, අනුරාධපුර, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්ක වල සමුළු 07ක් පවත්වා ඇති අතර ඉන් දෙකක් 2017 වසරේදී පවත්වන ලදි. මෙම දිස්ත්‍රික් සමුළුවලදී දැනුවත් කිරීම ඇතුළු ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩසටහන් පවත්වනු ලැබේ.

#### 3.8.1 මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලද ජාතික වැඩසටහන

2017 වර්ෂයේ මාර්තු 10 දිනට යෙදී තිබූ "ලෝක වකුගඩු දිනය" ට සමගාමීව 2017.03.13 වන දින විල්ගමුව නාමිණිඔය මධ්‍ය මහා විද්‍යාලයේ දී, මධ්‍යම පළාත් මහ ඇමති ගරු සරත් ඒකනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2500ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම ජාතික වැඩසටහන පවත්වන ලදී. ප්‍රදේශයේ පවතින ගැටලු සඳහා වකුගඩු රෝග නිවාරණය ජනාධිපති කාර්ය සාධන බලකායේ මැදිහත් වීමෙන් හා පාර්ශවකාරී ආයතනවල සහයෝගයෙන් විසඳුම් ලබා දෙන ලදි.

- වකුගඩු රෝග නිවාරණය පිළිබඳව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 545ක මහජනයා සහ පාසල් 323ක දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- වකුගඩු රෝග නිවාරණය පිළිබඳ උපදෙස් සහිත දැන්වීම් පුවරු 40ක් ප්‍රදේශයේ මහජනයා ගැවසෙන ස්ථානයන්හි ප්‍රදර්ශනය කිරීම

- විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිළධාරී වසම් 39ක 23,600 ක ඉලක්කගත ජනගහනයකින් 20,060 ක් (ඉලක්කගත ජනගහනයෙන් 85%ක්) වකුගඩු රෝගීන් පෙර හඳුනාගැනීමේ (SCREENING) පරීක්ෂාවට ලක්කිරීම

- විල්ගමුව ප්‍රදේශයේ මහජනතාව භාවිතා කරනු ලබන ජලය පානය කිරීමට සුදුසු ද යන්න පරීක්ෂාවට ලක්කිරීම

- වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකායේ මූල්‍ය ප්‍රතිපාදන මත විල්ගමුව ප්‍රදේශයේ පාසල් 10ක් සඳහා ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති 10ක් සහ සංජීව් ගාඩිනර් පදනමේ මූල්‍ය දායකත්වය මත ප්‍රදේශයේ ප්‍රජා මූල සංවිධාන 03ක් සඳහා ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති 03ක් ලබාදීම

- විල්ගමුව රෝහලේ ඉදිකරන ලද නව වකුගඩු රෝග ඒකකය සහ රසායනාගාරය විවෘත කිරීම

- සමාජ සුබසාධන වැඩසටහන් යටතේ වකුගඩු රෝගීන් සඳහා ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වකුගඩු රෝගීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් උදෙසා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 90ක් සඳහා නිවාස ආධාර පිරිනැමීම








**මාතලේ වැඩසටහනේ දිස්ත්‍රික් ජාතික විශේෂ අවස්ථා**

**3.8.2 අනුරාධපුරය දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්වන ලද වකුගඩු රෝග නිවාරණ ප්‍රාදේශීය වැඩමුළුව හා 250 වන ප්‍රතිආශ්‍රැතිකරණ ජලපද්ධතිය විවෘත කිරීමේ උත්සවය**

2017 සැප්තැම්බර් මස 10 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හොරොව්පොතාන රිටිගහවැව, මොරකැව ශ්‍රී සද්ධර්මජෝතිකාරාම විහාරස්ථානයේ දී මෙම වැඩසටහන පවත්වන ලදී. මීට සමගාමීව හොරොව්පොතාන ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- වකුගඩු රෝග නිවාරණය පිළිබඳව ප්‍රදේශයේ පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වකුගඩු රෝගීන් පෙර හඳුනා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 38 දෙනෙකු සඳහා නිවාස ආධාර ලබාදීම
- වකුගඩු රෝගයෙන් මව හෝ පියා අහිමිවූ අ.පො.ස. (උ/පෙ) හදාරණ සිසු දරුවන් 08 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
- වකුගඩු රෝගී පවුල් 600ක් සඳහා ගෘහස්ත ජල පෙරණ 600ක් ලබාදීම

### 04. "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන









**දැක්ම**

විසිඑක් වන සියවසේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන, සුරක්ෂිත පරිසරයක ජීවත් වන ළමා පරපුරක්

**මෙහෙවර**

දරුවන්ට සුරක්ෂිත, ඔවුන්ගේ කායික හා මානසික සංවර්ධනයට හිතකාමී පරිසරයක් ගොඩනැගීම

අනාගත ශ්‍රම බලකායෙහි ගුණාත්මක බව වර්තමාන ළමා පරපුර මත රඳා පවත්නා හෙයින්, දැනට සමාජය තුළ පැතිර යන විවිධ ව්‍යසනයන්ගෙන් දරුවන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවය ප්‍රමුඛතා පදනමකින් හඳුනාගත් අතිගරු ජනාධිපතිතුමා, වර්තමාන දරු පරපුර සඳහා වූ විශේෂිත සුබසාධන හා ආරක්ෂක වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතු බවට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙම විෂයයට අදාල රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා අමාත්‍යාංශ ඇතුළු ආයතනවල ප්‍රධානීන් හා වෙනත් අදාල පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදි. එම සාකච්ඡා වලදී හඳුනාගත් ගැටලු ක්‍රමවත් පරිදි කඩිනමින් විසඳීම සඳහා වූ ප්‍රතිකර්ම අන්තර්ගත වූ, නිශ්චිත කාල රාමුවක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් (Time-bound Action Plan) සකස් කර, වසර තුනක් (2017 – 2019) තුල ක්‍රියාවට නැංවීම අරමුණු කර ගනිමින් පහත ක්ෂේත්‍රයන් තුන යටතේ “දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන සකස් කර ඇත.

1. ප්‍රතිපත්ති සම්පාදනය, නීති ප්‍රතිසංස්කරණය හා ක්‍රියාත්මක කිරීම
2. ආයතන ශක්තිමත් කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය
3. ළමුන්ගේ ශාරීරික සුවතාවය, දැනුම හා කුසලතා වර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම




“දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන පාර්ශවකාරී ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අතර, ජනාධිපති කාර්යාලය මගින් 2017 වසර තුල පහත සඳහන් කාර්යයන් සිදුකරන ලදී

## 4.1 "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනේ සමාරම්භක උත්සවය

"දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන සමාජගත කිරීමේ ප්‍රධාන ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන්, ගරු මැති ඇමතිවරුන්, නිලධාරීන් සහ සෙසු ආරාධිතයින් ඇතුළු 7,000 ක පමණ ජනතා සහභාගීත්වයෙන් යුතුව 2017 සැප්තැම්බර් මස 08 වන දින මහනුවර, දිගන, පළාත් ක්‍රීඩා සංකීර්ණයේදී පවත්වන ලදී. මෙහිදී "දරුවන් සුරකිමු" 2017 – 2019 ජාතික සැලැස්ම, අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගන්වන ලදී.

එදින සිදු කරන ලද අනෙකුත් විශේෂ කාර්යයන් වනුයේ

- "අනාගතය දිනන දරුවෝ" විශේෂ පෞරුෂ සංවර්ධන වැඩසටහන යටතේ සකස් කළ ග්‍රන්ථය අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම.
- පොළොන්නරුව, කිලිනොච්චිය, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි අබාධ සහිත දරුවන් සිටින පාසල්වල, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 80.7 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
- කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද, ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වීම.
- මධ්‍යම පළාත් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත, මත්ද්‍රව්‍ය උවදුරෙන් දරුවන් මුදවාගැනීම හා ළමා අපචාරවලින් වලක්වා ගැනීම පිළිබඳව ව්‍යාපෘති වාර්තාව පිළිගැන්වීම.





**සමාරම්භක උත්සවයේ අවස්ථාවන්**

**4.2 "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික් සමුළුව**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනේ පොළොන්නරුව දිස්ත්‍රික් සමුළුව, ප්‍රාදේශීය දේශපාලන නායකත්වය, උතුරු මැද පළාතේ ප්‍රධාන රාජ්‍ය නිලධාරීන්, සිසු දරු දැරියන් සහ ගුරු භවතුන් 5,500 ක් පමණ වූ පිරිසකගේ සහභාගීත්වයෙන් පොළොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේදී, 2017 නොවැම්බර් මස 10 වැනි දින පවත්වන ලදී.

එදින සිදු කරන ලද අනෙකුත් විශේෂ කාර්යයන් වනුයේ

- උතුරු මැද හා නැගෙනහිර පළාත්වල ළමා නිවාස 08 ක් නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.මි. 11.4 ක ප්‍රතිපාදන ලබාදීම.

- එම පළාත්වල පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති පාසල් 20 කට ප්‍රතිආශ්‍රිතකරණ ජල පිරිපහදු කට්ටල ලබාදීම සිදුකළ අතර, සංකේතාත්මකව මඩකලපුව කයන්කරනෛ සරස්වතී විද්‍යාලය, මඩකලපුව ප්‍රන්තුරෙයිචේනෛ අසාර් විද්‍යාලය, අම්පාර ලාහුගල විද්‍යාලය සහ අම්පාර පරණ ගොවිපල ප්‍රාථමික විද්‍යාලය වෙත පිරිනැමීම.

- "තිරසර පාසල්" වැඩසටහනේ දෙවන අදියර යටතේ පොළොන්නරුව, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක වලින් තෝරාගත් පාසල් 381 ක් සඳහා, එක් පාසලකට රු. 50,000/= බැගින් රු.මි. 19.05 ක ප්‍රතිපාදන ලබාදීම සිදුවූ අතර එදින පොළොන්නරුව පැලතියවැව කනිෂ්ඨ විද්‍යාලය, මඩකලපුව කුමාරවේලියාර්ග්‍රාමම් සිත්ති විනායගර් විද්‍යාලය සහ කල්මුනේ මජීඩ්පුර විද්‍යාලයන් වෙත සංකේතාත්මකව ප්‍රතිපාදන ලබාදීම.

**පොළොන්නරු දිස්ත්‍රික් සමුළුවේ අවස්ථාවන්**





### 4.3 “අනාගතය දිනන දරුවෝ” වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ලෝකයේ දියුණු රටවල කරන ලද සමාජයීය හා විද්‍යාත්මක පර්යේෂණ තුළින් අනාවරණය කරගෙන ඇත්තේ පුද්ගලයින්ගේ කුසලතා සහ ආකල්ප හැඩගැස්වීම උදෙසා ළමා වියෙහි දී සිදුවන මානසික බලපෑම් සෘජුවම හේතු වන බවයි. යහපත් සමාජීය ප්‍රතිනිර්මාණයක් උදෙසා ළමා වියෙහි මානසික සංවර්ධනය ක්‍රමානුකූලව, විධිමත්ව සහ යහපත් ආකාරයෙන් සිදු කළ යුතු අතර ඒ තුළින් ඵලදායී, ගුණගරුක, නීතිගරුක සහ යහපත් පුරවැසියන් නිර්මාණය කර ගැනීමට අවකාශය සැලසෙනු ඇත. පෞරුෂ සංවර්ධනය පිළිබඳව සමාජයේ දැනුවත්භාවය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව “දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන යටතේ “අනාගතය දිනන දරුවෝ” පෞරුෂ සංවර්ධන වැඩසටහන ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මේ යටතේ “අනාගතය දිනන දරුවෝ” අත්පොත, සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සකස් කොට මුද්‍රණය කිරීම අවසන් කොට ඇත. එමෙන්ම, මෙම වැඩසටහන දීප ව්‍යාප්තව දැනුවත් කිරීමට අවශ්‍ය කරන පුහුණු කරුවන්, පුහුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු මොඩියුලයන් සකස් කිරීමද අවසන් කොට ඇත. මීට අමතරව මහනුවර හා පොළොන්නරුවේ පැවැත්වූ සමුළුවලදී සහභාගීවන්නන්, වැඩසටහන පිළිබඳව දැනුවත් කරන ලදී.

2018 වසරේදී මෙම වැඩසටහන අධ්‍යාපන, සෞඛ්‍ය හා පරිපාලන ක්ෂේත්‍ර හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

**දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය පිළිබඳ දැනුවත් කරමින්**







### 4.4 ආබාධ සහිත දරුවන් සිටින පාසල්වල ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම.

ආබාධ සහිත පුද්ගලයන් හා වැඩිහිටි ප්‍රජාවට මුහුණ පෑමට සිදුවන අසමානතාවයන් අවම කරගෙන, ඔවුන්ට ස්වකීය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය පහසුකම් සැපයීමෙන් ඔවුන් තවකෙකු මත යැපීමකින් තොරව, ගෞරවාන්විත පුද්ගලයන් බවට පත් කොට ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගත යුතුව ඇත. එම අරමුණින් ආබාධ සහිත පුද්ගලයන් හා වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම පිළිබඳ ජාතික වැඩසටහන 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එහි සමාරම්භයක් වශයෙන් 2017 වර්ෂයේදී “දරුවන් සුරකිමු” ජාතික වැඩසටහන යටතේ පොළොන්නරුව, කිලිනොච්චිය, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වල ආබාධ සහිත දරුවන් සිටින පාසල් 54 ක් සඳහා ප්‍රවේශ පහසුකම් හා ආබාධිත දරුවන් සඳහා වූ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.

| **දිස්ත්‍රික්කය** | **අධ්‍යාපන කලාපය** | **ඉදිකිරීම් සිදු කරන ලද පාසල් සංඛ්‍යාව** | **වෙන්කරන ලද ප්‍රතිපාදනය (රු.මි.)** |
|---|---|---|---|
| පොළොන්නරුව | හිඟුරක්ගොඩ | 11 | **36** |
| | පොළොන්නරුව | 06 | |
| | දිඹුලාගල | 06 | |
| | **එකතුව** | **23** | |
| බදුල්ල | බදුල්ල | 03 | **15** |
| | බණ්ඩාරවෙල | 03 | |
| | වියළුව | 03 | |
| | මහියංගනය | 01 | |
| | **එකතුව** | **10** | |
| මොනරාගල | වැල්ලවාය | 03 | **22.5** |
| | තණමල්විල | 04 | |
| | මොනරාගල | 04 | |
| | බිබිල | 04 | |
| | **එකතුව** | **15** | |
| කිලිනොච්චිය | කිලිනොච්චිය | 06 | **7.2** |
| | **එකතුව** | **06** | |
| **මුළු එකතුව** | | **54** | **80.7** |




පාසල් වල ආබාධ සහිත දරුවන් සඳහා පහසුකම් සංවර්ධනය

**4.5 "දරුවන් සුරකිමු" පොළොන්නරුව දිස්ත්‍රික් සමුළුවට සමගාමීව, ළමා නිවාස 08 ක් නවීකරණ හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.**

පොළොන්නරුව දිස්ත්‍රික් සමුළුවේ පූර්ව සාකච්ඡා වලදී, උතුරුමැද හා නැගෙනහිර පළාත්වල ඇති ළමා නිවාසවල අලුත්වැඩියාව හා ළමා නිවාසයන්හි ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව අනාවරණය විය. ඒ අනුව මේ යටතේ පොළොන්නරුව, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වල ළමා නිවාස 08 ක අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි. 11.4 ක ප්‍රතිපාදන ලබාදීම සිදුකරන ලදී.

| | දිස්ත්‍රික්කය | ළමා නිවාසය | නේවාසික දරුවන් ගණන | ප්‍රතිපාදනය (රු.) |
|---|---|---|---|---|
| 1 | පොළොන්නරුව | හිගුරක්ගොඩ බෝසත් බාලිකා ළමා නිවාසය | 26 | 2,028,342 |
| | | පැරකුම් බාලිකා ළමා නිවාසය | 27 | 1,465,302 |
| 2 | මඩකලපුව | මඩකලපුව ආරක්ෂිත නිවාසය | 10 | 4,880,000 |
| | | Village of Hope Girls Home | 26 | 585,000 |
| | | Vivekananda Girls Home | 33 | 599,816 |
| | | Shakthi Girls Home | 52 | 600,000 |
| | | Jeevananda Girls Children's Home | 31 | 500,000 |
| 3 | අම්පාර | විපුලානන්ද පිරිමි ළමා නිවාසය | 27 | 744,250 |
| **එකතුව** | | | **232** | **11,402,710** |

**ළමා නිවාසවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරමින්**





### 4.6 දරුවන්ගේ කියවීමේ රුචිය ප්‍රවර්ධනය සඳහා පොත් කට්ටල 2 බැගින් පාසල් 2,820 ක් සඳහා ලබා දීම.

නවීන තාක්ෂණයත් සමඟම, නවීන ඉලෙක්ට්‍රොනික මෙවලම් රටපුරා පැතිරයාම හේතුවෙන්, දරුවන් පොත්පත් කියවීමෙන් හා පරිශීලනයෙන් ඈත්වී යන ප්‍රවනතාවයක් දක්නට ලැබේ. එබැවින් තිරසර පාසල් වැඩසටහන යටතේ දරුවන්ගේ කියවීමේ රුචිය ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිර්දේශිත පොත් 25 කින් යුතු කට්ටල 2 බැගින් දිවයින පුරා පිහිටි අ.පො.ස (උ/පෙළ) පන්ති සහිත පාසල් 2,820 ක් සඳහා ලබා දීම සිදු කරන ලදී. මේ සඳහා දරන ලද වියදම රු.මි.19.1 කි.

| අනු. අංකය | පළාත | පොත් කට්ටල ලබාදුන් පාසල් සංඛ්‍යාව | පොත් ලබාදීම පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍ය පොත් | දෙමළ මාධ්‍ය පොත් | ඉංග්‍රීසි මාධ්‍ය පොත් | මුළු එකතුව |
| 01. | උතුරු මැද | 191 | 3,200 | 620 | 1,910 | **5,730** |
| 02. | ඌව | 260 | 4,260 | 960 | 2,600 | **7,820** |
| 03. | උතුර | 213 | 80 | 4,180 | 2,130 | **6,390** |
| 04. | නැගෙනහිර | 275 | 1,220 | 4,280 | 2,750 | **8,250** |
| 05. | මධ්‍යම | 431 | 6,080 | 2,900 | 4,310 | **13,290** |
| 06. | වයඹ | 361 | 5,680 | 1,580 | 3,610 | **10,870** |
| 07. | සබරගමුව | 286 | 4,860 | 940 | 2,860 | **8,660** |
| 08. | දකුණ | 358 | 6,800 | 440 | 3,580 | **10,820** |
| 09. | බස්නාහිර | 445 | 7,840 | 1,540 | 4,450 | **13,830** |
| **එකතුව** | | **2,820** | **40,020** | **17,440** | **28,200** | **85,660** |




**පාසල් වෙත පොත් ලබාදීම**

### 4.7 පාසල් සිසුන් සුරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා බස්රථ 04 ක් උතුරු මැද පළාත සඳහා ලබාදීම.

දුෂ්කර ප්‍රදේශයන්හි පවතින ප්‍රවාහන දුෂ්කරතා පිළිබඳව අවධානය යොමුකරමින්, වඩා සුරක්ෂිත වන පරිදි පාසල් දරුවන්ගේ ගමනාගමන පහසුකම් සැලසීම සඳහා ආරම්භක නියමු වැඩපිළිවෙළක් ලෙස පාසල් දරුවන්ගේ භාවිතය සඳහා බස්රථ ලබාදෙන ලදී. ඒ අනුව අනුරාධපුර නිවත්තකචේතිය මහා විද්‍යාලයට බස් රථ 01 ක් හා හිඟුරක්ගොඩ, දිඹුලාගල, පොළොන්නරුව යන අධ්‍යාපන කලාපයන්ට අයත් පාසල් වල ළමුන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් භාවිතා කිරීමට අදාළ කලාප කාර්යාලයන් සඳහා බස්රථ 03 ක්ද ලබාදෙන ලදී.




**පාසල් සඳහා බස්රථ ලබාදීම**

### 4.8 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම

පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සලකා බැලීමෙන් අනතුරුව "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනේ අරමුණු ඉටුකරගැනීමට ඉවහල් වන ව්‍යාපෘති යෝජනා සඳහා රු. 1,332,900/= ක ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව 2017 වසරේදී පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

i. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රීඩාව හා ව්‍යායාම තුළින් නිරෝගිමත් දරු පරපුරක් බිහිකිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව ළමා සමාජ ළමයින් දැනුවත් කිරීම හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන වල ගෙවතු වගා වැඩසටහන.

ii. කළුතර දිස්ත්‍රික්කයේ පාසල් 17 ක ළමුන් විවිධ උපද්‍රව වලින් ආරක්ෂාවීම හා පාසල් 15 ක සිසු දරු දැරියන්ගේ දෙමව්පියන්, දරුවන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.

iii. පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව හා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ළමා සංවර්ධනය හා ළමා අපයෝජනයෙන් දරුවන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහන් හා පාසල් මට්ටමින් හඳුනාගත් ගැටලු සහිත ළමුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම තුළින් පෞරුෂත්වය ගොඩනැංවීම.

iv. පුත්තලම දිස්ත්‍රික්කයේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමා ආරක්ෂාව හා ළමුන්ගේ වගකීම පිළිබඳ දෙමව්පියන් දැනුවත් කිරීම හා ළමා අපයෝජනය හා ළමා අපචාර අවම කිරීම සම්බන්ධව දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

v. වව්නියාව දිස්ත්‍රික්කයේ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මත්ද්‍රව්‍ය නිවාරණය හා ළමා අපයෝජනය වැළැක්වීම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vi. වව්නියාව දිස්ත්‍රික්කයේ නානට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් මට්ටමින් උසස් පෙළ දරුවන් 1,500 ක් සඳහා වැඩමුළු 05 ක් පැවැත්වීම.

vii. බදුල්ල දිස්ත්‍රික්කයේ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමසේවා වසම් 20 ක් ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 05 ක් පවත්වා අවදානම් පවුල්වල දෙමව්පියන් හා භාරකරුවන් 300 ක් දැනුවත් කිරීම.

"දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන යටතේ 2018 වසර තුළද විශේෂ ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. දරුවන් සම්බන්ධව පැන නැගී ඇති ගැටලු සඳහා අදාළ පාර්ශවකාරී ආයතන සමඟ ඒකාබද්ධව අවශ්‍ය විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරේ. එසේම වින්දිත දරුවන් අධිකරණය වෙත ප්‍රවාහනය කිරීම සඳහා පළාත් පරිවාස දෙපාර්තමේන්තු නවය සඳහා වාහන 9 ක් ලබා දීම, ආබාධ සහිත දරුවන් සිටින පාසල් සඳහා ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම ඔවුන්ගේ පවුල් සඳහා ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම , ළමා නඩු කඩිනමින් විසඳීමට අවශ්‍ය පියවර ගැනීම මින් ප්‍රධාන තැනක් ගනී. 2018 වසර සඳහා "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහනේ කාර්යයන් සඳහා රු. මි. 200 ක ප්‍රතිපාදන වෙන්කොට ඇත.

# තේමාව

## "සොඳුරු ළමා ලොවක් - තිරසර හෙටක් "

## උපායමාර්ග

1. සහභාගීත්වය, සහයෝගය සහ දායකත්වය
2. අත්දැකීම් තුළින් ඉගෙනුම
3. ස්වයං ඇගයීම සහ තක්සේරුව
4. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම, කටයුතු කිරීම හා සමාජගත කිරීම

**අරමුණු**

1. දේශීය ආහාර නිෂ්පාදනයට හා පරිභෝජන රටාවකට දරුවන් හුරු කිරීම.
2. පරිසරයට සංවේදී අනාගත පරපුරක් බිහි කිරීම තුළින් තිරසර සංවර්ධනය කරා යොමුවීමට පාසල් දරු දැරියන් හුරු කිරීම.
3. කාලීන උවදුරක් බවට පත්ව ඇති මත්ද්‍රව්‍ය භාවිතය මැඩලීම හා වකුගඩු රෝගය නිවාරණය සඳහා ක්‍රියාකාරී පාර්ශවයක් ලෙස පාසල් දරුවන් සහභාගි කර ගැනීම.
4. පෞරුෂ සංවර්ධනය හා දරුවන් බලගැන්වීම තුළින් සුරක්ෂිත ළමා පරපුරක් බිහිකිරීම.
5. පාසල් භූමිය හා පරිශ්‍රය තුළ තිරසර සංවර්ධනය මගින් ලබන අත්දැකීම් තම නිවස කරා ගෙන යන විපර්යකාරකයකු ලෙස පාසල් දරුවන් බලගැන්වීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. ඉඩම්/ භූමි පරිහරණ රටාව පිළිබඳ අවබෝධයක් ලබා දීම.
2. පාසල් වත්ත නිපැයුම් ඒකකයක් බවට පත් කිරීම.
3. අලංකාර, පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත පාසල් පරිශ්‍රයක් ඇති කිරීම.
4. මත්ද්‍රව්‍ය හා වකුගඩු උවදුර පිළිබඳ සිසුන් දැනුවත් කිරීම.
5. මත්ද්‍රව්‍ය හා වකුගඩු උවදුර වැළැක්වීම සඳහා ක්‍රියාකාරී පාර්ශවයක් ලෙස පාසල් දරුවන් පුහුණු කිරීම.
6. ස්වයං ආරක්ෂණය සඳහා පාසල් දරුවන් බල ගැන්වීම.
7. දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම තුළින් රසිකත්වය වර්ධනය කිරීම හා දැනුමෙන් සන්නද්ධ කිරීම.
8. තිරසර සංවර්ධනයට දායක විය හැකි පරිදි දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය.
9. දරුවන් තුළ යහපත් චර්යාවන් වර්ධනය කිරීම.

**හැඳින්වීම**

අතිගරු ජනාධිපතිතුමන්ගේ සුවිශේෂී අවධානය, පූර්ණ අධීක්ෂණය හා මඟ පෙන්වීම මත විෂයය ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ සංවර්ධනය හා විශේෂ ව්‍යාපෘති අංශය මේ වන විට පහත සඳහන් ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
2. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන
3. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන
4. දරුවන් සුරකිමු ජාතික වැඩසටහන

ඉහත ජාතික වැඩසටහන් පිළිබඳව පාසල් දරුවන් දැනුම්වත් කිරීම, ඔවුන්ගේ චර්යා ප්‍රවර්ධනය කිරීම හා ජාතික වැඩසටහන්හි අරමුණු පාසල් දරුවන් හරහා සමාජගත කිරීම තිරසර පාසල් වැඩසටහනෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේය. එමෙන්ම ඉහත සඳහන් ජාතික වැඩසටහන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා ඉලක්කගත සුදුසුම කණ්ඩායම පාසල් දරුවන් වේ. පාසල් දරුවන් අවදානම් චර්යාවලින් වළක්වා ගනිමින් වැඩ ලෝකයට හා සමාජයට හුරු කිරීම, පාසල් දරුවන් සමාජ විපර්යාසකාරකයින් ලෙස බල ගැන්වීම යන ප්‍රධාන පරමාර්ථයන් ළඟා කර ගැනීමේ අපේක්ෂාවෙන් ඉහත සඳහන් ජාතික වැඩසටහන් ඒකාබද්ධ කොට “තිරසර පාසල් වැඩසටහන” හඳුන්වා දෙන ලදී. ඉදිරි වසර 5ට පසු සමාජගත වන වර්තමාන සිසු පරපුර සාරධර්ම හා ගුණධර්ම වලින් පිරි, පරිසර හිතකාමී, මතින් තොර, දේශීය වටිනාකම් අගයන සහ සෞඛ්‍ය සම්පන්න දරු පරපුරක් බවට පත් කිරීම “ තිරසර පාසල් වැඩසටහනෙහි ”අභිප්‍රාය වේ.

“ තිරසර පාසල් වැඩසටහන ” සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉහත සඳහන් කළ ජාතික වැඩසටහන් මගින් ලබා දෙනු ලබයි. එම සියලු වැඩසටහන්වල පාසල් මට්ටමින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තිරසර පාසල් වැඩසටහන ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වන පොදු යාන්ත්‍රණයක් ජාතික, පළාත්, පාසල් මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය ඇතිව සකස් කර ඇත.








තිරසර පාසල් වැඩසටහනෙහි පළමු අදියර සඳහා පාසල් 3409 ක් දීප ව්‍යාප්තව තෝරා ගන්නා ලදී.මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය මත අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි දෙවෙනි අදියර ලෙස තිරසර පාසල් වැඩසටහන නව පාසල් 3000 ක් සඳහාද ව්‍යාප්ත කරන ලදී. මේ වන විට සමස්ත පාසල් 6409 ක තිරසර පාසල් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වේ.

| පළාත | පළමු අදියර යටතේ තෝරාගත් පාසල් | | | දෙවන අදියර යටතේ තෝරාගත් පාසල් | මුළු පාසල් |
|---|---|---|---|---|---|
| | පාසල් 2820 (1AB+IC) | පාසල් (T.1 & T.2) | පළමු අදියරට අයිති පාසල් ගණන | | |
| බස්නාහිර | 445 | 72 | 517 | 549 | 1066 |
| මධ්‍යම | 431 | 3 | 434 | 454 | 888 |
| දකුණ | 358 | 42 | 400 | 337 | 737 |
| උතුර | 213 | 32 | 245 | 237 | 482 |
| වයඹ | 361 | 94 | 455 | 359 | 814 |
| නැගෙනහිර | 275 | 184 | 459 | 296 | 755 |
| උතුරු මැද | 191 | 49 | 240 | 247 | 487 |
| ඌව | 260 | 62 | 322 | 213 | 535 |
| සබරගමුව | 286 | 51 | 337 | 308 | 645 |
| **මුළු එකතුව** | **2820** | **589** | **3409** | **3000** | **6409** |

**පළාත් අනුව තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව**

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් තිරසර පාසල් වැඩසටහනේ සමාරම්භක උත්සවය මහනුවර, කෙන්ගල්ල මහා විද්‍යාලයේදී 2017.01.19 වන දින පවත්වන ලදී.








**සමාරම්භක උත්සවයේ අවස්ථාවන් කිහිපයක්**

මෙයට සමගාමීව තිරසර පාසල් වැඩසටහන යටතේ ස්ථාපිත කළ මධ්‍යම පළාත් තිරසර පාසල් කමිටු ශිෂ්‍ය නායකයන් සඳහා වූ දින දෙකක ශිෂ්‍ය කඳවුරක් 2017.01.18,19 පොල්ගොල්ල මහවැලි අධ්‍යාපන විද්‍යා පීඨයේදී පවත්වන ලදී.




**ශිෂ්‍ය කඳවුර - පොල්ගොල්ල**

තිරසර පාසල් වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘති පාසල් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් ඔස්සේ පාර්ශවකාරී ආයතන වෙත 2017 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය විසින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

| අනු අංකය | කාරණය | ලබාදුන් ප්‍රතිපාදන (රු.) |
|---|---|---|
| 01. | තිරසර පාසල් වැඩසටහනෙහි මූලික ක්‍රියාකාරකම් පාසල්ගත කිරීම සඳහා එක් පාසලකට රු.50,000/- බැගින් ලබා දීම.<br>2016 වර්ෂයේදී - 141,000,000.00<br>2017 වර්ෂයේදී - 179,450,000.00 | 320,450,000 |
| 02. | පුහුණු සංචිත ආරම්භ කිරීම | 707,850 |
| 03. | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ ගුරුභවතුන් දැනුවත් කිරීම | 15,690,440 |
| 04. | “ කලණ මිතුරු - පොත් සුමිතුරු ” වැඩසටහන | 19,100,000 |
| 05. | “ තිරසර පාසල් ”වෙබ් අඩවිය නිර්මාණය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා පුහුණු කිරීම | 258,775 |
| 06. | මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය | 15,000,000 |
| 07. | තිරසර පාසල් සමාරම්භක උත්සවය<br>පොල්ගොල්ල මහවැලි අධ්‍යාපන විද්‍යාපීඨයේ පැවති ශිෂ්‍ය කඳවුර | 3,066,730<br>954,062 |
| 08. | වෙනත් වියදම් | 1,788,277 |
| **එකතුව** | | **377,016,134** |

## 5.1 තිරසර පාසල් වැඩසටහන පාසල්ගත කිරීම

තිරසර පාසල් වැඩසටහනෙහි මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇතුළත් ක්‍රියාකාරකම් පාසල් වෙත හඳුන්වාදීමේ අරමුණින් හා ඒ යටතේ වන එක් එක් ක්‍රියාකාරකම් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා එක් පාසලකට රු.50,000/- බැගින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

**පළමු අදියර යටතේ ප්‍රතිපාදන ලබාදීම**

| | පළාත | දිස්ත්‍රික්කය | පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කොළඹ | 186 | 517 | 25.85 |
| | | ගම්පහ | 196 | | |
| | | කළුතර | 135 | | |
| 2 | මධ්‍යම | මහනුවර | 222 | 434 | 21.7 |
| | | මාතලේ | 87 | | |
| | | නුවරඑළිය | 125 | | |
| 3 | දකුණ | ගාල්ල | 153 | 400 | 20 |
| | | හම්බන්තොට | 119 | | |
| | | මාතර | 128 | | |

| | පළාත | දිස්ත්‍රික්කය | පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 4 | නැගෙනහිර | අම්පාර | 189 | 459 | 22.95 |
| | | මඩකලපුව | 124 | | |
| | | ත්‍රිකුණාමලය | 146 | | |
| 5 | වයඹ | කුරුණෑගල | 311 | 455 | 22.75 |
| | | පුත්තලම | 144 | | |
| 6 | උතුරුමැද | අනුරාධපුර | 172 | 240 | 12 |
| | | පොළොන්නරුව | 68 | | |
| 7 | ඌව | බදුල්ල | 212 | 322 | 16.1 |
| | | මොනරාගල | 110 | | |
| 8 | සබරගමුව | කෑගල්ල | 162 | 337 | 16.85 |
| | | රත්නපුර | 175 | | |
| 9 | උතුර | යාපනය | 105 | 245 | 12.25 |
| | | කිලිනොච්චි | 30 | | |
| | | මන්නාරම | 40 | | |
| | | මුලතිවු | 34 | | |
| | | වවුනියාව | 36 | | |
| **මුළු එකතුව** | | | | **3409** | **170.45** |

මෙම ප්‍රතිපාදන භාවිතා කරමින් තිරසර පාසල් වැඩසටහනෙහි ඇතුළත් කොට ඇති වැඩසටහන් සඳහා අවශ්‍ය මූලික යෙදවුම් හා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සහ පාසල් මටටමින් ක්‍රියාකාරකම් සිදු කරන ලෙස පාසල් දැනුවත් කොට ඇත. පාසල් මට්ටමින් ස්ථාපිත කර තිබෙන . "තිරසර පාසල්" කමිටුව විසින් සාකච්ඡා පවත්වා අවශ්‍යතා හඳුනාගෙන, ඒ අනුව උප කමිටු සඳහා මුදල් වෙන් කර ගනු ලබයි. මෙම ප්‍රතිපාදන භාවිතා කරමින් එක් එක් කමිටුව මගින් තිරසර පාසල් වැඩසටහන යටතේ වන විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**දෙවෙනි අදියර යටතේ ප්‍රතිපාදන ලබාදීම**

| | පළාත | දිස්ත්‍රික්කය | පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කොළඹ | 155 | 549 | 27.45 |
| | | ගම්පහ | 235 | | |
| | | කළුතර | 159 | | |
| 2 | මධ්‍යම | මහනුවර | 196 | 454 | 22.7 |
| | | මාතලේ | 89 | | |
| | | නුවරඑළිය | 169 | | |
| 3 | දකුණ | ගාල්ල | 131 | 337 | 16.85 |
| | | හම්බන්තොට | 105 | | |
| | | මාතර | 101 | | |
| 4 | උතුර | යාපනය | 116 | 237 | 11.85 |
| | | කිලිනොච්චි | 37 | | |
| | | මන්නාරම | 19 | | |
| | | මුලතිවු | 31 | | |
| | | වවුනියාව | 34 | | |
| 5 | නැගෙනහිර | අම්පාර | 115 | 296 | 14.8 |
| | | මඩකලපුව | 111 | | |
| | | ත්‍රිකුණාමලය | 70 | | |
| 6 | වයඹ | කුරුණෑගල | 225 | 359 | 17.95 |
| | | පුත්තලම | 134 | | |
| 7 | උතුරු මැද | අනුරාධපුර | 165 | 247 | 12.35 |
| | | පොළොන්නරුව | 82 | | |
| 8 | ඌව | බදුල්ල | 132 | 213 | 10.65 |
| | | මොනරාගල | 81 | | |
| 9 | සබරගමුව | කෑගල්ල | 129 | 308 | 15.4 |
| | | රත්නපුර | 179 | | |
| **මුළු එකතුව** | | | | **3000** | **150** |

**පාසල් වෙත ලබා දෙන ලද රු.50,000/- භාවිතා කරමින් පාසල් විසින් 2017 වර්ෂය තුළ දී සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම්**

**පාසල සඳහා ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීම.**

ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත කර ඇති ඉඩම් පරිහරණ නිලධාරීන්ගේ සහය ඇතිව පාසල් පරිසර සංරක්ෂණ කමිටුවෙහි සිසුන්ගේ දායකත්වය ඇතිව තම පාසල සඳහා වන ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ගැනීමට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව තම පාසලෙහි ගොඩනැඟිලි පැවතිය යුතු ප්‍රදේශ, වගා කල හැකි ප්‍රදේශ, පාංශු සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ සහ ඉදිරියේදී සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනේ. ඉහත සෑම පාසලක් සඳහාම ඉඩම් පරිහරණ සැලසුමක් සකස් කර ඇති අතර පාසල් ඉඩම් පරිහරණ පිරිවිතර මුද්‍රණය කර පාසලෙහි ප්‍රදර්ශනය කර ඇත.






**රත්නාවලී බාලිකා මහා විද්‍යාලය - කොළඹ** **ශ්‍රී නාග ජාතික පාසල - නාඋල**

ඉඩම් පරිහරණ සැලැස්ම මගින් හඳුනාගන්නා ලද පාංශු සංරක්ෂණය කළ යුතු ස්ථාන පාසල් සිසුන්ගේ සහ දෙමව්පියන්ගේද සහය ඇතිව සංරක්ෂණය කිරීම සිදු කෙරේ. මෙහිදී පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම මූලික අභිප්‍රාය වේ.





**මෙල්පිටිය මහා විද්‍යාලය - මාතලේ**

### 5.1.3. කසල කළමනාකරණ වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ කසල කළමනාකරණය සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු මෙන්ම අවිධිමත් කසල බැහැර කිරීම හේතුවෙන් මෑතකාලීනව නොයෙකුත් ආපදාවන් සඳහා මුහුණ දීමට සිදු වී ඇත. එබැවින් පාසල් සිසුන් කසල කළමනාකරණයෙහි ඇති වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සඳහා සහ කසල වර්ගීකරණය කිරීම සඳහා හුරු කිරීම අරමුණු කොට විවිධ ක්‍රියාකාරකම් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කොට ඇත.

එමෙන්ම පාසල් පොලිතීන් වලින් මුක්ත කලාපයක් බවට පත් කිරීමේ අරමුණින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. එහි සඳහන් උපදෙස් අනුව පාසල් පරිසර සංරක්ෂණ කමිටුව විසින් පොලිතීන් වලින් තොර පාසල් පරිසරයක් බිහි කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කොට ඇත.





**මුස්ලිම් බාලිකා විද්‍යාලය - කින්නියා**

### 5.1.4. පරිසර අලංකරණ වැඩසටහන

පාසල් පරිසරය ප්‍රියමනාප ස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් සිදු කොට ඇත. ගස් හා මලින් පිරි ක්‍රමවත් පාසල් පරිසරයක් පවත්වා ගැනීම මඟින් නැවුම් ඉගෙනුම් පරිසරයක් බිහිවේ. මෙය පාසල් සිසුන්ට මෙන්ම ගුරුවරුන් සඳහා ද අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාමට රුකුලක් වනු ඇත.



**ම / මහමායා බාලිකා විද්‍යාලය**



**මධ / නු / සේනානන්ද මහා විද්‍යාලය**

### 5.1.5 මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම

පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු මගින් තම පාසලේ සිසුන්ගේ ද දායකත්වය ඇතිව විශේෂ ක්‍රියාකාරකම් පාසල්වල සිදු කෙරේ. දැන්වීම් මගින් මත්ද්‍රව්‍ය නිවාරණ වැකි පාසල තුළ ප්‍රදර්ශනය කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ චිත්‍ර තරඟ, පෝස්ටර් තරඟ පැවැත්වීම, මත්ද්‍රව්‍ය නිවාරණ පා ගමන් සංවිධානය කිරීම සහ වෙනත් විවිධ වැඩසටහන් සිදු කෙරේ. එහිදී පාසල් සිසුන්ගේ මෙන්ම දෙමව්පියන්ගේද දායකත්වය මේ සඳහා ලබා ගෙන ඇත. එමෙන්ම සිදු කරන ලද විවිධ ක්‍රියාකාරකම් හරහා සමාජයද දැනුවත් කිරීමට හැකිවී ඇත.







**පාසල් දරුවන් විසින් නිර්මාණය කරන ලද දැන්වීම්**
**දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය - පොතුහැර**

### 5.1.6 පාරිසරික දැනුවත් කිරීම් සිදු කිරීම

පරිසරයෙහි ඇති වැදගත්කම, පාරිසරික පද්ධති, ගස් වැල් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා තිරසර පාසල් පරිසර සංරක්ෂණ කමිටු විසින් කටයුතු කොට ඇත. පාසල් සිසුන් විසින්ම නිර්මාණය කරන ලද පෝස්ටර්, වැකි හා විවිධ නිර්මාණයන් මේ සඳහා භාවිතා කර ඇත.






### 5.1.7 වකුගඩු රෝග නිවාරණ හා බෝ නොවන රෝග නිවාරණය සඳහා වූ වැඩසටහන්

මේ වන විට මූලය හඳුනා නොගත් වකුගඩු රෝගය හේතුවෙන් දිස්ත්‍රික්ක 11 ක ජනතාව පීඩාවට පත්වී ඇත. එම දිස්ත්‍රික්ක 11 හි සහ අනෙකුත් දිස්ත්‍රික්කයන්හිද සිසුන් මෙම රෝගය පිළිබඳ සහ එය වළක්වා ගැනීම සඳහා පුහුණු කළ යුතු චර්යාවන් පිළිබඳ දැනුවත් කිරීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව එම දැනුම භාවිතා කරමින් පාසල් සිසුන්ට නොයෙක් නිර්මාණයන් බිහි කිරීමට අවස්ථාව උදා වේ. තමන්ගේම නිර්මාණාත්මක ක්‍රම භාවිතා කරමින් තම සහෝදර සිසු සිසුවියන් වකුගඩු රෝග නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමට හැකියාව ලැබී ඇත.





**ගන්තිරායාගම මහින්ද මහා විද්‍යාලය, තොලම්බුගොල්ල මහා විද්‍යාලය**

පාසල් වලට ජල පෙරන ලබා ගැනීම මගින් පිරිසිදු පානීය ජලය පානය කිරීම සඳහා පාසල් දරුවන්ට හැකියාව ලැබී ඇත. එමෙන්ම වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන මගින් වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශවල හඳුනාගත් පාසල් වෙත ප්‍රතිආශ්‍රැතිකරණ ජල පෙරන ලබා දීම සිදුකරන බැවින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු පාසල් වෙතින් තිරසර පාසල් ජාතික කමිටු හරහා වකුගඩු රෝග නිවාරණ කාර්ය සාධන බලකාය වෙත ලබා දී ඇත.

එමෙන්ම වර්තමානයේ සීඝ්‍රයෙන් පැතිරීයන බෝනොවන රෝග පාලනය කෙරෙහිද මෙම වැඩසටහන යටතේ අවධානය යොමු කර ඇත. යහපත් සෞඛ්‍ය පුරුදු, පෝෂ්‍යදායී ආහාර හා ප්‍රථමාධාර ක්‍රම සම්බන්ධ විවිධ වැඩසටහන් පාසල් විසින් සංවිධානය කරන ලදී. ඒ සඳහා පාසල් දරුවන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගෙන ඇත.




**පාසල් දරුවන්හට ජල පෙරණ ලබාදීම — කො / රත්නාවලී බාලිකා මහා විද්‍යාලය**
**ශාන්ත මේරි දෙමළ මහා විද්‍යාලය**

### 5.1.8 පාසල් දරුවන්ගේ සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන්

පාසල් සිසුන්ට බාහිර සමාජයෙන් එල්ල වන නොයෙකුත් පීඩාකාරී තත්ත්වයන්ට මුහුණ දීම සඳහා තම ශක්තීන් වර්ධනය කර ගැනීම සහ සිසුන් බල ගැන්වීම අරමුණු කොට දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා පොලීසිය, ළමා ආරක්ෂණය සම්බන්ධ විවිධ ආයතනයන්ගේද සහය ලබා ගන්නා ලදී. ළමා හිංසනය, අපචාරයන් හා සමාජ විරෝධී ක්‍රියාවන්ට එරෙහි වීමට සහ එයින් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය දැනුවත්භාවය දරුවන් වෙත ලබා දීමට හැකි වී ඇත. දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් තුළින් ලබා ගත් දැනුම භාවිතා කරමින් පාසල් සිසුන් විසින් පාසල් මට්ටමින් නොයෙකුත් ක්‍රියාකාරකම් සිදු කෙරේ.



ත්‍රී / කින්නියා මුස්ලිම් බාලිකා විද්‍යාලය




බප/ කටුනායක මහා විද්‍යාලය

### 5.1.9 ගෙවතු වගා වැඩසටහන

දේශීය කෘෂි ආර්ථිකය උරුමයක් වූ ශ්‍රී ලංකා සමාජය වර්තමානය වන විට ඒ තුළින් ක්‍රමිකව ඈත් වෙමින් සිටී.ඒ අනුව ඉගෙනුම් ක්‍රියාවලියට ගැළපෙන පරිදි පාසල් ගෙවත්ත හා පරිසරය ගොඩනැංවීම පිළිබඳ, මෙම වැඩසටහන හරහා දායකත්වය ලබා දෙනු ලබයි. පාසල තුළ පවත්නා භූමිය කෘෂි කාර්මික වශයෙන් පරිසර හිතකාමී ලෙස සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. එමෙන්ම වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම හා කාබනික පොහොර භාවිතය වර්ධනය කිරීම මේ තුළින් බලාපොරොත්තුවේ. පාසල් දරුවන් කෘෂි ආර්ථිකයට නැඹුරු කිරීම තුළින් ඔවුන් තම අත්දැකීම් තම නිවාස හා ගෙවත්ත වෙත රැගෙන යාම සඳහා පෙළඹවීමක් ඇති කළ හැකිය. එමෙන්ම තම ප්‍රදේශයේ පාංශු තත්ත්වය, කාලගුණික තත්ත්වයන් අනුව බෝග වර්ග තීරණය කිරීම හා රෝපණය කළ යුතු කාලයන් පිළිබඳ දැනුවත් බවක් ලබා දිය හැකිය. ඉහත අරමුණු මුදුන් පමුණුවා ගනිමින් පාසල් විසින් පාසල් ගෙවතු වගාව ඉතා සාර්ථකව සිදු කර ඇත.





බෝධිමළුව විද්‍යාලය - ඇඹිලිපිටිය





මධ / නු / සේනානන්ද මහා විද්‍යාලය



### 5.2 තිරසර පාසල් වැඩසටහනෙහි එක් එක් ක්ෂේත්‍රයන් සඳහා පුහුණු සංචිත ආරම්භ කිරීම.

තිරසර පාසල් වැඩසටහන යටතේ, එක් එක් ක්ෂේත්‍රයන් සඳහා පුහුණු සංචිත ස්ථාපිත කරන ලදී. එම පුහුණු සංචිත සඳහා, නිලධාරීන් මුළු දිවයිනම ආවරණය වන පරිදි තෝරාගන්නා ලද අතර ඉදිරියේදී පාසල් මට්ටමින් වන පුහුණු හා දැනුවත් කිරීම් සඳහා ඔවුන් සම්පත් දායකයන් ලෙස යොදා ගැනේ. මෙම පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දෙන ලදී. ඒ අනුව දෙදින වැඩසටහන් ලෙස පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

| | ප්‍රතිපාදන ලබා දුන් කාරණය | ප්‍රතිපාදන මුදල රු. | පුහුණුකළ පුහුණුකරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ප්‍රථමාධාර හා මාර්ග සංඥා පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙදින වැඩමුළුව | 201,500/- | 45 |
| 02 | පාසල් මෘදු කුසලතා හා උපදේශන වැඩසටහන සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ දෙදින වැඩමුළුව | 307,350/- | 60 |
| 03 | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | 199,000/- | 60 |

### 5.3 තිරසර පාසල් වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම

තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක වන පාසල්වල විදුහල්පතිවරු හා කමිටු භාර ගුරුභවතුන් තිරසර පාසල් වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම මේ යටතේ සිදු කරන ලදී. තිරසර පාසල් සමස්ත වැඩසටහන පිළිබඳව සහ එක් එක් කමිටු භාර ගුරුවරුන් තමන්ට අදාළ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරනු ලබයි. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලබා දෙන ලදී.

| | ප්‍රතිපාදන ලබා දුන් ආයතනය | ලබා දුන් ප්‍රතිපාදන මුදල | දැනුවත් කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම | 250,000/- | 4500 |
| 02 | තිරසර පාසල් වැඩසටහනෙහි පරිසර කමිටුභාර ගුරු භවතුන් දැනුවත් කිරීම | 5,128,400/- | 3409 |
| 03 | තිරසර පාසල් වැඩසටහනෙහි මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුභාර ගුරු භවතුන් දැනුවත් කිරීම | 5,128,400/- | 3409 |
| 04 | තිරසර පාසල් වැඩසටහනෙහි ළමා සුරක්ෂිතතා කමිටුභාර ගුරු භවතුන් දැනුවත් කිරීම | 5,128,400/- | 3409 |

### 5.4 " කළණ මිතුරු - පොත් සුමිතුරු " වැඩසටහන

පාසල් දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පුස්තකාල ශාඛාව එක්ව " කළණ මිතුරු - පොත් සුමිතුරු " වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. පාසල් දරුවන් පොත්පත් කියවීම සඳහා අභිප්‍රේරණය කර ගැනීම සඳහාත් ඔවුන් වෙත උසස් රසවින්දන හැකියාවක් ළඟා කර දීමේ මෙම වැඩසටහනෙහි අරමුණ වේ. මෙහි සමාරම්භක උත්සවය 2017 සැප්තැම්බර් මස 06 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොටුව ජනාධිපති මන්දිරයේදී පවත්වන ලදී.





**සමාරම්භක උත්සවය - කොටුව ජනාධිපති මන්දිරය**

එහි පළමු අදියර ලෙස සියලුම උසස් පෙළ සහිත පාසල්වල පුස්තකාල වෙත පොත් කට්ටල (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) දෙක බැගින් ලබා දෙන ලදී. විශේෂ ජාතික මෙහෙයුම් කමිටුවක් මේ සඳහා පත් කර ඇති අතර ඔවුන් විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාතික මට්ටමින් වූ තරඟාවලියක් සකස් කරනු ලැබේ.

**ජාතික මෙහෙයුම් කමිටුව**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
කොළඹ විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

## 5.5 මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන **" පරිස්සමින් ගිහින් එන්න "** මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය තිරසර පාසල් වැඩසටහන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා තිරසර පාසල් වැඩසටහන යටතේ ස්ථාපනය කළ මාර්ග ආරක්ෂණ කමිටු තවදුරටත් ශක්තිමත් කරමින් ඔවුන් සඳහා වැඩමුළු පවත්වන ලදී. ඒ සඳහා වන මාධ්‍ය ප්‍රචාරණය හා අනෙකුත් සන්නිවේදන පහසුකම් ජාතික රූපවාහිනිය විසින් ලබා දෙනු ලබයි. මෙයට අමතරව මාර්ග ආරක්ෂාව සම්බන්ධව කටයුතු කරන වෙනත් ආයතන මේ සඳහා දායකත්වය ලබා දෙනු ලබයි.





**මාර්ග ආරක්ෂණ වැඩසටහන් - නාලන්ද මහා විද්‍යාලය**

## 5.6 තිරසර පාසල් වෙබ් අඩවිය නිර්මාණය කිරීම

**"තිරසර පාසල් වැඩසටහනෙහි"** තොරතුරු, දැන්වීම්, පාසල් වෙත දැනුම් දීමට හා වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ අපේක්ෂාවෙන් වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී. (www.thirasarapasal.gov.lk) මෙය ජාතික, පළාත්, කලාප හා පාසල් මට්ටමින් යුක්ත වේ. මෙමඟින් පාසල් මට්ටමින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමට හැකිවේ. එමඟින් තිරසර පාසල් වැඩසටහන සක්‍රීය මට්ටමින් පාසල් තුළ ක්‍රියාත්මක කිරීමට පහසු වනු ඇත. එමෙන්ම එක් එක් පාසල්හි නව ක්‍රියාකාරකම්, නවාකරණයන් පිළිබඳ අනෙකුත් පාසල්වලට ද දැනුවත්භාවයක් ලබාගත හැකිවනු ඇත.







## 06. ආගමික කටයුතු ඒකකය

### 6.1 හැඳින්වීම

ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන ආගමික කටයුතු ඒකකය අතිගරු ජනාධිපතිතුමන් වෙනුවෙන් එතුමන් විසින් ඉටුකිරීමට නියමිතව ඇති ආගමික කටයුතු සම්බන්ධව මූලික වී කටයුතු කරයි. සියලු ආගම් මූලික කොටගෙන පවත්වනු ලබන සාකච්ඡා, උත්සව, ඉදිකිරීම් කටයුතු සම්බන්ධව සොයාබලා අතිගරු ජනාධිපතිතුමන් වෙනුවෙන් අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටුකරයි.

**දැක්ම**

සියලු ආගම් වෙත එකසේ සිය ශාසනික සේවය ඉටුකිරීම සඳහා උපකාර සිදුකිරීම

**මෙහෙවර**

අතිගරු ජනාධිපතිතුමන් වෙනුවෙන් ජනාධිපති කාර්යාලයෙන් ඉටුවිය යුතු කාර්යයන් ඉටුකිරීම

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

- සදහම් යාත්‍රා වැඩසටහන් මාසිකව ක්‍රියාත්මක කිරීම
- සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම පැවැත්වීම
- ජාතික වෙසක් උත්සවයේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- බෞද්ධ බුද්ධි මණ්ඩලය, බෞද්ධ උපදේශක සභාව වැනි බෞද්ධ සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම
- වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රධාන පෙරහැර මංගල්‍යයන් සම්බන්ධීකරණය කිරීම
- ජනාධිපති කාර්යාලයේ සහභාගීත්වයෙන් අතිගරු ජනාධිපතිතුමන් වෙනුවෙන් දීපව්‍යාප්තව පවත්වන ආගමික වැඩසටහන්වල සම්බන්ධීකරණය සිදුකිරීම







**2017 වර්ෂයේදී සිදුකරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ**

**6.2 සදහම් යාත්‍රා ධර්ම දේශනා මාලාව**

| | **මාසය** | **දිස්ත්‍රික්කය** | **විහාරස්ථානය** | **සංවර්ධන කටයුතු (රු.)** | **සංවිධාන කටයුතු වියදම (රු.)** | **මුළු වියදම (රු.)** |
|---|---|---|---|---|---|---|
| 01 | ජනවාරි | කොළඹ | පන්නිපිටිය, රුක්මලේ විහාරස්ථානය | | 278,324.00 | 278,324.00 |
| 02 | පෙබරවාරි | පුත්තලම | කරුවලගස්වැව, වෙහෙරගල විහාරස්ථානය | 221,953.84 | 606,720.84 | 828,674.68 |
| 03 | මාර්තු | පොළොන්නරුව | හිඟුරක්ගොඩ, උණගලා විහාරස්ථානය | | 287,389.00 | 287,389.00 |
| 04 | අප්‍රියෙල් | ත්‍රිකුණාමලය | කන්තලේ, වෙළුන්නා විහාරස්ථානය | 62,277.55 | 404,699.95 | 466,977.50 |
| 05 | මැයි | කෑගල්ල | ගල්ගමුව, වට්ටාරම විහාරස්ථානය | | 50525.00 | 50525.00 |
| 06 | ජුනි | පොළොන්නරුව | මැදිරිගිරිය, වටදාගෙය විහාරස්ථානය | | 245,030.00 | 245,030.00 |
| 07 | ජූලි | ගම්පහ | අත්තනගල්ල, වාරණ විහාරස්ථානය | | 140,210.00 | 140,210.00 |
| 08 | අගෝස්තු | කළුතර | බණ්ඩාරගම, උභයවාපිකාරාම විහාරස්ථානය | | 360,657.50 | 360,657.50 |
| 09 | සැප්තැම්බර් | වවුනියාව | මඩුකන්ද විහාරස්ථානය | 39,725.00 | 247,910.00 | 287,635.00 |
| 10 | ඔක්තෝබර් | ගම්පහ | යටවත්ත, පුරාණ විහාරස්ථානය | 380,800.00 | 835,312.50 | 1,216,112.50 |
| 11 | නොවැම්බර් | කොළඹ | නාරාහේන්පිට, ධර්මායතන විහාරස්ථානය | | 303,451.00 | 303,451.00 |
| 12 | දෙසැම්බර් | කොළඹ | බම්බලපිටිය, වජිරාරාම විහාරස්ථානය | 443,859.00 | 718,629.00 | 1,162,488.00 |
| එකතුව | | | | 1,148,615.39 | 4,478,858.79 | 5,627,474.18 |

**සදහම් යාත්‍රා - 2017 දෙසැම්බර් - බම්බලපිටිය, වජිරාරාම විහාරස්ථානය**



## 6.3 පෙරහැර කටයුතු සම්බන්ධීකරණය

විශේෂයෙන් පහත ප්‍රධාන පෙරහැරවල් ඇතුළු දිවයිනේ අනෙකුත් පෙරහැර කටයුතු වල සම්බන්ධිකරණය හා අවශ්‍ය පහසුකම් සැපයීම ආගමික කටයුතු අංශය මගින් සිදුකෙරේ.

- ඓතිහාසික මහනුවර දළදා පෙරහැර
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පෙරහැර
- බෙල්ලන්විල පෙරහැර

මෙහිදී විශේෂයෙන් මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහැර සමාප්තිය සනිටුහන් කරමින් සන්නස් පත්‍රය භාරදීමේ උත්සවයේ සංවිධාන කටයුතු මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සම්බන්ධ වී සිදුකරනු ලැබේ. එහිදී මෙම උත්සවය සඳහා ආරාධනා පත්‍ර මුද්‍රණය, ආරාධිතයින් හට ආරාධනා කිරීම, විශේෂ අමුත්තන් සඳහා සංග්‍රහ කිරීම, නිවේදන කටයුතු සිදුකළ ශිල්පීන්ගේ ගෙවීම් කටයුතු සඳහා හා පෙරහැරේ දක්ෂතා දක්වන ලද ශිල්පීන් වෙත සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා වූ වියදම්වලට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදීම වැනි කටයුතු සිදුකරන ලදී.



**ඓතිහාසික දළදා පෙරහැරේ සමාප්ති උත්සවය**



**ඓතිහාසික දළදා පෙරහැරේ දක්ෂතා දැක්වූ ශිල්පීන් හට සම්මාන ප්‍රදානය**

## 6.4 අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු

2017 වසරේදී පහත වැඩසටහන්වල සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශය මගින් සිදු කරන ලදී.

- එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උත්සවය
- 7 වන ලෝක බෞද්ධ සමුළුව
- ජනාධිපති කාර්යාලය අවට වෙසක් කලාපය
- බෞද්ධාලෝක වෙසක් කලාපය
- ජනාධිපති මන්දිරයේදී පැවති දීපවාලී සැමරුම් උත්සවය
- ජාතික වෙසක් උත්සවය - කෑගල්ල, වට්ටාරම ශ්‍රී අරහත්ත පුරාණ විහාරස්ථානය
- තිරසර යුගයක දෙවසරක ඇරඹුම වෙනුවෙන් ස්වාමීන්ද්‍රයාණන් වහන්සේලා 2000ක් වෙනුවෙන් පැවති දානමය පිංකම
- වාර්ෂික පිච්ච මල් පූජාව
- අමරපුර මහා නිකායේ උපසම්පදා උත්සවය
- ලක්වැසියන්ටත්, අතිගරු ජනාධිපතිතුමන්ටත් සෙත්පතා නිදහස් චතුරශ්‍රයේදී පැවති පිරිත් සජ්ඣායනාව
- විවිධ පළාත් වල අතිගරු ජනාධිපතිතුමා සහභාගීවන ආගමික උත්සව සම්බන්ධීකරණය
- අපවත් වී වදාළ විවිධ ප්‍රදේශයන්හි වැඩවිසූ නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේලාගේ අවමංගල්‍යය උත්සව සම්බන්ධීකරණය








### 07. වෙනත් විශේෂ වැඩසටහන්

ප්‍රධාන ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමතරව "සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති" අංශය මගින් 2017 වසරේ වෙනත් විශේෂ කාර්යයන්ද ඉටු කරන ලදී.

#### 7.1 කලා සංස්කෘතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම

පුරවැසි ආරම්භයක්වූ කලා සංස්කෘතික ප්‍රතිපත්ති ඒකකය විසින් අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව පාර්ශ්වකාරී ආයතනවල සහභාගීත්වය හා දායකත්වය ඇතිව අතිගරු ජනාධිපතිතුමන් විසින් අමාත්‍ය මණ්ඩලය වෙත 2017.11.13 දිනැති **" සහනුබද්ධ ජීවනය පදනම් කරගත් ශ්‍රී ලංකාවක් " සඳහා පසුබිම සැකසීම උදෙසා ජාතික කලා - සංස්කෘතික ප්‍රතිපත්තියක් බල ගැන්වීම"** නැමැති අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කර ඉදිරිපත් කරන ලදී.

එම සංදේශය සම්බන්ධව ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජනාධිපති කාර්යාලයට අනුබද්ධිතව ජාතික සංස්කෘතික පුනර්ජීවනය අරමුණු කර ගන්නා විශේෂ මෙහෙයුම් ඒකකයක් ස්ථාපනය කර එයට අවශ්‍ය පහසුකම් සැපයීමට උපදෙස් ලබා දී ඇත.

එම ඒකකය යටතේ පහත ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවමින් පවතී.

1. සාරවත්, පරිපූර්ණ හා නම්‍යශීලී ජාතික කලා සහ සංස්කෘතික ප්‍රතිපත්ති යෝජනාවක් පුළුල් මත විමසුම් ක්‍රියාවලියක් ඔස්සේ කෙටුම්පත් කොට, රජය වෙත ඉදිරිපත් කිරීම.
2. රාජ්‍ය කලා හා සංස්කෘතික ආයතන සඳහා විස්තරාත්මක ප්‍රතිසංස්කරණ යෝජනා, පර්යේෂණ ක්‍රියාදාමයක් ඔස්සේ යමින් සම්පාදනය කොට, සම්පූර්ණ කරන ලද ආයතනික ප්‍රතිසංස්කරණ යෝජනාවලිය රජය වෙත ඉදිරිපත් කිරීම.
3. රජයේ මෙන්ම පෞද්ගලික ක්ෂේත්‍රයේ ආධාර සහිතව ජාතික කලා-සංස්කෘතික අනුරක්ෂණ අරමුදලක් සමාජ භාර පදනමකින් ස්ථාපනය කිරීම.
4. ශ්‍රී ලාංකික ජනතාවගේ සංස්කෘතික විඥාණය පුළුල් කර කලාව හා සංස්කෘතිය ඔවුන්ගේ පෞද්ගලික හා සමාජ ජීවිතයේ ප්‍රමුඛස්ථානයකට ගෙන ඒම උදෙසා අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මීට සමගාමීව ජාතික කලා -සංස්කෘතික සම්පත් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.
5. පවතින අධ්‍යාපන ක්‍රමය තුළ විචාරාත්මක සංස්කෘතික අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දීම සඳහා මැදිහත් වෙමින් සංස්කෘතික වශයෙන් වඩාත් සහනුබද්ධ අනාගත පරපුරක් බිහිකිරීමට දායක වීම.
6. සමාජ සාධාරණත්වය සහ සමාජ ඒකාබද්ධතාව මෙන්ම විපරිවර්තනය සහ යහපාලනය උදෙසා සංස්කෘතික පදනමක් වශයෙන් පුරවැසි ‘යහජීවනය’ පිළිබඳ දැක්මක් ශ්‍රී ලාංකික සමාජයට ලබා දීම.
7. කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සංවර්ධනය මෙන්ම දකුණු ආසියානු කලාපයේ සංස්කෘතික අයිතීන් පිළිබඳ තේමා අළලා විපර්යකාරක කලාපීය සංස්කෘතික සංවාදයකට මුලපිරීම සහ යුනෙස්කෝ ආයතනයේ අනුග්‍රහය ද සහිතව සංස්කෘතික අයිතීන් පිළිබඳ දකුණු ආසියාතික ප්‍රඥාප්තියක් සම්මත කර ගැනීම.
8. ජාතික ප්‍රතිපත්ති සම්පාදනය තුළ කළාත්මක ප්‍රදානයන් සහ සංස්කෘතික සංවේදනයන් නිරතුරුව අන්තර්ග්‍රහණය වීම සහතික වන තත්ත්වයක් ඇති කිරීම.
9. ශ්‍රී ලාංකික කලා කරුවාගේ , කලාවේ සහ කලා කර්මාන්තයන්ගේ ප්‍රතිරූපය ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.
10. ශ්‍රී ලංකාවේ මෙම සංස්කෘතික මුලපිරීමට ජාත්‍යන්තර අවධානය යොමු කරවාගැනීම සහ ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීම.
11. යුනෙස්කෝ ආයතනය විසින් ජාත්‍යන්තර වශයෙන් අනුමත කරන ලද ප්‍රතිපත්තීන් හා ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමුකර ජාතික වශයෙන් උචිත පරිදි අනුකූලව ක්‍රියාකිරීම.
12. මහජන සේවා සන්නිවේදනය හා මාධ්‍ය සාක්ෂරතාවය දියුණු කිරීම අරමුණු කරගත් වැඩපිළිවෙළකට නායකත්වය දී මහජන-හිතෛෂී මාධ්‍ය සංස්කෘතියකට පදනම දැමීම.

### 7.2 ජාතික පොත් ප්‍රතිපත්තියක් සකස් කිරීම

ජනතා ලේඛක පෙරමුණ සහ ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය විසින් ජාතික පොත් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද යෝජනාවලිය සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබා දුන් උපදෙස් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු පාර්ශ්වකරුවන්ගේ දායකත්වය ඇතිව **“ ජාතික පොත් ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම”** යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කරන ලදී.

2011 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් කරන ලද **ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය** යටතේ නැවත පිහිටුවා එමඟින් එම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට හා ඊට අවැසි විධිවිධාන ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ මූලික අරමුණ වන බැවින්, එම අමාත්‍ය මණ්ඩල කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා යවන ලදී. ගරු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ද මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර ඇති බවත්, ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මීට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයක ඉදිරිපත් කරන බව දන්වා ඇත. **ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය මගින් යෝජිත** ජාතික පොත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව අප වෙත දන්වා ඇත.

### 7.3 "අපේ සුවය රටේ සවිය" - සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

වෛද්‍යවරුන් ප්‍රමුඛ වෘත්තීයවේදීන් සහ කලාකරුවන් පිරිසකගෙන් සැදුම්ලත් " **සුව දිවි පදනම**" විසින් බෝ නොවන රෝග වළක්වා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ක්‍රියාවට නංවන ලෙසට අතිගරු ජනාධිපතිතුමන් විසින් උපදෙස් ලබා දී ඇත.

එම යෝජනාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යතුමාද අවශ්‍ය උපදේශකත්වය සහ තාක්ෂණික සහයෝගය ලබාදීමට එකඟතාවය පළ කර ඇත.

ඒ අනුව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා උපදෙස් යටතේ **සුව දිවි පදනම** මඟින් සම්බන්ධීකරණය සිදු කර " **අපේ සුවය රටේ සවිය** " නමින් යෝජිත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් මේ වන විට සකස් වෙමින් පවතී.

### 7.4 රට වෙනුවෙන් පිබිදෙන පුලතිසි යෞවනය - තරුණ කඳවුර - 2017

දේශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලියට කාර්යක්ෂම ලෙස දායක විය හැකි නායකත්ව ගුණාංගවලින් සහ පෞරුෂත්වයෙන් සපිරි තරුණ පරපුරක් බිහි කිරීම උදෙසා ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වූ, රට වෙනුවෙන් පිබිදෙන පුලතිසි යෞවනය, තරුණ කඳවුරේ සමාරම්භක උත්සවය ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2017 මාර්තු 10, 11, 12 යන තෙදින තුළ පොළොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විණි. මෙහිදී විශේෂයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන, පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන පිළිබඳ තරුණ තරුණියන් 3000 ක් පමණ දැනුවත් කරන ලද අතර ඔවුන් තුළ පෞරුෂත්වය, කණ්ඩායම් හැඟීම් සහ නායකත්වය ඉහළ නැංවීමට ක්‍රියාකාරකම් රැසක් සංවිධානය කරන ලදී. එසේම ඔවුන්ට අනාගත වෘත්තීන් / රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා විවිධ ආයතන මගින් මගපෙන්වීම හා උපදේශන සේවා ලබා දෙන ලදී.



13 - CM 26894





| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 1 | 2017.01.02 | වකුගඩු නිවාරණ කටයුතු වෙනුවෙන් සිදුකරන ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 2 | 2017.01.02 | උතුරු නැගෙනහිර ඇතුලු දිස්ත්‍රික්ක රැසක් නියෝජනය වන පරිදි විහාරස්ථාන 146 ක් සඳහා විහාරාධාර ලබාදීම | ආගමික |
| 3 | 2017.01.05 | තරුණ කඳවුර - පොළොන්නරුව පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 4 | 2017.01.09 | මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳ සාකච්ඡාව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 5 | 2017.01.13 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 6 | 2017.01.13 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ මාධ්‍ය සකච්ඡාව | තිරසර පාසල් |
| 7 | 2017.01.16 | ඉන්දියාවේ තේසනි හර්බල් ආයතනයේ නියෝජිතයින් සමග ජල පිරිපහදු යන්ත්‍ර පිළිබඳ පැවති සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 8 | 2017.01.16 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 9 | 2017.01.16 | පොළොන්නරුව තරුණ කඳවුර පිළිබඳව සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 10 | 2017.01.19 | තිරසර පාසල් වැඩසටහනෙහි ප්‍රගතිය පිළිබඳ සමාලෝචන රැස්වීම | තිරසර පාසල් |
| 11 | 2017.01.20 | පොළොන්නරුව තරුණ කඳවුර පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 12 | 2017.01.23 | නාරාහේන්පිට අභයාරාමය අභිනව හිටිපිළිම වහන්සේගේ නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය සහ නිරාවරණ පිංකම | ආගමික |
| 13 | 2017.01.23 | පොළොන්නරුව තරුණ කඳවුර පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 14 | 2017.01.24 | පරිසර සංරක්ෂණ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 15 | 2017.01.26 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘතීන්වලට අදාළ ප්‍රගතිය විමසා බැලීමේ රැස්වීම. | ප්‍රගති සමාලෝචන |
| 16 | 2017.01.28 | දුම්කොළ වගාව පාලනය පිළිබඳ සාකච්ඡාව | මත්ද්‍රව්‍ය නිවාරණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 17 | 2017.01.29 | දුම්කොළ වගාව පාලනය පිළිබඳ සාකච්ඡාව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 18 | 2017.01.30 | හරිත දේශගුණ අරමුදල පිළිබඳව සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 19 | 2017.01.30 | ජනාධිපති අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රමය පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 20 | 2017.01.31 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන |
| 21 | 2017.02.01 | ගරුඅජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා සමඟ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික වැඩසටහන් පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 22 | 2017.02.06 | වකුගඩුරෝග නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම | වකුගඩු රෝග නිවාරණය |
| 23 | 2017.02.06 | ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් සමඟ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 24 | 2017.02.08 | ඛනිජ කැපීම් හා පහත්බිම් ගොඩකිරීම පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 25 | 2017.02.09 | පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 26 | 2017.02.09 | කොළඹ නගර අලංකරණය හා පළාත් පාලන ආයතනවල කසළ කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 27 | 2017.02.09 | ප්‍රතිපාදන ලබාදුන් ආයතන සමග ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන |
| 28 | 2017.02.13 | ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 29 | 2017.02.13 | නකල්ස් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 30 | 2017.02.15 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 31 | 2017.02.16 | ජනාධිපති කාර්යාලයේ කසළ කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 32 | 2017.02.16 | එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින උළෙලට සමගාමීව වෙසක් සැරසිලි සිදුකිරීම පිළිබඳ සාකච්ඡාව | ආගමික |
| 33 | 2017.02.17 | වකුගඩු රෝග නිවාරණය පිළිබඳ ප්‍රගතිය පරික්ෂා කිරීම | වකුගඩු රෝග නිවාරණය |
| 34 | 2017.02.21 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 35 | 2017.02.27 | පොළොන්නරුව තරුණ කඳවුර පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 36 | 2017.03.05 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 37 | 2017.03.10 | කොළඹ හා තදාසන්න ප්‍රදේශවල කසළ කළමනාකරණය විධිමත්ව කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 38 | 2017.03.22 | සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රගති සමාලෝචන රැස්වීම | ආගමික |
| 39 | 2017.03.30 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 40 | 2017.04.03 | ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 41 | 2017.04.04 | ජනාධිපති බෞද්ධ පුනරුද අරමුදල සඳහා අනුග්‍රාහක භවතුන් සමඟ පැවති සාකච්ඡා | ආගමික |
| 42 | 2017.04.04 | බෞද්ධාලෝක වෙසක් කලාපයේ සැරසිලි පිළිබඳ සාකච්ඡාව | ආගමික |
| 43 | 2017.04.06 | ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 44 | 2017.04.06 | බදුල්ල දිස්ත්‍රික්කයේ රක්ෂිත ගැසට් කිරීම සම්බන්ධව සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 45 | 2017.04.06 | “දරුවන්සුරකිමු” ජාතික වැඩසටහනේ ක්‍රියාකාරකම් තිරසර පාසල් තුළද ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 46 | 2017.04.20 | යුධහමුදා මෙහෙයුම් මැදිරියේ නිලධාරින් සඳහා වූ මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩමුළුව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 47 | 2017.04.21 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 48 | 2017.04.25 | යුධහමුදා මෙහෙයුම් මැදිරියේ නිලධාරින් සඳහා වූ මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩමුළුව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 49 | 2017.05.02 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් පුහුණු කිරීම | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 50 | 2017.05.03 | ජාතික ශිෂ්‍ය බට කණ්ඩායම, රතු කුරුස සංගමය හා බාලදක්ෂ හමුව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 51 | 2017.05.03 | පුස්කොළපොත් සංරක්ෂණය පිළිබඳව නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 52 | 2017.05.04 | වව්නියාව බෝගස්වැව ජනපදයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 53 | 2017.05.08 | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අජීවී බෙල්ලන්ගේ කවච කැනීම හා ප්‍රවාහනය සම්බන්ධ ගැටලු | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 54 | 2017.05.08 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ ජාතික වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රගති සමාලෝචන |
| 55 | 2017.05.15 | දේශීය කුඩා පරිමාණ ජලවිදුලි බල ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 56 | 2017.05.15 | පරිසර මිතුරු සිරිපා සමය වැඩසටහන ප්‍රගති සමාලෝචන රැස්වීම | පරිසර සංරක්ෂණය |
| 57 | 2017.05.15 | Rajini's Aqua GOD සමාගම විසින් හඳුන්වා දෙන ලද ප්‍රති ආශ්‍රැතිකරණ ජල පද්ධති පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 58 | 2017.05.16 | ඩෙංගු උවදුර පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 59 | 2017.05.25 | වකුගඩුරෝග නිවාරණය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ ප්‍රචාරණ දැන්වීම් සැකසීම පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නියෝජිතයන් හා වෛද්‍ය සංජය හෙයියන්තුඩුව මහතා සමඟ පැවති සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 60 | 2017.05.29 | ජනමාධ්‍යවේදීන් සඳහා ආචාරධර්ම පද්ධතියක් සැකසීම පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 61 | 2017.05.30 | ජලපෝෂක සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 62 | 2017.05.31 | කුඩාජල විදුලි බලාගාර පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 63 | 2017.05.31 | අන්තර් ආගමික උපදේශක මණ්ඩල විශේෂ සාකච්ඡාව | ආගමික |
| 64 | 2017.06.01 | ජාතික වැඩසටහන්වල ප්‍රගති සමාලෝචනය පිළිබඳ විශේෂ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 65 | 2017.06.02 | ජලපෝෂක සංරක්ෂණය පිළිබඳ වැඩසටහන | පරිසර සංරක්ෂණය |
| 66 | 2017.06.05 | ආබාධිත පුද්ගලයින් සහ වැඩිහිටියන් සවිබල ගැන්වීම හා සුබසාධනය වෙනුවෙන් දැනට කරනු ලබන වැඩසටහන් සහ තවදුරටත් ඔවුන් සවිබල ගැන්වීම සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ විශේෂ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 67 | 2017.06.06 | චීන රජයේ ආධාර මත ඉදිකෙරෙන වකුගඩු රෝහල පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | වකුගඩු රෝග නිවාරණය |
| 68 | 2017.06.06 | ජාතික සංස්කෘතික හා කලා ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 69 | 2017.06.07 | ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 70 | 2017.06.15 | නව කසළ කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 71 | 2017.06.15 | වකුගඩුරෝගීන් සඳහා ජාතික වකුගඩු අරමුදලින් දක්වන දායකත්වය පුළුල් කිරීම පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 72 | 2017.06.16 | ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පිළිබඳ විශේෂ සාකච්ඡාව | මත්ද්‍රව්‍ය නිවාරණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 73 | 2017.06.19 | මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා කැඩෙට් නිලධාරින් පුහුණු කිරීම | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 74 | 2017.06.22 | වකුගඩුරෝග නිවාරණය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සකස් කිරිම සම්බන්ධව වෛද්‍ය සංජය හෙයියන්තුඩුව මහතා හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නියෝජිතයින් සමඟ පැවති සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 75 | 2017.06.22 | අන්තර් ආගමික උපදේශක මණ්ඩල සාකච්ඡාව | ආගමික |
| 76 | 2017.07.04 | වකුගඩු රෝගීන් සඳහා සුභසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 77 | 2017.07.06 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන | දරුවන් සුරක්ෂණය |
| 78 | 2017.07.07 | ජාතික පොත් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ වැඩමුළුව | වෙනත් විශේෂ |
| 79 | 2017.07.07 | මහාසූපවංශය ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 80 | 2017.07.11 | උතුරු පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | පරිසර සංරක්ෂණය |
| 81 | 2017.07.17 | ජාතික වැඩසටහන් පිළිබඳ ව ජනාධිපති ලේකම්තුමා සමඟ පැවති සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 82 | 2017.07.20 | අන්තර් ආගමික උපදේශන මණ්ඩල සාකච්ඡාව | ආගමික |
| 83 | 2017.07.20 | ජාතිකපොත් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ වැඩමුළුව | වෙනත් විශේෂ |
| 84 | 2017.07.24 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනයන්හි කසළ කළමනාකරණය විධිමත් කිරීම | පරිසර සංරක්ෂණය |
| 85 | 2017.07.31 | ජාතික වැඩසටහන් මඟින් 2017 වසරේ ලබා දුන් ප්‍රතිපාදනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ සාකච්ඡාව | ප්‍රගති සමාලෝචන |
| 86 | 2017.08.01 | සමාජහා මානසික බුද්ධි ඉගෙනීම පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |
| 87 | 2017.08.03 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කසළ කළමනාකරණය විධිමත්කිරීම සහ කාබනික පොහොර නිෂ්පාදනාගාරය පිහිටුවීම පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 88 | 2017.08.11 | පිවිතුරු සිරිපා සමය වැඩසටහන ප්‍රගතිය සමාලෝචනය - නුවරඑළිය දිස්ත්‍රික්කය | පරිසර සංරක්ෂණය |
| 89 | 2017.08.14 | ගෘහස්ථ වායු කළමනාකරණය | පරිසර සංරක්ෂණය |
| 90 | 2017.08.14 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ ඉදිරි කටයුතු සම්බන්ධ විශේෂ කාර්ය මණ්ඩල රැස්වීම | වෙනත් විශේෂ |
| 91 | 2017.08.15 | කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ පොලිතීන් භාවිතය අවම කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය සමග පැවති සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 92 | 2017.08.16 | ජාතික රුක් රෝපණ මාසය පිළිබඳ මූලික සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 93 | 2017.08.17 | විගණනය හා කළමනාකරණය පිළිබඳ රැස්වීම | වෙනත් විශේෂ |
| 94 | 2017.08.18 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව. | තිරසර පාසල් |
| 95 | 2017.08.24 | අන්තරාගමික උපදේශක මණ්ඩලයේ ප්‍රකාශන හා මාධ්‍ය භාවිතය පිළිබඳ අනු කමිටුව සාකච්ඡාව | ආගමික |
| 96 | 2017.08.28 | කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ පොලිතීන් භාවිතය අවම කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය සමග පැවති සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 97 | 2017.08.28/ 29 | දුම්කොළ වගාව පාලනය පිළිබඳ සාකච්ඡාව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 98 | 2017.08.30 | පුනරුදය ප්‍රගති සමාලෝචනය | පරිසර සංරක්ෂණය |
| 99 | 2017.08.30 | වකුගඩු රෝගීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | වකුගඩු රෝග නිවාරණය |
| 100 | 2017.08.30 | වකුගඩු රෝගී පවුල් සුභසාධනය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග සොයා බැලීමේ පර්යේෂණ වාර්තාව පිළිබඳ පූර්ව සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 101 | 2017.09.11 | වළවේ ගඟ රක්ෂිතය සංවර්ධනය කිරීම දෙවන අදියර පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 102 | 2017.09.19 | වකුගඩු රෝග නිවාරණය පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 103 | 2017.09.19 | වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්යසාධන බලකාය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රගති සාමාලෝචන රැස්වීම. | ප්‍රගති සමාලෝචන |
| 104 | 2017.09.21 | කසළ කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 105 | 2017.09.25 | ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණ හා වනරෝපා රුක් රෝපණ වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 106 | 2017.09.27 | ශ්‍රී ලංකාවේ වන වැස්ම 1% කින් වැඩිකිරීමේ නියමු ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 107 | 2017.10.03 | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අජීවී බෙල්ලන්ගේ කවච කැණීම සම්බන්ධ ගැටලු පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 108 | 2017.10.03 | ගම්පහ දිස්ත්‍රික් කසළ කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 109 | 2017.10.04 | දේශීය කුඩා පරිමාණ ජලවිදුලි බල ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 110 | 2017.10.07 | අන්තර් ආගමික උපදේශක සභාව - විශේෂ සාකච්ඡාව | ආගමික |
| 111 | 2017.10.09 | ආබාධිත දරුවන් සිටින පාසල් සඳහා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම පිළිබඳ සාකච්ඡාව | දරුවන් සුරක්ෂණය |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 112 | 2017.10.12 | දරුවන්ගේ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන | දරුවන් සුරක්ෂණය |
| 113 | 2017.10.19 | තිරසර පාසල් ප්‍රගති සමාලෝචනය | තිරසර පාසල් |
| 114 | 2017.10.19 | ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රගති සමාලෝචන |
| 115 | 2017.10.22 | දුම්කොළ නිවාරණය පිළිබඳ ගුවන් හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 116 | 2017.10.24 | වකුගඩු රෝගී පවුල් සුබසාධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡාව. | වකුගඩු රෝග නිවාරණය |
| 117 | 2017.10.24 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ වැඩසටහන් පිළිබඳව මාධ්‍ය අංශය සමග සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 118 | 2017.10.26 | ප්‍රතිපාදන ලබාදුන් ආයතන සමග ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන |
| 119 | 2017.10.27 | ගුවන් හමුදා නිලධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුව | මත්ද්‍රව්‍ය නිවාරණය |
| 120 | 2017.10.27 | 7 වන ලෝක බෞද්ධ සමුළුව පිළිබඳ පූර්ව සාකච්ඡාව | ආගමික |
| 121 | 2017.10.30 | ප්‍රගතිසමාලෝචන රැස්වීම - ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් සමග | ප්‍රගති සමාලෝචන |
| 122 | 2017.11.02 | ගම්පහ දිස්ත්‍රික් කසළ කළමනාකරණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 123 | 2017.11.16 | ඉන්දියාවේ තේසනි හර්බල් ආයතනයේ නියෝජිතයින් සමග ජල පිරිපහදු යන්ත්‍ර පිළිබඳ පැවති සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 124 | 2017.11.20 | ප්‍රතිපාදන ලබාදුන් ආයතන සමග ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන |
| 125 | 2017.11.23 | පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනේ මාධ්‍ය වැඩසටහන් සම්බන්ධයෙන් රූපවාහිනී සංස්ථාව සමග සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 126 | 2017.11.23 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම | ප්‍රගති සමාලෝචන |
| 127 | 2017.11.28 | ගම්පහ දිස්ත්‍රික් කසළ කළමනාකරණය විධිමත් කිරීම පිළිබඳ රැස්වීම | පරිසර සංරක්ෂණය |
| 128 | 2017.11.28 | පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනේ මාධ්‍ය වැඩසටහන් සම්බන්ධයෙන් රූපවාහිනී සංස්ථාව සමඟ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 129 | 2017.11.29 | සාගරය හා වෙරළ සංරක්ෂණය පිළිබඳ සාකච්ඡාව | පරිසර සංරක්ෂණය |
| 130 | 2017.11.29 | පිරිවෙන් අධ්‍යාපනය සඳහා මේස සහ පුටු ලබා දීමේ උත්සවය පිළිබඳ විශේෂ සාකච්ඡාව | ආගමික |
| 131 | 2017.11.29 | "1818 ඌව කැරැල්ලේ දෙසියවස් සැමරුම" පරිසංවාදය සඳහා වූ ව්‍යාපෘති යෝජනාවලිය පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |

| අනු අංකය | දිනය | රැස්වීම / සාකච්ඡාව | ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 132 | 2017.12.04 | පොළොන්නරුව තරුණ කඳවුර පිළිබඳ පසු විපරම් සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 133 | 2017.12.05 | පොලිතීන් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම පිළිබඳ වැඩසටහන | පරිසර සංරක්ෂණය |
| 134 | 2017.12.05 | ශ්‍රී දළදා මාළිගාවේ රන් ආලේප පිළිබඳ පූර්ව සාකච්ඡාව | ආගමික |
| 135 | 2017.12.08 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ රැස්වීම | තිරසර පාසල් |
| 136 | 2017.12.11 | සියලුම ආයතනවල ප්‍රතිපාදන ලබා දුන් ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රගති සමාලෝචන |
| 137 | 2017.12.20 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ රැස්වීම | තිරසර පාසල් |
| 138 | 2017.12.20 | ජපානයේ Fuji Innovation ආයතනය මඟින් පරිත්‍යාග කිරීමට නියමිත ජල පද්ධති සම්බන්ධ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 139 | 2017.12.22 | “අපේ සුවය රටේ සවිය ” ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාව | වෙනත් විශේෂ |
| 140 | 2017.12.27 | ගම්පහ දිස්ත්‍රික් කසල කළමනාකරණය පිළිබඳ රැස්වීම | පරිසර සංරක්ෂණය |
| 141 | 2017.12.27 | “තිරසර පාසල් වැඩසටහන” - වකුගඩු රෝග හා බෝ නොවන රෝග නිවාරණ ජාතික වැඩසටහන යටතේ සෑම පාසලකම භාවිතා කරනු ලබන පානීය ජලයෙහි ගුණාත්මකභාවය තහවුරු කරගැනීම පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 142 | 2017.12.28 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ක්‍රියාවට නංවන “පරිස්සමෙන් ගිහින් එන්න” මාර්ග ආරක්ෂාව පිළිබඳ වැඩසටහන හා ඒකාබද්ධව ජනාධිපති ලේකම් කාර්යාලය අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාවට නඟන තිරසර පාසල් වැඩසටහන - දරුවන් සුරකිමු ජාතික වැඩසටහන ක්‍රියාවට නැඟීම පිළිබඳ මූලික සාකච්ඡාව | තිරසර පාසල් |
| 143 | 2017.12.28 | 2018 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන යොදාගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡාව | ප්‍රගති සමාලෝචන |
| 144 | 2017.12.28 | නිදන්ගත වකුගඩු රෝග නිවාරණය සඳහා දේශීය ප්‍රතිකාර ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | වකුගඩු රෝග නිවාරණය |
| 145 | 2017.12.28 | තිරසර පාසල් වැඩසටහන යටතේ වකුගඩු රෝග හා බෝ නොවන රෝග නිවාරණය සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |
| 146 | 2017.12.29 | තිරසර පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡාව | තිරසර පාසල් |

# ජනාධිපති අරමුදල

## හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා ඇතුළු පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණ මත ජනාධිපති ලේකම් ඇතුලු ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම, සුදුසුකම් සපුරා ඇති අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා මූල්‍යාධාර ලබාදීම හා වෙනත් ව්‍යාපෘති සඳහා ද මූල්‍යාධාර පිරිනැමේ. එමෙන්ම සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ආදායමෙන් 50% ක මුදලක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ලබාදීමද ජනාධිපති අරමුදලේ කාර්යභාරයකි.

## ජනාධිපති අරමුදලේ අරමුණු

1. දරිද්‍රතාවයට සහන සැලසීම
2. අධ්‍යාපනය හෝ ඥාණය වර්ධනය කිරීම
3. ආගම් නංවාලීම සඳහා දායකත්වය ලබාදීම
4. ජාතිය වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම
5. ජනාධිපතිවරයාගේ හා පාලක මණ්ඩලයේ මතය අනුව මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කාර්යයන් ඉටුකිරීම

## 2017 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

1. 2017 වර්ෂයේදී ජනාධිපති අරමුදලේ ඇස්තමේන්තුගත ආදායම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් රුපියල් මිලියන 2500 ක් බලාපොරොත්තු විය. නමුත් දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් 2001-2009 කාලයට අදාළව හිඟ බදු වශයෙන් රුපියල් මිලියන 1807ක් 2017 වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම අය කර ගැනීම හේතුවෙන් මෙම අපේක්ෂිත මුදල ලබා ගැනීමට නොහැකි වූ අතර එම මුදලින් රුපියල් මිලියන 346.54ක් පමණක් ලැබුණි. මේ හේතුවෙන් ජනාධිපති අරමුදලෙන් කෙරෙන ප්‍රදානයන් අවම මට්ටමින්වත් පවත්වා ගෙන යාම සඳහා අංක අමප/17/1226/701/015 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් රුපියල් මිලියන 1000 ක මුදලක් අනුමත කරන ලදී.

| ආදායම ලැබුණු ආකාරය | මුදල (රුපියල් මිලියන) |
|---|---|
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් | 346.54 |
| පොලී ආදායම හා පරිත්‍යාග | 88.09 |
| ස්ථාවර තැන්පතු ඉවත් කර ගැනීම් හා වෙනත් ලැබීම් | 569.44 |
| ජනාධිපති අරමුදල සතුව තිබූ මුදල් | 6.44 |
| අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ලැබුණු මුදල් | 775.00 |
| එකතුව | 1785.51 |




2. දෛනිකව පැමිණෙන විශාල සේවාලාභීන් ප්‍රමාණයට හා කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම හේතුවෙන් දැනට ජනාධිපති අරමුදල් කාර්යාල පවත්වා ගෙන යන රේණුකා ගොඩනැගිල්ලේ 1 වන මහලේ කොටසක් ලබාගෙන ගිණුම් ඒකකය එහි ස්ථාපනය කිරීම

3. ජනාධිපති කාර්යාලයේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව ජනාධිපති අරමුදල් අංශයේ
    - වෛද්‍යාධාර ලබාදීමේ ඒකකය
    - ශිෂ්‍යත්ව ඒකකය
    - ගිණුම් ඒකකය

සඳහා විධිමත් කාර්යාල පිරි සැකැස්මක් සැලසුම් කර, නව වැඩ මේස හා පුටු ලබාගැනීම, සේවාලාභීන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම

4. ජනාධිපති අරමුදලේ වෙබ් අඩවිය යාවත්කාලීන තොරතුරු සහිතව නැවත සකස් කිරීම

5. ජනාධිපති අරමුදල් අංශයේ කටයුතු පරිගණකගත ස්වයංකරණ ක්‍රියාවලියක් යටතේ සිදුවන බැවින් එම පද්ධතියේ පවතින අඩුපාඩු සකස් කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් සපයා ගැනීම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුම සහිත මානව සම්පත් සපුරා ගැනීම

6. අ.පො.ස. (සා.පෙළ) සමත්ව අ.පො.ස. (උසස් පෙළ) හදාරන සිසුන්හට ජනාධිපති අරමුදලෙන් ලබාදෙන ශිෂ්‍යාධාරයට අදාළ සියලුම වාරික ගෙවා අවසන් කිරීම

7. ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයේ පුද්ගල සංවර්ධනය උදෙසා ජනාධිපති කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරන ලද පහත සඳහන් පුහුණු පාඨමාලා සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම

- වෘත්තීය දියුණුවට උපකාරී වන ආතති කළමනාකරණ ක්‍රමවේද සම්බන්ධ වැඩමුළුව
- සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතා වැඩ මුළුව
- ඵලදායී රාජ්‍ය සේවයක් හා සාර්ථක පෞද්ගලික ජීවිතයක් උදෙසා ධනාත්මක චින්තනය වැඩසටහන
- නිරෝගීමත් දිගු ජීවිතයක් සඳහා නිවැරදි ආහාර පුරුදු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව
- මිලෝදා ආයතනය මඟින් පවත්වන පුහුණු පාඨමාලා - Formal Letter Writing Skills
- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මඟින් සංවිධානය කළ කාර්යාල උපකරණ පිළිබඳ පාලනය පිළිබඳ වැඩමුළුව

8. ජනාධිපති අරමුදලේ වෛද්‍යාධාර ලබාදීම් පුළුල් කිරීම

ජනාධිපති අරමුදලේ වෛද්‍යාධාර ලබාදෙන රෝගාබාධ ප්‍රමාණය වැඩි කිරීම හා එක් එක් රෝගාබාධ සඳහා ලබාදෙන මූල්‍යාධාර ප්‍රමාණය සංශෝධනය කිරීම

- ගිලන්-බෙරේ සින්ඩ්‍රෝම් (Guillain-Barre Syndrome)
- අපස්මාරය සඳහා වූ සැත්කම (Epilepsy surgery)

9. ජනාධිපති අරමුදලේ වෛද්‍යාධාර ලබාදීම සඳහා නව රෝහල් ලියාපදිංචි කිරීම

| රෝහල | රෝගය |
|---|---|
| 1. ලීසන්ස් රෝහල, රාගම | රුධිර කාන්දුකරණ ප්‍රතිකාරය |
| 2. අපේක්ෂා රෝහල, මහරගම | ඇටමිදුළු බද්ධ කිරීමේ සැත්කමට පෙර සිදු කරන පරීක්ෂණ සඳහා |
| 3. ලංකා රෝහල, නාරාහේන්පිට | ඇටමිදුළු බද්ධ කිරීමේ සැත්කම |
| 4. බ්‍රවුන්ස් රෝහල, රාගම | රුධිර කාන්දුකරණ ප්‍රතිකාරය |
| 5. නාවින්න මෙඩිකෙයා රෝහල, මහරගම | උකුල් / දණහිස් / උරස් සන්ධි බද්ධ කිරීමේ සැත්කම හා<br>කොඳු ඇට පෙළ තෙරපීම සඳහා සිදු කරන සැත්කම |

2017 වර්ෂයේදී ජනාධිපති අරමුදලේ වියදම

| කාර්යය | මුදල (රුපියල් මිලියන) |
|---|---|
| වෛද්‍යාධාර සඳහා | 1357.50 |
| අධ්‍යාපන හා ශිෂ්‍යත්ව සඳහා | 172.16 |
| සුභ සාධන කටයුතු සඳහා | 7.95 |
| ආගමික කටයුතු සඳහා | 0.05 |
| සංස්කෘතික කටයුතු සඳහා | 3.40 |
| කලා කටයුතු සඳහා | 1.00 |
| මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල | - |
| එකතුව | 1542.06 |




**ජනාධිපති අරමුදල සතු මුදල් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇත.**

**සටහන : ඉහත දක්වා ඇති සංඛ්‍යාත්මක තොරතුරු දැනට විගණනය කරමින් පවතී.**

# මහජන සම්බන්ධතා අංශය

## හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා වෙතට යොමුවන සියලුම මහජන ගැටලු හා ඉල්ලීම් මෙන්ම රාජ්‍ය සේවක ගැටලු හා ඉල්ලීම් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවලට යොමු කර කඩිනම් සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වීම.

## ප්‍රධාන අරමුණු

01. තැපැල, දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපැල, ෆැක්ස් මගින් අතිගරු ජනාධිපතිතුමා වෙතට ඉදිරිපත් වන විවිධ ස්වරූපයේ මහජන ඉල්ලීම් සඳහා කඩිනම් ප්‍රතිචාර ලබාදෙමින් "ජනපතිට කියන්න" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

02. මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන මහජනතාවට කඩිනම් ප්‍රතිචාර ලබාදීම තුළින් ගැටලු විසඳීමට කටයුතු කිරීම.

03. මහජන උද්ඝෝෂණවලදී අතිගරු ජනාධිපතිතුමාට ලබාදෙන සංදේශ ලෙස ලබාදෙන මහජන ගැටලු සඳහා විසඳුම් ලබාදීමට රාජ්‍ය ආයතනවලට යොමු කර කඩිනම් ප්‍රතිචාර දැක්වීමට මැදිහත්වීම.

04. සේවක ගැටලු කළමනාකරණය සඳහා සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

05. ජනපති ජංගම සේවා වැඩසටහන්වලදී ලැබෙන මහජන දුක්ගැනවිලි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම.

### 2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

❖ **"ජනපතිට කියන්න" වැඩසටහන**

**පැමිණිලි ඉදිරිපත් වූ ආකාරය**

| මාධ්‍ය | ලැබුණු පැමිණිලි ගණන |
|---|---|
| තැපැල්මගින් | 41869 |
| දුරකථන මගින් | 12171 |
| වෙබ්අඩවිය සහ විද්‍යුත් තැපැල මගින් | 4536 |
| ෆැක්ස් මගින් | 455 |
| **එකතුව** | **59031** |




**පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම**

| | |
|---|---|
| කටයුතු කර අවසන් | 16623 |
| කටයුතු කරමින් පවතින | 32568 |
| කටයුතු කිරීම ආරම්භ කරමින් පවතින | 9840 |
| **එකතුව** | **59031** |



➢ 2017 වර්ෂයේදී ඩිජිටල් සමාජීය බලපෑම සඳහා වූ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන (Digital Social Impact Awards) සඳහා වන "ඊ ස්වාභිමානී" සම්මානයෙන් "රාජ්‍ය සහ පුරවැසි" අංශයෙන් ප්‍රථම ස්ථානය මෙම වැඩසටහනට හිමි විය.

❖ **මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන මහජනතාවගේ ගැටලු විසඳීමට කටයුතු කිරීම.**

මහජන සම්බන්ධතා අංශයට සෘජුව පැමිණෙන පුද්ගලයින් 4000කට අධික සංඛ්‍යාවකගේ ගැටලු සඳහා ධනාත්මක ප්‍රතිචාර දැක්වීමට හැකිවිය.

❖ **මහජන උද්ඝෝෂණ තුළින් අතිගරු ජනාධිපතිතුමාට ලබාදෙන සංදේශ සඳහා විසඳුම් ලබාදීම**

2017 වසර තුළ ඇතිවූ උද්ඝෝෂණ හා විරෝධතා තුළ රැකියා සුරක්ෂිතතාවය සම්බන්ධව 06ක්ද, මුදල් තැන්පත්කරුවන්ගේ ගැටලු සම්බන්ධව 03ක්ද, අලුතින් පනවන ලද නීති රීති හා රජය විසින් ගන්නා ලද තීන්දු තීරණ සම්බන්ධයෙන් 04ක් ද, රණවිරු සංගම් විසින් 06ක් ද, විශ්‍රාමිකයින්ගේ ගැටලු 04ක්ද, මානව අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් 05ක් ද, ඉඩම් අත්පත්කරගැනීම සහ වන්දි ලබා දීම සම්බන්ධයෙන් 04ක් ද, භික්ෂුන් වහන්සේලා විසින් ඉදිරිපත් කරන ලද සමාජීය ගැටලු 04 ක් ද, උපාධිධාරී ඉල්ලීම 01 ක් ද, විශ්ව විද්‍යාල සිසුන්ගේ ඉල්ලීම් 01ක් ද වශයෙන් මහජන උද්ඝෝෂණ 38 ක් සඳහා ධනාත්මක ලෙස ප්‍රතිචාර දැක්වීමට හැකි විය.

❖ **සේවක ගැටලු කළමනාකරණය සඳහා සියලුම අමාත්‍යාංශ / පළාත්සභා සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කරන විශේෂ වැඩ සටහන**

සියලුම රාජ්‍ය ආයතන වල සේවක ප්‍රජාව සඳහා තම රාජකාරිමය ගැටලු හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් නොවිසඳී ඇති ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හා එම ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී වැඩපිළිවෙලක් මගින් විසඳුම් ලබාදීම හෝ පැහැදිලි කිරීම් සඳහා අවස්ථාවක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට අමාත්‍යාංශ 34 ක ඉතා සාර්ථක ලෙස මෙම වැඩසටහන පවත්වා ඇති අතර, එහිදී බඳවා ගැනීම්, උසස්වීම් හා ස්ථිර කිරීම් සම්බන්ධ ගැටලු 1688ක් ද, වැටුප් හා දීමනා සම්බන්ධ ගැටලු 534ක් ද, ස්ථාන මාරු සම්බන්ධ ගැටලු 483ක් ද රාජකාරිමය හා වෙනත් ගැටලු 1009 ක්ද වශයෙන් සේවක ගැටලු 3714ක් සඳහා ඒ ඒ අමාත්‍යාංශ වලින් විසඳුම් ලබා දී ඇත.

❖ **ජනපති ජංගම සේවය මගින් ලැබෙන මහජන දුක්ගැනවිලි සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම**

ජනාධිපති කාර්යාලය මගින් පවත්වනු ලබන ජංගම සේවා වලදී අතිගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන මහජන ගැටලු හා ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමුකිරීමට මහජන සම්බන්ධතා අංශය මගින් කටයුතු කරන ලදි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලබන "නිල මෙහෙවර ජනපති ජනතා සේවය" නමින් දිවයිනේ සියලු පළාත් ආවරණය වන අයුරන් සිදු කෙරෙන ජංගම සේවා වැඩසටහන් වලදී ද ජනාධිපති කාර්යාලය වෙනුවෙන් සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

- වෙනත් කරුණු

මේ වන විට අමාත්‍යාංශ, පළාත් සභා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි “ජනපතිට කියන්න” වැඩසටහන පුළුල් ලෙස ව්‍යාප්ත වී ඇත.2017 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා භාවිතා කරන තොරතුරු පද්ධතියේ දෙවන අදියර සංවර්ධන කටයුතු අවසන් කරන ලදී. මහජන සම්බන්ධතා අංශය, සිංගප්පූරුවේ Temasek Foundation International හා Civil Service College යන ආයතන හා එක්ව “ජනපතිට කියන්න” වැඩසටහන නව්‍යකරණය හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශ 20 ක්, පළාත් සභා 03ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 02ක් සම්බන්ධ කරගනිමින් දින 04ක තොරතුරු රැස්කිරීමේ සමීක්ෂණයක් සිදු කරන ලදී.

“ජනපතිට කියන්න” වැඩසටහනේ නියාමන කටයුතු සඳහා ඇගයීම් හා සමාලෝචන ඒකකයක් පිහිටුවා ඇති අතර එමඟින් කාර්තුමය වශයෙන් අමාත්‍යාංශ, පළාත් සභා ඇතුළු රාජ්‍ය ආයතනික ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කරනු ලැබේ. එසේම ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මෙම ආයතනවල ප්‍රගතිය විමසීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් පැවැත්වීය. ආයතනවල පුහුණු අවශ්‍යතා ජනාධිපති කාර්යාලය වෙත කඩිනමින් දැනුම්දීම සඳහා support@presidentsoffice.lkනමින් විද්‍යුත් තැපැල් ලිපිනයක් නිර්මාණය කර ඇති අතර, 2017 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 20ක් පවත්වන ලදී.

# නීති අංශය

## හැදින්වීම

මෙම අංශය 2015 මාර්තු මස 18 වන දින පිහිටුවන ලද අතර, ජනාධිපති ලේකම් කාර්යාලය හා සම්බන්ධ සියලුම නීති කටයුතු මෙහෙයවීම හා උපදෙස් ලබා දීම සිදු කෙරේ.

## ප්‍රධාන කාර්යයන් හා අරමුණු

1. අතිගරු ජනාධිපතිතුමා විසින් අතිරේක ලේකම් (නීති) යොමු කරනු ලබන ජාත්‍යන්තර ගිවිසුම් කෙටුම්පත්, අණ පනත් හි කෙටුම්පත්, මහජන දුක්ගැනිවිලි හෝ නීති ක්ෂේත්‍රයට අදාල ලිපි ලේඛන මෙන්ම ජාත්‍යාන්තර වශයෙන් පැන නැගෙන නීතිමය ගැටළු අධ්‍යනය කර අදාළ වාර්තා කැඳවා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

2. ජනාධිපති ලේකම් විසින් නීති කේෂත්‍රයට අදාලව යොමු කරනු ලබන සියලුම ලිපි හා ගැටළු අධ්‍යනය කර අවශ්‍ය පරිදි නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා දීම හා ඒ සම්බන්ධයෙන් අදාල ලිපි ලේඛන සකස් කිරීම.

3. පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටවනු ලබන පරීක්ෂණ කොමිෂන් සභා

    i. ඉහත පරිදි පත් කරනු ලබන පරීක්ෂණ කොමිෂන් සභා වලට අදාලව ඉදිරිපත් කරනු ලබන **අන්තර් වාර්තා** අධ්‍යනය කර, සාරංශ ගත කිරීම හා අවශ්‍ය පරිදි ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම්තුමා දැනුවත් කිරීම.

    ii. මෙම කොමිෂන් සභා වලින් ඉදිරිපත් කරන **අවසන් වාර්තා** අධ්‍යනය කර කොමිසමේ නිර්දේශ පරිදි ජනාධිපතිතුමාගේ අවසරය සහිතව අදාල ආයතන වෙත ඉදිරි පියවර සඳහා යොමු කිරීම.

    iii. ඉහත කොමිෂන් සභා විසින් යෝජනා කරනු ලබන වෙනත් නිර්දේශයන් අදාල ආයතන වෙත අවශ්‍ය කටයුතු කිරීම සඳහා යොමු කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

4. අධිකරණ කටයුතු

    i. අතිගරු ජනාධිපතිතුමන් වග උත්තරකරු කරමින් ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් නඩු සහ ජනාධිපති ලේකම් හෝ එම කාර්ය මණ්ඩලයේ රාජකාරී සම්බන්ධයෙන් අධිකරණයේ පවරා ඇති නඩු සම්බන්ධීකරණය සහ අවශ්‍ය පරිදි නියෝජනය කිරීම.

    ii. අධිකරණයේ භාරයේ ඇති ජනාධිපති කාර්යාලයට අයත් දේපල මුදා හැරීමට අදාලව අධිකරණයේ පෙනී සිටීම හා සම්බන්ධීකරණය.

5. ජනාධිපතිතුමා විසින් පිහිටවනු ලබන වෙනත් කමිටු

   i. අදාළ කමිටු වාර්තා අධ්‍යනය කර නිර්දේශයන් අතිගරු ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

6. ජනාධිපති කාර්යාලයේ එදිනෙදා රාජකාරී කටයුතු සම්බන්ධයෙන් නෛතික ගැටලු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.

   i. අභ්‍යන්තර පාලන අංශය

      - ජනාධිපති කාර්යාලය විසින් කුලී පදනම මත ලබා ගන්නා ගොඩනැගිලි වලට අදාල ගිවිසුම් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
      - රාජ්‍ය ආයතන වෙතින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාල නීතිමය ලියකියවිලි සම්බන්ධයෙන් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

   a. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය (ICT)

      - මෙම අංශය විසින් තාක්ෂණික සේවාවන් ලබා ගැනීම සඳහා ඇතුලත් වන්නා වූ ගිවිසුම් හා කෙටුම්පත් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

   b. ප්‍රවාහන අංශය

      - ජනාධිපති කාර්යාලය වෙත කුලී පදනම මත ලබා ගන්නා වාහන වලට අදාල ගිවිසුම් හා කෙටුම්පත් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

   ii. මානව සම්පත් සංවර්ධන අංශය හා ආයතන සම්බන්ධීකරණ අංශය

      - ජනාධිපති කාර්යාලයේ සේවකයන් විසින් ණය ආපසු ගෙවීම් පැහැර හැරීම් සිදුකර ඇති අවස්ථාවලදී ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා ඒ සඳහා උපදෙස් ලබා දීම.
      - ස්වාධීන පරීක්ෂණ කොමිෂන් සභාවලට අදාල පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
      - ජනාධිපති කාර්යාලය යටතේ පවත්නා ආයතන වලට අදාල පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

   iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අංශය

      - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සිදු කරනු ලබන පත් කිරීම් හා ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම
      - ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යභාරයන් යටතේ සිදු කරනු ලබන පත් කිරීම් හා අනෙකුත් ක්‍රියාවන් සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම.

iv. ප්‍රතිපත්ති හා අමාත්‍යාංශ සම්බන්ධීකරණ හා පසුවිපරම් අංශය

- ජාතික වැදගත්කමකින් යුත් ගිවිසුම් අධ්‍යානය කර නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීම.

v. කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය

- ජාතික වැදගත්කමකින් යුත් පිබිදෙන පොළොන්නරුව ව්‍යාපෘතියට අදාල රාජ්‍ය ආයතන සමඟ ඇති කර ගන්නා ගිවිසුම් සඳහා නීතිමය සහය ලබා දීම.

vi. පුද්ගලික ලේකම් අංශය

- ජනාධිපතිතුමන් වෙත පුද්ගලිකව බාර දෙන මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හා නීතිමය උපදෙස් ලබා දීම.

vii. විශේෂ ව්‍යාපෘති අංශය

- මෙම අංශය මඟින් විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී පුද්ගලික අංශය සමඟ එළඹෙන්නාවූ ගිවිසුම් අධ්‍යානය කර නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීම.
- NADep ආයතනයේ ගිවිසුම් අධ්‍යානය කර අදාල නිර්දේශ ලබා දීම.

7. අමාත්‍ය මණ්ඩල අනුකමිටු (Cabinet Sub Committee) වෙත යොමු කරන නීති කෙටුම්පත් සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ජනාධිපති කාර්යාලය වෙනුවෙන් දායකත්වය ලබා දීම.

8. අමාත්‍ය මණ්ඩලය විසින් ජනාධිපති ලේකම් වෙත යොමු කරන නව අණ පනත් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී නිරීක්‍ෂණ ඉදිරිපත් කිරීම.

9. නීතිපතිතුමන් හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.

10. විනිශ්චයකාරවරුන්ගේ ගැටලු හා ඒ සම්බන්ධ වැඩකටයුතු සම්බන්ධීකරණය කිරීම.

11. අතිගරු ජනාධිපතිතුමාගේ යෝජනාව පරිදි ජනාධිපති ලේකම් කාර්යාලයේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ ගැටලු හා යෝජනා එතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.

## 2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම

- 2016 වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ නඩු ගොනු සංඛ්‍යාව - 35
- 2017 වර්ෂයේදී ලැබුණු නඩු ගොනු සංඛ්‍යාව - 21
- **මුළු නඩු ගොනු සංඛ්‍යාව - 56**

| මුළු නඩු ගොනු සංඛ්‍යාව | 2017 වර්ෂය තුල අවසන් වූ නඩු ගොනු සංඛ්‍යාව | තවදුරටත් විභාග වෙමින් පවතින නඩු ගොනු සංඛ්‍යාව |
|---|---|---|
| 56 | 08 | 48 |



# අභ්‍යන්තර විගණන අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති සියලුම ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ ජනාධිපති ලේකම්වරයා විසින් පවරනු ලබන විශේෂ අභ්‍යන්තර විගණන විමර්ශණ කටයුතු සිදු කිරීම සඳහා ජනාධිපති ලේකම්වරයා යටතේ පිහිටුවා ඇති අංශයකි.

## අරමුණු

- ජනාධිපති කාර්යාලයේ සහ ජනාධිපති කාර්යාලය යටතේ ඇති සියලුම ආයතනවල මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වීම, එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම.

- වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයාට සහාය වීම .

2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම.

| අනු අංකය | සැලසුම | තත්ත්වය | ඵලදායීතා ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය | සමාප්ත | 100% |
| 2 | මූල්‍ය කළමනාකරණ අංශය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් හා ලේඛන | සමාප්ත | 100% |
| 3 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය | සමාප්ත | 100% |
| 4 | " පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය | සමාප්ත | 100% |
| 5 | සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මක වන පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන | සමාප්ත | 100% |
| 6 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | සමාප්ත | 100% |
| 7 | උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය | සමාප්ත | 100% |
| 8 | ජනාධිපති අරමුදල | සමාප්ත | 100% |
| 9 | ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන අංශයේ මූල්‍ය පාලනය හා පරිපාලන කටයුතු | සමාප්ත | 100% |
| 10 | නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල | සමාප්ත | 100% |
| 11 | " සිරිසර පිවිසුම " ත්‍රිකුණාමල දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත. | 75% |
| 12 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම (පැවැත්වීමට යෝජිත රැස්වීම් - 04) | රැස්වීම් 03 ක් පවත්වා ඇත | 75% |

# මාධ්‍ය ඒකකය

## හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන විශේෂ රැස්වීම් /සාකච්ඡා /උත්සව පිළිබඳ අනෙකුත් මාධ්‍ය ආයතන වෙත නිරවද්‍යතාවයෙන් හා වගකීමෙන් යුතුව තොරතුරු ලබා දීම.

### 2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්

| අංශයේ / ඒකකයේ නම : කර්තෘ ඒකකය | |
|---|---|
| **ක්‍රියාකාරකම** | **2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම (ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර)** |
| රජයේ සංවර්ධන ක්‍රියාවලියෙහි වසර 02ක ප්‍රගතිය කෘතිය සම්පාදනය කිරීම (ජනවාරි 8 සමරුව නිමිත්තෙන්) | සිංහල හා දෙමළ මාධ්‍යයෙන් කෘති 08ක් නිකුත් කර ඇත. ඒ සමඟ ජනාධිපති මාධ්‍ය ඒකකය මඟින් ප්‍රකාශයට පත් කර ඇති සමස්ත කෘති ප්‍රමාණය 21ක් වේ.<br>දෙවසරක සංවර්ධන මෙහෙවර<br>තිරසර දෙවසර (සිංහල)<br>තිරසර දෙවසර (දෙමළ)<br>පිබිදෙමු පොළොන්නරුව<br>Maithri – The Turning Point (Tamil)<br>ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග<br>මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය<br>මංගල දියවර රුඳවුම් මංගල්‍යය |
| ජනාධිපතිතුමාගේ දේශන ඇතුලත් කෘතියක් මුද්‍රණය කිරීම | "යුතුකම" කෘතිය මුද්‍රණය කර ඇත. (යුතුකම) |
| ජනාධිපතිතුමාගේ සංකල්ප සඟරාවක් සමාජගත කිරීම සඳහා සකස් කරන සඟරාවක් මුද්‍රණය කිරීම සඳහා | "වෙනස" සඟරාවේ කලාප 06ක් පසුගිය වසරේ ප්‍රකාශයට පත්කරන ලදී. |
| දිවයිනේ පළාත් කිහිපයක් කේන්ද්‍රගත කර ගනිමින් ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සඳහා සම්මන්ත්‍රණ | ජනාධිපතිතුමන්ගේ පුවත් ආවරණය කරන මාධ්‍යවේදීන් සමඟ සාකච්ජා වට 10ක් පසුගිය වසර තුල සිදු කර ඇත. |
| වෙනත් | සියළු අමාත්‍යාංශ නියෝජනය කරන මාධ්‍ය ලේකම්වරු සමඟ සාකච්ජා වට 02ක් සිදු කරන ලදී. |

| අංශයේ / ඒකකයේ නම : ජාත්‍යන්තර මාධ්‍ය හා පර්යේෂණ ඒකකය | |
|---|---|
| **ක්‍රියාකාරකම** | **2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම (ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර)** |
| තෝරාගත් කරුණු අනුව සාකච්ඡා වටමේස/ සංවාද සැසි පැවැත්වීම (Round Table Discussion / Seminars) | වට මේස සාකච්ඡා, ප්‍රවෘත්ති සාකච්ඡා, මාධ්‍ය සාකච්ඡා, සහ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පවත්වා තිබේ. |
| තාක්ෂණික භාණ්ඩ සඳහා | - |
| ලිපි සම්පාදනය කිරීම / භාෂා පරිවර්තනය | ජනාධිපතිතුමාගේ ව්‍යාපෘතිවලට අදාල ලිපි 120ක් සම්පාදනය කොට ඇත. |
| වෙනත් | - |

| අංශයේ / ඒකකයේ නම : වෙබ් අඩවි පරිපාලන ඒකකය | |
|---|---|
| **ක්‍රියාකාරකම** | **2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම (ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර)** |
| ජනාධිපතිවරයාගේ රාජ්‍ය වැඩ පිළිවෙල සමාජගත කිරීම හා ජාත්‍යන්තර සමාජයට ගෙන යාම | සැලකිය යුතු මට්ටමකින් ජාත්‍යන්තර සමාජයට ගෙන යා හැකි විය. ජනාධිපතිවරයාගේ ජාත්‍යන්තර සමුළු හා විදේශ සංචාර හරහා දෙස් විදෙස් මාධ්‍ය වෙත නිල අන්තර්ජාල මාධ්‍ය හරහා පුළුල් මෙහෙවරක් ඉටු කරන ලදී. |
| ජනාධිපතිවරයාගේ වැඩසටහන් හා නව දැනුම ගමට ගෙන යාම | සංවර්ධන පුවත් වැඩසටහන හරහා රටේ සංවර්ධනය ගමට ගෙන යාමට හැකි විය. නව දැනුම ගමට ගෙන යාම නිසි පරිදි සිදු නොවීම. |
| අන්තර්ජාල මෙහෙයුම් සහ ජනාධිපතිවරයාගේ නිල අන්තර්ජාල පද්ධතිය ප්‍රවර්ධන සහ යාවත්කාලීන කිරීම | නිසි පරිදි සිදු විය. එමෙන්ම එය යහපත් මට්ටමක ප්‍රවර්ධනය කර ගැනීමට හැකිවිය. |
| වෙනත් | ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය නැංවීම. සමාජ මාධ්‍ය තුල සාධනීය මට්ටමකට ගෙන ඒමට හැකිවිය. |

| අංශයේ / ඒකකයේ නම : වීඩියෝ කැමරා හා සංස්කරණ ඒකකය | |
|---|---|
| **ක්‍රියාකාරකම** | **2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම (ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර)** |
| 1. ගරු ජනාධිපතිතුමා සහභාගී වන වැඩසටහන්හි රූපවාහිනී මාධ්‍ය ආවරණ කටයුතු ඉටු කරමින් එහි වටිනා ප්‍රවෘත්තිය හැකි ඉක්මනින් මාධ්‍ය නාලිකා වෙත ලබා දීම | දිනකට සාමාන්‍ය - 03<br>වසර තුල - 1100 පමණ |
| 2. රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදනය<br>• සතිපතා විනාඩි 05ක වාර්තා වැඩසටහන් කිහිපයක් බාහිර පුද්ගලයින් ලවා නිෂ්පාදනය කිරීම<br>• දිනපතා විනාඩි 01ක වාර්තා වැඩසටහන<br>• මාසිකව විනාඩි 30ක වාර්තා වැඩසටහන නිෂ්පාදනය කිරීම<br>• මාසිකව ජනාධිපති කාර්යසාධන බලකායන්හි වැඩසටහන් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන නිෂ්පාදනය කිරීම<br>• ත්‍රෛමාසිකව ජනාධිපති කාර්යසාධන බලකායන්හි වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන නිෂ්පාදනය කිරීම | 48 පමණ<br><br>නැත<br>10<br><br>මෙම වැඩසටහන පිළිබඳ පර්යේෂණ සිදු කර නිෂ්පාදන යෝජනාවලිය සකසා ඉදිරි කටයුතු පිළිබඳ අනුමැතිය අපේක්ෂාවෙන් පවතී.<br>නැත |
| 3. අන්තර්ජාලය ආශ්‍රිතව වෙබ් රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යාම මෙය අන්තර්ජාලය ඔස්සේ ජනාධිපතිතුමාට මඩ ගැසීම්වලට සෘජුවම මුහුණදීමට මෙම වෙබ් නාලිකාව ක්‍රියා කර ඇත. | නව මාධ්‍ය ඒකකය මේ සම්බන්ධව කටයුතු කරන නිසා වීඩියෝ අංශය මේ සඳහා දායක නොවීය. |
| 4. උපකරණ අළුත්වැඩියා කිරීම | ලක්ෂ 14 |
| 5. වෙනත් වියදම් (කැසට් පට, DVD, XD Cam, Portable Hard Disc, Router, Connectors etc.) | කැසට් පට 50<br>DVD = 750 පමණ |
| 6. වෙනත් | නැත |

| අංශයේ / ඒකකයේ නම : ඡායාරූප ඒකකය | |
|---|---|
| **ක්‍රියාකාරකම** | **2017 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම (ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර)** |
| ඡායාරූප මුද්‍රණය | ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා ඡායාරූප පිටපත් 2000 ක් පමණ විවිධ ප්‍රමාණයන්ගෙන් මුද්‍රණය කර ඇත |
| ඡායාරූප රාමු කිරීම | ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා ඡායාරූප 150 ක් පමණ විවිධ ප්‍රමාණයන්ගෙන් රාමු කර ඇත |
| විශේෂ උත්සවයන්වල ඡායාරූප ඇල්බම් සකස් කිරීම | සිංහල අලුත් අවුරුද්ද චාරිත්‍ර සිදු කිරීමේ අවස්ථාව, අතිගරු ජනාධිපතිතුමා මහවැලි හා පරිසර අමාත්‍යාංශයේ විවිධ උත්සවයන්වලට සහභාගී වූ අවස්ථාවන්වල, පොළොන්නරුවේ පැවති තරුණ කඳවුර විශේෂ අවස්ථාවල, පොසොන් උද්‍යානයේ විශේෂ අවස්ථා හා පොළොන්නරුවේ පැවති පොසොන් දන්සැලට අතිගරු ජනාධිපතිතුමා සහභාගි වූ අවස්ථාවන් ආවරණය වන පරිදි ඡායාරූප ඇල්බම් සකස් කිරීම |
| විදේශ සංචාරවල ඡායාරූප ඇල්බම් සකස් කිරීම | අතිගරු ජනාධිපතිතුමා සංචාරය කරන ලද හා ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය ප්‍රභූවරුන් හමු වූ අවස්ථාවන්ට අදාල ඡායාරූප ඇල්බම් සකස් කිරීම<br>x අතිගරු ජනාධිපතිතුමාගේ මැලේසියා සංචාරය<br>x අතිගරු ජනධිපතිතුමාගේ රුසියානු සංචාරය<br>x අතිගරු ජනාධිපතිතුමාගේ ඕස්ට්‍රේලියා සංචාරය<br>x අතිගරු ජනාධිපතිතුමාගේ බංගලාදේශ සංචාරය<br>x අතිගරු ජනධිපතිතුමාගේ ඇමරිකානු සංචාරය<br>x අතිගරු ජනධිපතිතුමාගේ කටාර් සංචාරය<br>x ඉන්දීය මහ ඇමතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය |
| උපකරණ අළුත්වැඩියාව | Laptop අළුත්වැඩියා කර ගැනීම Canon 1Dx කැමරාව අළුත්වැඩියාව, Nikon කැමරාවේ උපාංග අළුත්වැඩියාව, ඡායාරූප මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියාව |
| වෙනත් | තිරසර යුගයක තෙවසරක ඇරඹුම නිමිත්තෙන් BMICHහි පැවති උත්සවයට සමගාමීව කාටූන් ප්‍රදර්ශනයක් පැවැත්වීම |

# ප්‍රතිසන්ධාන අංශය

## හැඳින්වීම

ප්‍රතිසන්ධාන අංශය ආරම්භ කරන ලද්දේ 2015 ජුනි මස සිට ක්‍රියාත්මක වන පරිදිය. සෑම පුරවැසියෙකුටම සමාන අවස්ථාවන් සැලසෙන, විවිධත්ව හා ජාතික අනන්‍යතාවයට ගරු කරන එකමුතු භාවයෙන් ජීවත්විය හැකි ස්ථාවර දේශයක් ගොඩනැගීමත්, මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්‍ෂා කරමින් ජාතික සමගිය හා සංහිඳියාව ඇති කිරීමේ ක්‍රියාවලියට අදාලව කටයුතු කිරීමට මූලික දායකත්වයක් ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම අංශය ජනාධිපති කාර්යාලයේ මඟ පෙන්වීම මත හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මෙහෙයවීම හා මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.

## ප්‍රධාන අරමුණු

මෙම අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ ජාතික සමගිය හා සංහිඳියාව ඇති කිරීම සඳහා විවිධ ජාතීන් හා ආගමික නායකයන්, සිවිල් සමාජය නියෝජනය කරන සංවිධාන සහ ජාතික, පළාත් සභා සහ ප්‍රාදේශීය දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා පවත්වා ඉහත කී කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමයි.

මෙම කරුණු ඉටු කර ගැනීම සඳහා 2017 වර්ෂයේදී ,

1. කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
2. පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිතයින්
3. සිවිල් සමාජ නියෝජනය කරන ආයතන
4. විවිධ ආගමික නායකයන්
5. ප්‍රජාමූලික සංවිධාන

සමඟ සාකච්ඡා වාර කීපයක් පවත්වන ලදී.

මෙම සාකච්ඡාවලදී ගනු ලැබූ තීරණ හේතුවෙන් ජාතීන් හා ආගම් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම හේතුකොට ගෙන ගැටුම් නිරාකරණය කිරීම හෝ එවැනි ගැටුම් අනාගතයේදී ඇතිවීම වැළැක්වීමට වැදගත් තීරණ ගනු ලැබූ අතර ඒවා ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව විදේශ තානාපති නිලධාරීන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයින්, ආසියානු සංවර්ධන බැංකු, ලෝක බැංකු නියෝජිතයින් සහ වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සමඟ සාකච්ඡා කර එම ආයතනවලින් විශාල සහයෝගයක් ලබා ගන්නා ලදී.

විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය , ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව යන රටවල් නියෝජනය කරන මහ කොමසාරිස්වරුන් සහ ප්‍රංශ, ජර්මන්, යුරෝපීය සංගමය ස්විට්සර්ලන්ත, ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, කැනඩාව යන රටවල තානාපතිවරුන් සමඟ සාකච්ඡා පවත්වා ජාතික සමඟිය හා සංහිඳියාව ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග ඔවුන්ට පැහැදිලි කර දීමත්, යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර සපයන ලෙස ඉල්ලා සිටීමත් හිටපු ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලදී.

ජාතික සමඟිය හා සංහිඳියාව ඇති කිරීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා වට ගණනාවක් පවත්වා යම් යම් කරුණු පිළිබඳව එකඟත්වයට පැමිණ වාර්තා සකස්කර අතිගරු ජනාධිපතිතුමාට සහ අග්‍රාමාත්‍යතුමාට එම වාර්තා ඉදිරිපත් කරන ලදී.

හිටපු ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය හමුවීම සඳහා විවිධ පළාත්වලින් මහ ජනතාව මෙම කාර්යාලය වෙත පැමිණෙන අතර, පොදු ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කර විසඳුම් ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයක් විය.

ශ්‍රී ලංකාවාසී පොදු මහ ජනතාවගෙන් ද, විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතනවලින් ලැබෙන ලිපිවලට පිළිතුරු ලබා දීමත් එම ලිපි ආදාල අමාත්‍යාංශ හා ආයතනවලට යොමු කිරීමත්, එමෙන්ම දුරකථන මාර්ගයෙන් ලැබෙන පණිවිඩවලට අදාලව එම පුද්ගලයන් හා ආයතන සමඟ සාකච්ඡා කර පිළිතුරු ලබා දීමත් මෙම අංශය මගින් සිදු කර ඇත.

2017 වර්ෂය තුල මෙම අංශය වෙත ලිපි 4500 කට අධික ප්‍රමාණයක් ලැබී ඇති අතර, එම සියලුම ලිපිවලට පිළිතුරු නොපමාව අදාල ආයතන හා මහජනතාව වෙත සපයන ලදී.

තවද ඉහත කී කාර්යන්ට අමතරව ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමේ කටයුතුවලට අදාල නිවාස, ක්‍රීඩා, මාර්ග, කසල කළමනාකරණය, ජල සම්පාදන සහ වෘත්තීය පුහුණු පහසුකම් ඇති කිරීම සඳහා අදාල අමාත්‍යාංශ හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් අදාල කාර්යයන් ඉටුකරන ලදී. විශේෂයෙන්ම ජනවාර්ගික ප්‍රශ්න මුල් කරගෙන මෙම දිස්ත්‍රික්කයේ පාසල් මුල්කොට ඇති වූ ගැටුම් බොහෝ දුරට සමථයකට පත්කිරීමට හැකියාව ලැබුණි.